ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

**03** අගවිනිසුරු අර්බුදය 1978 ආණ්ඩුක්‍රම අවුල ඉෂ්ට සිද්ධ වූ දිනයයි



**08** ලක් මැණියන්ට කිතුනු අපගේ දායාදය



**12** ඉතිහාසය, ජාතික අනන්‍යතාවය සහ අනාගතය




# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජුනි 07




ක්‍රි.ව. 2013 ක් වූ පෙබරවාරි 03 ඉරිදා 147 වෙළුම 34 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/51/NEWS/2013 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

### කාදිනල් හිමිපාණන්ගේ අනුශාසකත්වය මැද

# අගරදගුරු වසම උතුරේ ජන දිවිය ගොඩනගන්නට පෙරමුණේ

## අගරදගුරු පදවි යුක්තිය, සාමය හා මානව සංවර්ධන කොමිසම මූලිකත්වය ගනී

**තිස් වසරක තිරශ්චීන යුද්ධයකින් අනතුරුව උතුරේ ජන ජීවිතය පශ්චාත් යුද සමය තුළ නැවත ගොඩනැගෙමින් තිබෙනවා. කොළඹ අගරදගුරු වසමේ සියලු මීසම් මේ කෙරේ අවධානය දක්වා ඔවුන්ගේ ජීවිත වලට අත දීමට පියවර ගන්න. දූ දරුවන්ගේ ජීවිත නගා සිටුවන්න, යළි පදිංචි කළ අයගේ නිවාස මූලික අවශ්‍යතා සපුරන්න. යළි පදිංචි කිරීමේ කාර්යයේ දී දේශපාලන අධිකාරිය සමඟ අන්‍යොන්‍ය අවබෝධයෙන් කටයුතු කර ජනතාවට සෙත සලසන්න පෙරමුණ ගන්නැයි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ඇරියුම් කරති.** 15 පිටුවට »



## උදානයක සිතුවිලි

වසර හැට පහ පිරුණ මුත් අප ලබා
"නිදහස" නැමැති නාමය
අසරණයි රට ඊට හේතුව
ඉදිරි ගමනට අලස වීමය
පිස එවන් බැම් හිතමු අදවත්
උතුම්කම ගැන සමඟි සාමය
ඉස අසිරි පැන් වඩමු දෑ පෙම
එයයි අපගේ කිතුනු ප්‍රේමය

**දාගොන්නේ - ඇලෙක්සැන්ඩර්**

## සගසුව දිනයි

ප්‍රකට කිතුනු වාර්තාකරුවකු, ඡායාරූප ශිල්පියකු වූ ජෙරාඩ් සියඹලාපිටිය මහතා ටික කලක් රෝගීව පසුව ඉකුත් දා සගසුව දිනීය.

ප්‍රදීප ලේඛිකා ලිලී ඇග්නස් සියඹලාපිටියගේ සොහොයුරා වන ඒ මහතාගේ ආත්මයට සග සුව පතා ප්‍රදීපය පාඨක ලේඛක සැම එක්ව යදිමු.

## ධීවර නියෝජ්‍ය අමාත්‍ය ධූරය කතෝලික ඇමති සරත් ගුණරත්නට

**තිළිණ අලහකෝන් විසිනි**

පසුගියදා සිදු වූ අමාත්‍ය මණ්ඩල සංශෝධනයෙන් ධීවර නියෝජ්‍ය අමාත්‍ය ධූරය කතෝලික අමාත්‍යවරයකු වන සරත් කුමාර ගුණරත්න මහතාට හිමි වූහ. 15 පිටුවට »



# අද අවශ්‍යව ඇත්තේ යුක්තිය, සමානාත්මතාවය සහ විවිධත්වයේ ඒකත්වයට ගරු කරන සමාජයක් බිහි කර ගැනීමයි

## 65 වන නිදහස් දිනය නිමිත්තෙන් කාදිනල් හිමිපාණන් නිකුත් කළ පණිවුඩය

අප සදාදරණීය මව්බිම වූ ශ්‍රී ලංකාව පෙබරවාරි 04 වැනිදා නිදහස ලබා ගැනීමේ 65 වැනි වසර සමරන්නීය. එය සැබවින්ම අප සියලු දෙනාට ප්‍රීතිමත් මොහොතක් වන අතර නිදහස භුක්ති විඳිමින් යන මේ ගමනේ දී සපුරාගත යුතු අඩුපාඩුකම් තවත් ඇති බව තේරුම් ගත යුතුය. මේ මොහොතේ දී රටේ නිදහස පතා අරගල කළ ස්වකීය සියලු වෙනස්කම් ඉවතලා විදේශීය පාලනයෙන් රට මුදා ගැන්මට කැප වූ විශිෂ්ට නායකයන්ට අපි ආචාර කරන්නෙමු.

අපි එසේ සිදු කරන අතරේම නිදහස භුක්ති විඳීමේ ණය යුක්තියෙන් සෑහිමකට පත් නොවී ඉදිරියට එය සැබැවින්ම ශක්තිමත් කිරීමේ සහ තහවුරු කිරීමේ වගකීමෙන් ද බැඳී සිටින්නෙමු. අතීතයේ ලබාගත් ජයග්‍රහණ පිළිබඳව අප සතුටට පත්වන අතරේම විදේශිය බලවේග හෝ ආධිපත්‍යයන්ට අප යළිත් වහලුන් බවට පත් කර ගැනීමට ඉඩ සලසන්නේ නම් එහි තේරුමක් නැති අතර මේ රට සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී, සාධාරණ, සමෘද්ධිමත්, එක්සත් සහ සාමකාමී ශ්‍රී ලංකාවක් බවට පත් කර ගැනීමට ඇප කැප විය යුතුය.

ඉකුත් 65 වසර පුරා සියල්ලෙහි අප අත්දුටුයේ රෝසමල් වැනි සුන්දර අත්දැකීම් නොවේ. මේ ඓතිහාසික චාරිකාවේදී කළු පැල්ලම් රැසක් ද ඇතිවී තිබේ. ජාති, ආගම් සහ දේශපාලනික අසහනයන් හා නොඉවසන සුළු භාවයන්, ලේ වැගිරීම්, ප්‍රචණ්ඩත්වයන්ට හේතුවූ අතර මේ රටේ ජනතාව තුළ බෙදී වෙන්වීමේ මානසිකත්වයක් නිර්මාණය කිරීමට ද හේතු විය. තිස් අවුරුදු යුද්ධයකින් පසුව වුවද නොමඟ යවන සුළු දේශපාලන මතවාදයන් සහ ඔවුනගේ ත්‍රස්තවාදය ජනිත කරවන ක්‍රියාකාරකම් උතුරේ මෙන්ම දකුණේ ද ඇති කරන අතර තවමත් මෙරට ඇතැමෙක් මේ රට ඔවුනට පමණක් මිස අන්‍යයන්ට නොවේ යැයි උජාරුවෙන් ප්‍රකාශ කරති. මේ රට තුළ තවමත් සිංහල හා දමිළ ජන කොටස් අතර සැක සංකාවන් පවතින අතර දැන් අප සහෝදර මුස්ලිම් ජනතාවට එරෙහිව ද එය පතළ කිරීමේ වෑයමක් දක්නට ඇත.

අනාරක්ෂිත භාවය පිළිබඳ ඉහළ පහළ යන සිතිවිලි ජනතා හදවත් තුළ නිමා නොවන අර්බුදයක් දක්වා දිව යා හැකිය. බිහිසුණු යුද්ධයෙන් තෙවසරකට පසුව වුවද උතුරේ ජනතාවගේ සිත් හා හදවත් දිනාගැනීමේ වෑයමක සළකුණක්වත් දක්නට නොලැබෙන අතර ඔවුන් දිගු කලක් තිස්සේ බලා සිටිනුයේ නිල ඇඳුම් ලාගත් පුද්ගලයන්ගේ පාලනයෙන් බැහැරව ස්වකීය ප්‍රදේශ පාලනය කැරෙන වකවානුවක් උදාවන තුරුය. ඔවුහු දිගු කලක් තිස්සේ තම ප්‍රදේශ තමන් විසින්ම පාලනය කරනු ලබනු දක්නට පුල පුලා බලා සිටිති. ඒක සංස්කෘතික වාදයේ රෝගී බලපෑම් නමැති අභව්‍ය රකුසා තවමත් අපව දඩයම් කරමින් සිටී. ඒ හා සමඟින් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන්ට විවිධ දේශපාලන අතපෙවීම් මඟින් සිදු කරන තර්ජනයෙන් රට තුළ අනාරක්ෂිත භාවයේ හැඟීම් මතු කරන්නට ද හේතු වී තිබේ.

මේ සියලු දේ මඟින් සිදුවිය හැක්කේ ස්ථාවරත්වයේ සසල වීමක් සහ අසීරුවෙන් දිනාගත් නිදහස අහිමි වී යාමකි. අපට අවශ්‍යව ඇත්තේ යුක්තිය, සමානාත්මතාවය සහ විවිධත්වයේ ඒකත්වයට ගරු සරු කරමින් ඒ පිළිවෙත තුළ සැම දෙනාට සැබෑ සාමය සහ සමෘද්ධිය උදා කිරීමට කැපවී, හුදෙක් ස්වකීය සංඝයට පමණක්ම සීමා නොවී කවුරුන්ට හෝ වුවද එය ඉටු කිරීමයි. අප අදහන විවිධ ආගමික සම්ප්‍රදායයන් වෙතින්ම පැන නගින ප්‍රතිපත්තීන්ට අනුව දහම කිසිවකු කිසිදා පිටමං නොකරන එහෙත් ඇතුළත් කර ගන්නා සහ කිසිදා තහංචි නොපනවන විශ්වීය ධර්මතාවක් බව එකී සියල්ල තුළින් ප්‍රකාශ වේ.

මා එහෙයින් අපගේ සියලුම සදාදරණීය පුරවැසියන්ගෙන් ඉල්ලා සිටිනුයේ සියලු වෙනස්කම් සහ බලඅධිකාරීන් ඉක්මවා යමින් ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා පිටු දකිමින් සියලු දෙනා සැබෑ සහෝදරත්වයෙන් වෙලී මේ නිදහස අත් විඳින්නට සහතික වන අතරම අපගේ හෝ අන්‍යයන්ගේ අහංකාර පරවශ ආධිපත්‍යයන්ගේ වහල් භාවයට ද පත් නොවන ලෙසය. අපගේ මවුබිම උදෙසා යදින මෙන් ද විශ්වාසිකයන්ට ඇරැයුම් කරමි.

ශ්‍රී ලංකාවට ජේසු පිහිටයි

✠ **අති උතුම් මැල්කම් කාදිනල් රංජිත්**
**කොළඹ අගරදගුරු හිමි**

# දේවමාතා ප්‍රතිමාව පුළුස්සා දමයි

**ඩේමියන් සිල්වා / ජයසිරි ප්‍රනාන්දු විසිනි**



අවිස්සාවේල්ල සාන්ත මරියා දෙව්මැඳුරේ 150 වැනි ජයන්තිය නිමිත්තෙන් ස්ථාපිත කරන ලද අඩි 13 උසැති දේවමාතා ප්‍රතිමාව ඉකුත් ජනවාරි 27 අළුයම ගිනි තබා විනාශ කොට ඇත. එදින සවස් වන විටම මීසම් වාසී කිතුනුවන් වෙනත් දේවමාතා ප්‍රතිමාවක් එහි යළි ස්ථාපිත කර මීසම් සේවක ගරු මැක්ෂිමස් රුද්‍රිගුපුල්ලේ පියතුමා සමඟින් එක්ව ශුද්ධවූ පැය පැවැත්වූහ.

දේවස්ථානයට අයත් මේ බිම්කඩ වෙළෙඳ ව්‍යාපාර සඳහා යොදා ගැනීමට ඇතැමෙක් මාන බැලූහ. මේ අතර ප්‍රදේශයේ ආගමික සාමය අගයන සියලු ජන කොටස් මේ සිද්ධිය පිළිකුළෙන් හෙළා දකිති.

# "සෙවණේ කුරුසියේ"

නිර්මල මරිය නිකායික ගරු එමාඩ් දල්පතාදු පියතුමන් විසින් පද සංකල්පනා කළ ගීතිකා අඩංගු "සෙවණේ කුරුසියේ" සංයුක්ත තැටිය එළිදැක්වීම පෙබරවාරි මස 3 වන දින ප.ව. 4.00 ට සා. ජෝශප් නි.ම.නි. දෙව්සත්හලීය ශ්‍රවණාගාරයේ දී කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් හා කොළඹ නි.ම.නි. ප්‍රාදේශාධිපති අතිගරු රොහාන් සිල්වා නි.ම.නි. පියතුමන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වේ. **(ලක්ෂාන් ප්‍රනාන්දු)**

**ජාතීන් වෙත මා යවන දිවැසිවරයකු මෙන් මම ඔබ පත් කළෙමි (ජෙරමියා 1:5)**

පදවියෙන් පදවියට

# සාමය ගොඩනගන කේන්ද්‍රස්ථානය පිරිසිදු හදවතයි

## තිස් වසරක යුද්ධයෙන් මියැදුන ශ්‍රී ලාංකිකයන් සමරමින් රත්නපුර රදගුරු හිමිපාණෝ පවසති

**ක්‍රෝධය, වෛරය, අන්තවාදය ඇති තැන සාම සිතුවිලි හටගන්නේ නැහැ. යුද්ධය, ලේ වැගිරීම් අනුමත කරන තැන සාමයක් ඇති වන්නේ නැහැ. මානව දයාව, මානව හිතවාදීබව ඇති වන්නේ නැහැ. සමානත්වයේ සහ සාධාරණත්වයේ හැඟීම් ඇතිවන්නේ පිරිසිදු චේතනා වලින් පිරි හදවත් තුළින්. මේ අනුව සාමය ගොඩනගන කේන්ද්‍රස්ථානය පිරිසිදු හදවත් ලෙස හැඳින්විය හැකියයි රත්නපුර කරිටාස් සෙත්මිණ ආයතන පරිශ්‍රයේ පැවති තිස් වසරක යුද්ධයෙන් මියැදුන උතුරු දකුණු ශ්‍රී ලාංකිකයන් සිහිපත් කරමින් පැවති සර්වආගමික මෙහෙයෙදී රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා සා.බෙ.නි හිමිපාණෝ පැවසුහ.**

දෙහිඹිවිට සුසිලෝදය පරිවේනාධිපති පූජ්‍ය පාද රංගේගම විමලසිරි හිමි, ඇහැලියගොඩ ශ්‍රී මුරුගන් කෝවිලේ කුරුක්කල් පූජක තුමා, ඇහැලියගොඩ බසාර් ජුම්මා පල්ලියේ පාරුක් මවුලවි තුමා ඇතුලු ගිහි පැවිදි පූජක රැසකගේ සහභාගිත්වයෙන් සර්ව ආගමික උත්සවය පැවැත්විණ.

සෙඩෙක් අධ්‍යක්ෂ ගරු ටෙක්සි දිසානායක පියතුමා මෙය සංවිධානය කළ අතර පැමිණ සිටි සැවොම යුද්ධයෙන් මියැදුන අය සිහිපත් කරමින් ශෝකාකුලව ඉටිපන්දම් දල්වා තැන්පත් කළ දර්ශනය සංවේගජනක විය.



තියබෝල්ඩ් සමරතුංග

## සුබාසිංසන



අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මේරියස් පීරිස් හිමිපාණන්ගේ රදගුරු අබිසෙස් සංවත්සරය පෙබරවාරි 03 (අද) ට යෙදේ. එතුමනට සමිඳුන්ගේ ආසිරි බහුලව ලැබේවායි ප්‍රදීප සුපැතුම්!

## කුරුණෑගල පදවිය පූජක මාරු

**මීසම් සේවක පියවරු** - හිරිපිටිය ගරු සුදත් තිසේරා පියතුමා, මල්පිටිය ගරු මොන්ටි පෙරේරා පියතුමා, උඩුබද්දාව - ගරු උපුල් සිල්වා පියතුමා, කුලියාපිටිය - ගරු සිඩ්නි ලියනගේ පියතුමා, දුම්මලසූරිය - ගරු බෲනෝ ගාමිණී පියතුමා, මන්ඩකොන්ඩාන - ගරු සුසන්ත බර්නාඩ් පියතුමා, හෙට්ටිපොල - ගරු එමාඩ් ප්‍රනාන්දු පියතුමා

**ආයතන** - පන්නල සිංහල දේවධර්ම නිකේතන අධ්‍යක්ෂ ගරු ලින්ටන් පෙරේරා පියතුමා, **නිවාඩු** - ගරු රොජර් ක්‍රිස්ටෝපර් පියතුමා



කොටුගොඩ ශු. කයිතානු මුනිඳුන්ගේ දේවස්ථානයට අයත් ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය මගින් මීසම් සේවක ගරු ජූඩ් ලක්ෂ්මන් පියතුමාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක කරන ශිෂ්‍යාධාර පිරිනැමීම 4 වෙනි වරටත් මෙවර සිදුකරන ලදි. ප්‍රදේශයේ පරිත්‍යාගශිලින්ගෙන් මාස්පතා එකතුකරගන්නා මුදල් වලින් රු. 2500/= බැගින් දරු දැරියන් (30) දෙනෙකුට මෙවර පිරිනමන ලදි. ගරු ජූඩ් ලක්ෂ්මන් පියතුමන් අතින් දැරියන් ශිෂ්‍යත්ව ලබාගන්නා අවස්ථාව: ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ කොටුගොඩ ශාඛා සභාපති මාලක හෙට්ටිආරච්චි මහතාද මේ අවස්ථාවට එක්විය.

එච්. ජානක ප්‍රනාන්දු

## කඩියන්ලෙන ජුසේවාස් උලෙළ



මේ විශ්වාසයේ වසර තුළ අපට හැකි අයුරින් ධර්මයේ සත්‍යතාවය ගැන පවුලක් ලෙස සිට එළිදරව් කිරීම අපට පැවරී ඇති වගකීමක් බව සිතට ගනිමු.

මහනුවර රදගුරු වසමට අයත් කඩියන්ලෙන හා. ජුසේ වාස් නව මීසමේ ශුද්ධවර මංගල්ලය නිමිති කොටගෙන මහනුවර රදගුරු අතිඋතුම් ජෝසප් වියානි ප්‍රනාන්දු හිමිපාණෝ අවධාරණය කළහ.

කඩියන්ලෙන සා. සුන්දර කඳුශිඛරයකට මැදිව පිහිටි නව මීසම මීට වසර 05 කට ඉහත පදවි එඩේරාණන් වෙතින් ආසිරි ගන්වා ගොඩනැගූ මහනුවර පදවියේ එකම හා ප්‍රථම හා. ජුසේ වාස් පිය දෙව්මැඳුර වීමත්, ප්‍රථම මංගල්ලය වීමත් සුවිශේෂ සිද්ධියකි. දහසක් පමණ දමිල ජනතාව හා රොද බැඳගත් මීසම් සේවක ගරු නිලංග හර්ෂ ඩයස් තරුණ පියතුමාගේ කැපවීම ඇගයීමට ලක්විය.

මිකි ප්‍රනාන්දු



මඩම්පැල්ල සා. ජේම්ස් අවමංගල්‍යාධාර සහ සුබ සාධක සමිතිය මගින් වාර්ෂික දානය ප්‍රදේශයේ දිළිඳු පවුල් විශාල පිරිසක් අතර බෙදාදීම මඩම්පැල්ල දේවස්ථාන භූමියේදී සිදුකරන ලදි. ඒ අවස්ථාවට සහභාගිවූ මඩම්පැල්ල මිසම් සේවක ගරු ලක්නාත් කුරේ පියතුමා වියළි ආහාර පාර්සලයක් පුද්ගලයෙකුට ලබාදුන් අයුරු.

ඩබ්. කොලින් සී. ප්‍රනාන්දු

## අවමංගල්‍යාධාර සංවත්සරය සති අග

මදුරන්කුලිය අවමංගල්‍යාධාර සමිතියේ 15 වන සංවත්සරය නිමිතිකොටගෙන සර්ව ආගමික වැඩසටහන් යටතේ, මදුරන්කුලිය සා. රපායෙල් දෙව්මැඳුරේදී සමිතියේ මියගිය සාමාජික සාමාජිකාවන් සිහිකිරීමත්, රෝගීව සිටින්නන්ට සුවය පතාත් සංවත්සර දේව මෙහෙයක්, කඩයාමට්ටේ මීසම් සේවක ගරු පීටර් බොතේජු පියතුමාගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කර ඇත.

ගෙවුන වසරේ සේවය කළ නිළධාරි මඬුල්ලට තිළින ප්‍රදානයක්ද සිදුවන බැව් සභාපති සී. එම්. ජේ. සෙනවිරත්න මහතා ප්‍රදීපයට පැවසීය.

ෂෙලී රතුගම

## තේවත්තේ විසෙන්තියානුවෝ ලත්පඳුරට නැගම් යති

මහවැලි 'සී' කලාපය පරලෝක රාජේශ්වරී දෙව්මව්ට කැපකර ඇති ලත්පඳුර මීසමේ දිවි ගෙවන අතලොස්සක් පමණ වන කිතුනු ජනතාවගේත්, එහිදූ දරුවන්ගේත් අවශ්‍යතා සපුරාලීමට තේවත්තේ වින්සන් ද පාවුලා සමිතියේ සමාජික සමාජිකාවෝ එහි ගියහ.

එම දරුවන් ලද පාසල් උපකරණ හා ඉතා දිළිඳු අය අතරේ බෙදා දීමට ලද වියළි ආහාර වෙනුවෙන් ලත්පඳුර මීසම් ජනතාව මීසම් සේවක පියතුමා සමගින් තම හෘදයාංගම ස්තුතිය. එම සමාජික සමාජිකාවන්ට හා තේවත්ත සිද්ධස්ථාන පාලක ගරු ප්‍රිය ජයමාන්න පියතුමාට පිදූහ.

එස්. පී. නිමල්කා

## ඉඳිබැද්දේ සා. බ්ලාසියුස් මංගල්ලය අදයි

උගුරේ ආබාධයෙන් පෙලෙන සැමට විශ්මිත අයුරින් සුවය ලබා දෙන්නට දෙවිඳු වරම් ලත් ශුද්ධ වූ බ්ලාසියුස් මුනිතුමන් නමට කැපවූ ශ්‍රී ලංකාවේ එකම දේවස්ථානය වන මොරටුව ඉඳිබැද්දේ සා. බ්ලාසියුස් මුනි දේවස්ථානයේ වාර්ෂික මංගල්‍ය පෙබරවාරි මස 03 වන ඉරු දිනට යෙදී ඇත. විශේෂ සුව මෙහෙයක් පෙබරවාරි 02 සෙනසුරාදා උදෑසන 8.30 ට ගරු එරික් මදුරාවල පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

මුනිඳුන්ගේ ශුද්ධ වූ ධාතුවෙන් බැතිමතුන් ආසිරි ගන්වා ආසිරි ගැන්වූ ඉටිපහන් බැතිමතුන්ගේ උගුර මත තබා පෞද්ගලිකවද සුවය පැතීමක් සිදු කෙරේ.

මොරටුවට පැමිණ මාර්ග අංක 208 බස් රථයෙන් ඉඳිබැද්දට පැමිණිය හැකිය. සැම මසකම තුන්වන බ්‍රහස්පතින්දා සවස 5 ට රෝගීන් සුවය පතා විශේෂ නුවානය පැවැත්වේ.

මැක්සි ජේ. ප්‍රනාන්දු



පමුණුගම මීසමේ හිටපු මීසම් සේවක ගරු ඇන්ටන් ජයලත් පියතුමාගේ සේවා කාලයේදී පමුණුගම මීසමේ සහෝදර තුමකු ලෙස මහඟු සේවයක් ඉටුකළ ගරු ෂම්මි පෙරේරා පියතුමා ඕස්ට්‍රේලියාවේදී පූජකවරය ලබාගත් අතර එතුමාව පමුණුගම මීසම් ජනතාව පිළිගෙන මීසම් සේවක ගරු ආනන්ද විතාන හා සහයක ගරු රසික ලෝරන්ස් පියවරුන් සමග දිව්‍ය පූජාව සඳහා කැඳවා ගෙන පැමිණි අයුරු.

බෙන්ජමින් කිරිහෙට්ටි



කඩලාන සා. අන්තෝනි විදුහල වැසෙන්නට ගිය විදුහලකි. මීසම් සේවක ලලිත් පෙරේරා පියතුමා සභාව සමග එක්ව ගමේ ජනතාව සමග පාසල රැකගැනීමේ කර්තව්‍යයේ නියමුවා විය. එහි ප්‍රතිපලයක් ලෙසින් කිතුනු විදුහල්පතිවරයකු ලැබුණි. මේ වසරට ළමුන් 15 ක් අලුතින් එක් විය. එම ළමුන් සඳහා අවශ්‍ය සියලුම පාසල් උපකරණ නිල ඇඳුම් සපත්තු දේවස්ථානයේ සා. දොන් බොස්කෝ සමිතිය විසින් ලබාදෙන ලදි. පළමු වසරට අළුතින් එක් වූ එම දරු දැරියන් 15 දෙනා පිළිගෙන කැඳවා ගෙන එන අයුරු මෙහි දැක්වේ. විදුහල්පති කපිතාන් රවින්ද්‍ර ඇන්ටනී, ගරු ප්‍රියන්ති මව්තුමිය, ආදි ශිෂ්‍ය නගරාධිපති සමග ආදි සිසුන් ගුරු මණ්ඩලය දෙමාපියන් මෙහි වෙති.

සුමිත් මාර්ක් ද සිල්වා



නව නිවසක් සදා ගැනීම සිහිනයක්ව තිබුණ අසරණ පවුලක් සඳහා නව නිවසක් සදා දීම ගොඩැල්ල සා. සෙබස්තියන් මංගල්‍යය කමිටුවේ මෙහෙයවීමෙන් සිදුවිය. ගොඩැල්ල දෙව් මැඳුරේ වාර්ෂික මංගල්‍යය නිමිත්තෙන් මේ නිවස සාදා දීම මීසමේ සේවක මොරිස් ඇන්ඩර්සන් පියතුමාගේ අනුශාසනයෙන් ගොඩැල්ල ග්‍රාම නිළධාරි සහ මංගල්‍යය කමිටුවේ සාමාජිකයන් විසින් සිදුකරන ලදි. කමිටු සාමාජික එච්. ඒ. විමල් පෙරේරා සහ ඩී. සුනිල් පෙරේරා යන මහතුන්ගේ නොපසුබට උත්සාහය නිසා දෙව් මැඳුරේ මංගල්‍යයට පෙර එම නිවැසියන්ට නව නිවස ලබාදීමට හැකිවිය.

එච්. ඒ. සිරිල් පෙරේරා

# ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk
ක්‍රිස්තු වර්ෂ 2013 පෙබරවාරි 03 ඉරිදා


# නිදහස

65 වන අභිමානවත් නිදහස් සැමරුමට මුළු රටම දැන් පෙළ ගැසෙන වකවානුවකි. අදීන ජාතියක් සේ ශ්‍රී ලාංකේය ධජය යටතේ පෙරමුණටම ගමන් කරන්නට, සියළු භේද දුරලා එකමුතු වන්නට හැම අතින්ම ආරාධනා ගලා එන මේ සමය තුළ ජාතිකාභිමානය උද්දීපනය කරන්නට ඇසෙන කාහල නාදය අප කාගේත් රෝමෝද්ගමනයද තිව්‍ර කරනු ලබයි. එය ජාති වාදයක් නොව ජාතික වාදයක් බව ඒත්තු ගන්වන්නට අවශ්‍යයෙන්ම සිංහල, දෙමළ, මුස්ලිම් හා බර්ගර් ජාතීන් එකට එකමුතු විය යුතු බව සිහි ගැන්විය යුතුමයි. මේ මාතෘ භූමියත්, මේ පිතෘ භූමියත් අපගේ දෙමව්පියන් වැනියි. ශ්‍රී ලාංකේය ධජය තුළ එහි පහස ලබමින් මේ දේශයේ උපන් කවුරුත් ගෙන එන කීර්තිය පොදුවේ ලක් මෑණියන් තුටු ගන්වයි. ඒ කීර්තිය අත් විඳින මොහොතේ එවන් උදාරතර පුද්ගලයන්ගේ ජාතිය හා ආගම අනුව ලක් මෑණියන් එහි අඩු වැඩි බව නොවිමසන්නීය. නමුත් ඇගේ සමහර දූ දරුවන් සිය පටු හැඟීම් තුළ ඇති කරවාගෙන ඇති ජාති හා ආගම් උන්මන්තකවාදී හා අන්තවාදී සිතිවිලි බොහෝ සෙයින් ඒ කීර්ති රාවය බොඳ කරලනු ලබයි.

විජාතික බලවේග වලට නතුවුන යුගයක් පසුකර දැන් වසර 65 කුත් ගෙවී අවසන්ය. ඒ පරාධීන යුගය ලං කොට ගෙන ඇත්තේ අපම විසින් බව ඉතිහාසය නැවත පුනරුච්චාරණය කරන විට පැහැදිලිවම පෙනී යයි. එදත් අපේ තිබුන විරසක භාවය හා ආත්මාර්ථකාමය ඒ ව්‍යසන අපට ලං කර දුන් බව අමතක කළ යුතු නොවේ. ජාතීන් හා ආගම් වලටත් වඩා එකම ජාතියේ, එකම ආගමේ පිරිස් තවත් කුඩා කැබලි වලට කැඩී ඇති කරවන ව්‍යසනය නම් සැබැවින්ම අභාග්‍යයකි. කුල වාදය හා පංති පරතරය තුළ මිනිසුන් බෙදා වෙන්කරන්නටත් මේ මාතෘක හා පිතෘක පින් බිමේ උපන් දරුවන් කැස කවන්නේ මන්ද යන්න නම් අරුමයක්මැයි. පැරණි වැඩ වසම් යුගයේ රාජකාරී තුළ බෙදා වෙන් කළ සේවාව අද කුල වලට හරවා ගෙන එනු ලබන සටන මිනිස් කමට නම් තරම් නැත.

1948 න් පසුව පරාධීන යුගය අවසන් කොට ස්වාධීන. සෛවරී, නිවහල් දේශයක උරුමය අප ලබාගත් බවට කෙතරම් ජය හොරණෑ මැද පවසා සිටියත් මේ කුල භේදය හා පංති භේදය ඉන් පසුව ගෙවුනු මේ 65 වසර තුළ අභ්‍යන්තර ගැටුම් හා සටන් කොතෙකුත් නිර්මාණය කොට ඇති බව පැහැදිලිව පෙනෙයි. 1971 කැරැල්ල පසුබිම තුළ තිබුනේ කුල ප්‍රශ්නය හා පංති පරතරයයි. සිංහල දෙමළ ගැටුමට මුල් වූයේ පංති පරතරය තුළ පැන නැගුණු මහ සම්මත වාදයේ පරස්පරයයි. 1987-89 භීෂණයට පසුබිම වූයේ කුල ප්‍රශ්නයෙන් හෙම්බත් කොට ආර්ථික වශයෙන් වහල් ජාතියක් බවට පත් කළ සමාජ විෂමතාවයයි. එලෙසම කලින් කලට අළු යට ගිනි මෙන් ඉස්මතු වන ආගම්වාදය තුළත් ගැබ්ව ඇත්තේ ආධ්‍යාත්මික වාදයකට වඩා ආත්මාර්ථකාමිත්වයකට නැඹුරු වූ සැදැහැතියන්ගේ ජීවිත පැවැත්මයි. විටෙක බෞද්ධ - ක්‍රිස්තියානි, විටෙක ක්‍රිස්තියානි - හින්දු, විටෙක බෞද්ධ - මුස්ලිම්, විටෙක හින්දු - මුස්ලිම්, විටෙක බෞද්ධ - හින්දු ලෙසින් වරින් වර පැන නගින මේ අර්බුදයන් තුළින් සිරවුන ජීවිත රටා නිරන්තරයෙන්ම දැකිය හැකියි.

අද නැවතත් විජාතික කුමන්ත්‍රණ, බලවේග හා කල්ලි වාදීන් පිළිබඳව නිරන්තරයෙන්ම දේශපාලන පසුබිමෙන් ඇසෙනු ලබයි. සියල්ලම කුමන්ත්‍රණවලට හරවා එතුළින් පක්ෂපාතීත්වය - අපක්ෂපාතීත්වය තුළ සමාජ ජීවිත පැවැත්ම නිර්ණය කිරීමත් ශාරීරික හා ආත්මික වහල් භාවයක් පවරාලීමක් බව අවබෝධකර ගනිමු.

භෞමික අඛණ්ඩතාවය මේ කුඩා දිවයිනේ රැකිය යුතුමයි. නමුත් පාලන තන්ත්‍රය පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් විමධ්‍යගත කොට බලය බෙදාහැරීමකට හා එහි කාර්යක්ෂමතාවය උපරිමයෙන්ම ජනතා පරමාධිපත්‍යයට නතු කරන්නේ නම් 'නිදහස' අර්ථවත් කරන්නට මධ්‍යම රජයක වටිනාකම තවත් මේ මාතෘ - පිතෘ භූමියේ උපරිමයෙන්ම ඉහළ යනු ඇත. බහුතරයකගේ ආධ්‍යාත්මයට නිරන්තරයෙන්ම ගරු කරමින් එයට අවැඩක් නොකර අන් අධ්‍යාත්මික ලබ්ධිකයින් තමන්ගේ වපසරිය තුළ දහම් පෝෂණය කරමින් මුදලට තාන්න මාන්න වලට ඒ දහම් පාවා නොදෙන්නේ නම් සියලු ආගම්වල අයිතිය ඒ ඒ ශ්‍රේෂ්ඨයින් හට උපරිමයෙන්ම ඒ ලබ්ධිකයින් හට ලබා දෙවන්නට පරිසරය සැකසෙනු ඇත. දේශපාලන නිදහසේ ක්‍රියාකාරිත්වය තුළ ජනතාව ආර්ථිකයේ වහලුන් නොකර හෙට උපදින දරුවාටත් නිදහසේ සැරිසරන්නට වෙළඳ පොළ ආර්ථිකය සැකසෙන්නේ නම් දේශිය ස්වයංපෝෂිත ආර්ථිකයේ වර්ධනය නිරතුරු ඉහළ යනු ඇත. බිම් අඟලකට මිනී නොමරා තමන් සතු ඉඩම් අයිතිය තුළ පාරම්පරික උරුමය හා අයිතීන් තහවුරු කර ගන්නට සම්ප්‍රදායේ විවාහ පවුල් රටා නීතියේ රාමුව තුළ රකින්නේ නම් ආධිපත්‍ය හා අධිමානයට ජනතාව මුලා නොවන්නට සමාජ පසුබිම් සකස් වෙනු ඇත.

මේ සියල්ල සමඟ ජාතිය, ආගම, කුලය, පංතිය, බලය, උගත්කම තුළ මිනිසුන් නොබෙදා සෑම තලයකම වගකිව යුත්තන් ශ්‍රී ලාංකේය ජනතාවක් සේ මනුෂ්‍යයන්ට ගොඩ නැගෙන්නට වාතාවරණයක් අවංකව ගොඩනගන්නට කැපවන්නේ නම් ශ්‍රී ලාංකේය ජනතාවගේ මනුෂ්‍යත්වය මීටත් වඩා ඉහළ අගයක් අනිවාර්යයෙන්ම හිමිකර ගනු නොඅනුමානයි.

***එවන් නිදහසක පහස ලබන්නට***
***මාගේ දේශය අවදි කරනු මැන........***

## විශ්වාසයේ වසර
### දහම් චින්තා 15

# අගවිනිසුරු අර්බුදය 1978 ආණ්ඩුක්‍රම අවුල ඉෂ්ට සිද්ධ වූ දිනයයි

### බැසිල් ප්‍රනාන්දු විසිනි

**1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නීතියේ ආධිපත්‍යය සහ විධායක ජනාධිපතිවරයාගේ පරම බලය අතර අරගලයේ නියෝජනයකි. 1978 වර්ෂයේ පැවති ඓතිහාසික වටාපිටාව මෙකී ආණ්ඩුක්‍රමය ඉෂ්ට සිද්ධ කිරීම සඳහා සුදුසු නොවීය. එයින් 34 වසරකට පසු පසු ගිය සමයේ සිදුවූ සියලු ධනාත්මක ගුණාංගයන්ගේ සිදුවූ ප්‍රගතිගාමී පිරිහීමත් සමග 1978 ආණ්ඩුක්‍රමයේ අවසන් අභිමතාර්ථය ඉටුවී තිබේ. දැන් තාර්කික පද්ධතියක් වශයෙන් නීතියේ ආධිපත්‍යයේ පැවැත්ම සඳහා පදනමක් නොමැත්තේ, මූලික සිද්ධාන්තයන් දෙක වන බලතල බෙදීම සහ අධිකරණයේ ස්වාධිනත්වය තවදුරටත් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය නොහැකි නිසාය.**

පැවති ක්‍රමය 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් දුබල කර තිබීම නොතකා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ නීතියේ ආධිපත්‍යය ක්‍රමය සඳහා ශක්තිමත් ලෙස දිරිදෙන බලවේගයන් ගණනාවක් විය. ඒ අතරින් පළමුවැන්න සහ සියල්ලටම ඉහළින් පැවති දෙය වූයේ, නීතියේ ආධිපත්‍යයට ගරුකිරිමේ දීර්ඝ සහ චිරස්ථායි පරිචයන් තුළින් එය බිහිකරනු ලැබුවේ යැයි මිනිසුන් අතර පැවති හැඟීමයි. බ්‍රිතාන්‍යයන් විසින් නීතිය හඳුන්වාදුන්නේ ශ්‍රී ලාංකීක සමාජයේ සංවිධානාත්මක මූලධර්මය ලෙසිනි. ජීවිතයේ සෑම අංගයක් සඳහාම පාහේ ඔවුන් විසින් නීතිය හඳුන්වාදුන් අතර, ශ්‍රී ලංකාවේ සියලු ආයතන ධාවනය වු රේල්පීලි සංස්ථාපන කරනු ලැබුවේ මෙකී නීති මගිනි.

34 වසරකට අධික කාලයක් මුළුල්ලේ සිය සමාජයේ වූ සියලු මූලික ආයතන බිඳවැටෙන ආකාරය ශ්‍රී ලාංකිකයෝ සියැසින් දුටුවහ. මෙකී ආයතනවල බිඳවැටීමෙන් අදහස්වන්නේ, එම ආයතන සංවිධානය වු සහ ක්‍රියාත්මක වූ මූලික නීති ප්‍රතිපත්තීන්ට බරපතළ ලෙස හානි සිදුවන බවයි. ශ්‍රී ලංකා පොලිස් ක්‍රමය. මහජන සේවා කොමිසම, මැතිවරණ කොමිසම, අල්ලස් සහ දූෂණ පාලන ක්‍රමවේදය සහ නීතිපති දෙපාර්තමේන්තුව එසේ බිඳවැටුණු ආයතන අතර වේ. මෙම ආයතනවල බිඳවැටීම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පිළිගත්තේ 17 වන සංශෝධන හරහා එම ආයතනවලට යම්කිසි ජීවයක් ලබාදීමට ඔවුන් සීමාසහිත ලෙස උත්සාහ කරන විටය. 18 වන සංශෝධනය සම්මත කරගන්නා විට එම ගළවාගැනීමේ පරිශ්‍රමය අත්හැර දැමුණු අතර, බහුපක්ෂ ක්‍රමයක් පැවතීමේ සම්භාවිතාව සහ නියමාකාරයෙන් තෝරා පත්කර ගත් ව්‍යවස්ථා දායකයක් පැවතීමේ සම්භාවිතාව අවසන් විය.

1978 දී නීතියේ ආධිපත්‍ය ක්‍රමයට සහයෝගය දක්වන අනිවාර්ය සහ විවේචනාත්මක බුද්ධිමතුන් පිරිසක් ද විය. විනිසුරුවරුන් ඒ වන විටත් 'පැරණි හොඳ ක්‍රමයට' අයත්වූවන් වූ අතර එනිසා නීතිඥවරු ද එසේ වූහ. නමුත් ගතවූ 34 වසර පුරා ආකාර ගණනාවකින් අධිකරණයට රහසින් සහ හිතාමතා පීඩා කරන ලද අතර කර්තෘවරුන් ගණනාවක් විසින් ඒවා ඉතා හොඳින් වාර්තා කිරීම සහ විවේචනය කිරීම ද සිදුකරන ලදි. අධිකරණයට හිතාමතා පීඩා පමුණුවන විට, සිදුවෙමින් පවතින භූමිකම්පාවේ ස්වභාවය නීතිඥවරු අත්දුටුවහ. එසේම මේ ක්‍රමය තුළ නොනැසී සිටීමට අවශ්‍ය වූ අයට නව පරිසරයට හැඩගැසීම අවශ්‍ය විය. කෙසේ නමුත්, අධිකරණයට සහ නෛතික පරිචයන් වෙත අන් සෑම දෙයකට ම පෙරාතුව රහසින් පීඩාකළ හේතුව වූයේ, විධායක ජනාධිපති වරයාගේ අත්තනෝමතික බලය හරහා නෛතික පද්ධතියට හානි සිදුකළ එවකට ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග සහ එවකට අගවිනිසුරු සරත් නන්ද සිල්වා අතර පැවති සක්‍රිය සහයෝගිතාවයයි. ශ්‍රී ලංකාවේ අධිකරණ පරිවයේ සියලු ඥාතීන් එකට එක් රැස්වීමක් මෙනි. ඔවුහු අවසන් මොහොතේ යම්කිසි ප්‍රකට මැදිහත්වීමක් සිදුකිරීමට උත්සාහ කළහ.

කෙසේ නමුත්, ක්‍රමය මරා දැමීමට උවමනාවූ අයට අවැසි වූයේ එය පසුව නොව ඉක්මනින්ම මරාදැමීමට ය. 17 වන සංශෝධනය මගින් සිදුකිරීමට ගිය ගළවාගැනීමේ මෙහෙයුම් මැඩපැවැත්වූ හස්තයම විසින් දැන් අධිකරණ ස්වාධිනත්වයේ සහ නීතියේ ආධිපත්‍යයේ වියෝග ප්‍රකාශයට තීරණාත්මක ලෙස සෑම අංගයක්ම දුෂ්ට ලෙස මෙහෙයවමින් එස්. එන්. ද සිල්වා සමස්ත ක්‍රමය වෙත මාරක පහර එල්ල කළේය. නීතියේ කාර්යපටිපාටික අංගය ඔහු විසින් දරුණු ලෙස නොතකා හැරියේය. නීතියේ සැලකිය යුතු අංගයක් ලෙස කාර්යපටිපාටික නීතිය පවතින තාක් කල් නීතියේ ආධිපත්‍යය ඉතිරි වී පවතියි. මේ නිසා සියලු ඇණ සහ මුරිච්චි බුරුල් වූ අතර මේ ක්‍රමයට තවදුරටත් ඉදිරියට යා නොහැකි තත්ත්වයක් මතුවිය.

කෙසේ නමුත්, නිල වශයෙන්, අධිකරණයේ ස්වාධිනත්වය වචනයට පමණක් සීමාවී කියැවුණු අතර, අභ්‍යන්තර ක්‍රමය මහත් උපද්‍රවයකට ලක්ව තිබියදී බැලූ බැල්මට පමණක් ඒ වෙත ගෞරවයක් ඉතිරිව පැවතිණි.

දෝෂාභියෝගය සහ එය ගෙන ගිය ස්වභාවය විසින් මේ තිරය ඉවත් කෙරිණි. අවසන් හෝරාව එළඹ ඇති බව බොහෝ ප්‍රමාද වී වටහා ගනිමින් ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය, ඓතිහාසික විනිශ්චයන් ලෙස ඉදිරියටත් ශේෂවී පවතින ආකාරයේ විනිශ්චයන් මගින් සිය ක්‍රමය රැකගැනීම සඳහා පරිශ්‍රමයක් දැරීය.

නීතීඥවරු ද විනිසුරුවරු ද පෙර කිසිදා දැකගන්නට නොලැබුණු එක්සත්භාවයකින් යුතුව රැස්වූහ. එය හරියට, සිය හිතවතුන් අතරින් අයෙක් බරපතළ ලෙස රෝගාතුර වී සිටින බව වටහාගනිමින් අත්සන් කර තිබේ.

ශ්‍රී ලාංකිකයන් දැන් මුහුණදෙනු ඇත්තේ සපුරාම අලුත් තත්ත්වයකටය. පසු ගිය ලිපි සහ ප්‍රකාශවලින් අප උත්සාහ කර තිබෙන්නේ සමස්තයක් වශයෙන් ශ්‍රී ලාංකික සමාජය සඳහා සහ සියලු ශ්‍රී ලාංකික ආයතන ඉදිරියේදී බලාපොරොත්තු වියයුත්තේ මොනවාද යන්න පිළිබඳව සංක්ෂිප්ත වශයෙන් දැක්වීමටය.

පිළිතුරුදීම සඳහා ඉතිරිව තිබෙන ප්‍රශ්නයවන්නේ, ශ්‍රී ලංකාවේ මිනිසුන් සිය ස්වාධීනත්වයන් ආරක්ෂා කරන නීති ක්‍රමයක් යටතේ ජීවත්වීමට මග සොයාගනු ඇත්තේ කෙසේද යන්නයි. ප්‍රංශ, බ්‍රිතාන්‍ය, ඇමරිකාන සහ ස්වාධීනත්වයේ හොඳම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්ප්‍රදායයන්ට පදනම් වු ජෝන් ලොක්, බැරන්ඩි මොන්ටෙස්ක්‍යු, ජීන් ජේකස් රූසෝ සහ සෙසු අයගේ අදහස් මත පදනම් වූ ක්‍රමය අදින් අවසන් වෙයි.

ශ්‍රී ලංකාව දැන් අත්දකින්නේ ලොව පුරා සාම්ප්‍රදායික පදනම් ද සහිත වන බලාධිකාරිය පිළිබඳ පර්යේෂණ පැවැත්වීමයි. ශ්‍රී ලංකාවේ වර්තමාන සහ අනාගත පරම්පරාවන්ට රාජ්‍ය විසින් සුරකිනු ලබන සිය ස්වාධීනත්වයන් භුක්තිවිඳීම පිළිබඳ තේරුම් බේරුම් කර ගන්නට දැන් මගක් නැත.

*බැසිල් ප්‍රනාන්දු ආසියානු මානව හිමිකම් කොමිසමේ වැඩසටහන් සහ ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කරයි. ඔහු 2012 වර්ෂයේදී එළිදුටු "'Gyges' Ring - The 1978 Constitution of Sri Lanka" ග්‍රන්ථයේ කතුවරයා ය. තවද ලේඛකයෙක් මෙන්ම අන්තර්ජාතික කීර්තියට පත් කවියෙක් ද වේ. ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාව 1984 වර්ෂයේ සිට කලාපයේ මානව හිමිකම් කඩවීම් පිළිබඳ තොරතුරු වාර්තාගත කිරීමේ සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ යෙදී සිටින ස්වාධීන ආයතනයකි.*

## කැමිලස්ගේ — තිත්ත ඇත්ත



මීසමෙන් මීසමට

# විශ්වාසයේ වසරේදී කිතුනු විශ්වාසය තහවුරු වන පරිදි ජීවත්වන්න

ජන්ම පාපය ඇතිව ඉපදුනු අප ප්‍රසාද ස්නාපනය ලද දිනයේ සිට වරප්‍රසාද ලත් පූර්ණවන්තියගේ ආදර්ශවත් වන්දනීය ජීවිතයට පංගුකාරක වීමට ප්‍රතිඥා දී තියෙනවා. කිතුනු විශ්වාසය තහවුරු වන පරිදි මේ විශ්වාසයේ වසර තුළ ජීවත්වීමට උත්සහ දරන්න.

නාවලපිටිය සා. මරියා දෙව්මැඳුරේ වාර්ෂික මංගල මෙහෙයේදී අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් එම්මැනුවෙල් ප්‍රනාන්දු හිමිපාණෝ එසේ පැවසූහ.

මංගල්‍ය සමයේ පවුල් බැහැදැකීම, දයා නිවසේ ආබාධිත දරුවන් හා වයෝවෘද්ධ දෙමව්පියන්ට, රෝගීන්ට, ඇප උපස්ථාන කිරීම, නැතිබැරි අයට අවශ්‍යතා සපයා දීම, ශ්‍රමදාන වැනි පුන්‍ය ක්‍රියා රැසක් කළහ. මීසම් සේවක ගරු නිවුමන් පීරිස් පියතුමාගේ මඟපෙන්වීම මත මංගල කටයුතු සාර්ථකව සිදුකැරිණ.

**මිකී ප්‍රනාන්දු**



කටුවපිටිය සා. සෙබස්තියන් දෙව්මැඳුරේ 144 වැනි වාර්ෂික මංගල දෙව්පුද මෙහෙය සඳහා ආරාධිත මීගමුව කඩොල් කැලේ සා. ජෝසප් ශාඛා විදුහලේ විදුහල්පති ගරු සුදත් ගුණතිලක පියතුමාව කටුවපිටිය මීසම් සේවක ගරු ශ්‍රිකාන්ත ප්‍රනාන්දු පියතුමා සහයක ගරු ඩිල්රන් පීරිස් පියතුමා මීසම් ධර්මසේවා සභා ලේකම් මහතා ඇතුළු මීසම් වාසීන් පිළිගෙන දෙව්මැඳුර වෙත කැඳවාගෙන යන අවස්ථාවයි මේ.

**ඇග්නස් සියඹලාපිටිය**

## පාස්කුව

'පාස්කුව' 14 වැනි වාර ප්‍රකාශනය පාස්කු සමයේදී නිකුත්වේ. 'පාස්කුව අත්දැකීම තුළින් සමාජ වෙනසක් කරා' යන මුඛ්‍ය තේමාව යටතේ ඔබේ නිර්මාණ හැකි ඉක්මණින් ඉදිරිපත් කරන ලෙස ආරාධනා කරමු.

බැසිල් ෆොන්සේකා - සංස්කාරක
268, ශ්‍රී වික්‍රම රාජසිංහ පාර,
කුරණ, මීගමුව.
විද්‍යුත් තැපැල : bfonseka@cerikids.org
දු. ක. : 031-2232933
077-3225586

## කිතු යාත්‍රා සඳහා නිර්මාණ එවන්න!

කුමර නයනජිත් හා ඇන්ටන් ජයසූරියගේ සම සංස්කරණයෙන් එළිදක්වන 'මරණයේ අඳුර බිඳ ජීවනයට එතෙර වීම' තේමා කරගත් 'කිතු යාත්‍රා' නොමිලේ බෙදාහරින පාස්කු වාර්ෂිකයේ සත්වන කලාපය සඳහා පාස්කුව හා සබැඳි ඔබේ නිර්මාණ ලිපි, කෙටිකතා, කාව්‍ය (සඳැස් / නිසඳැස්) පෙබරවාරි 25 වන දිනට පෙර ඇන්ටන් ජයසූරිය සම සංස්කාරක 'කිතු යාත්‍රා' නො. 255/ඊ, සාම මාවත, බෝපිටිය, පමුණුගම යන ලිපිනයට යොමු කරන්න.

# ඉරබඩගම කිතුනු ඒකක නායකයෝ දිවුරුම් දෙති

ඉරබඩගම ශු. පේදුරු පාවුළු දේවස්ථාන සංඝයට නව වසරේ පත්වූ කිතුනු ඒකක නායකයන්ගේ දිවුරුම් දීම හා කැපකිරීමේ දේව මෙහෙය පසුගිය දින අසිපා ජාතික අධ්‍යක්ෂ ගරු එරික් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් ඉරබඩගම ශු. පේදුරු පාවුළු දේවස්ථානයේදී පැවැත්විණි.

දේව මෙහෙය අවසානයේදී හිටපු කිතුනු ඒකක නායකයින්ට සහතික පත් ප්‍රදානය කිරීමද සිදුවිය. අවසානයේදී නව කිතුනු ඒකක නායකයින් දේවස්ථාන භූමියේ රැස්ව සිටි තම කිතුනු ඒකක වෙත ඉටිපහන් රැගෙන යනු දක්නට ලැබුණි. එක් එක් ඒකකයන් විසින් සූදානම් කළ සංග්‍රහයකින් තම සාංඝික බවත්, එකමුතුවත් තහවුරු කර ගැනුනි.

කුරුණෑගල පදවි අසිපා අධ්‍යක්ෂ හා ඉරබඩගම මීසම් සේවක ගරු රූපස් හිලරි පියතුමාගේ මෙහෙයවීමෙන් සිදුකෙරුණු මෙයට මීසමේ ගරු පැවිදි සොයුරියන්ගේ සහයද නොමදව ලැබී තිබුණි.

**පෝල් විජේතුංග**

# අද සිටින්නේ තමන්ට පමණක් සේවය කරගන්නා දේශපාලකයෝය



තමන්ට බලය දුන් පොදු ජනතාවට සේවය කිරීම අමතක කර තමන්ට පමණක් සේවය කරගන්නට ජනතා සේවය අමතක කර මඟ හැර යන වත්මන් දේශපාලකයන්ට දිවා රාත්‍රී දෙකේම ජනතා සේවයට කැපවූ පෙස්ටස් පෙරේරා අමාත්‍ය තුමාගේ චරිතය අභියෝගයක් හා ආදර්ශයක් යැයි හිටපු අමාත්‍ය පෙස්ටස් පෙරේරා මහතාගේ අවමඟුල් කටයුතු වෙන්නප්පුවේ සා. ජෝශප් දෙව්මැඳුරේ පැවැති අවස්ථාවේදී කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ප්‍රකාශ කළහ.

පෙස්ටස් පෙරේරා මහතා ධීවර අමාත්‍යවරයා ලෙස ශ්‍රී ලංකාවේ ධීවර ජනතාව නඟා සිටුවීමට කළ අති මහත් සේවාව මෙතෙක් කිසිම ධීවර අමාත්‍යවරයකුට කිරීමට හැකි වී නැත. සහනාධාර ක්‍රමයට ඔරු, තෙප්පන්, ඇන්ජින් කුඩා හා ලොකු ප්‍රමාණයේ බෝට්ටු ධීවරයාට ලබාදීමට කටයුතු කළේ එතුමාය. අද එම සේවාවන් ඇණහිට ඇත්තේය. ධීවර පවුල් නඟා සිටුවීමට, ධීවරයාගේ දරුවන්ට නිසි අධ්‍යාපනයක් ලබාදීමට ධීවරයාට නිවාස යෝජනා ක්‍රම ආරම්භ කළේ එදා එතුමාය. මා කැපුන්ගොඩ දෙව්මැඳුරේ සේවය කරද්දී පළමුවරට එතුමා සමග එක්වී දුප්පත් ධීවර ජනතාවට නිවාස ගොඩනඟා දීමට හැකි විය. එතුමා පැය 24 ම තම ජනතාව වෙනුවෙන් අවදිව වැඩ කිරීමට කැපවූ සැබෑ එඩිතර ජන නායකයෙක්. තම සහෝදර ජනතාව වෙනුවෙන් සේවයට කැපවූ එතුමා දේශපාලනයෙන් තමන් පෝෂණය වීමට සිතුවේ නැත.

වෙන්නප්පුව සා. ජෝශප් දෙව්මැඳුරේ පැවැති අවසන් දේව මෙහෙයට අති විශාල ජනකායක් හා පූජක තුමන් පැවිදි සොයුරියන් සහෝදර තුමන් රාශියක් සහභාගි වූහ. විපක්ෂ දේශපාලකයන් ද සහභාගි වූ අතර එතුමාගේ පුත් පුත්තලම් දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිරෝෂන් පෙරේරා, දියණිය වන නිශානි ප්‍රීතිකා පෙරේරා සහ එතුමාගේ භාර්යාව වන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීනි මේරි ලැරින් පෙරේරා මහත්මියද සහභාගි වූහ.

**ජෝ. සංගපාලආරච්චි, ප්‍රියන්ත පීටර්ස්, ගිහාන් ප්‍රනාන්දු**



බෝලවත්ත ක්‍යුරියා මරිය හටයින් ළ.දැ.නි දැරියන් බැහැදැකීමට ගිය අතර එහිදී ඔවුන් සමග සුහද කතා බහක නිරතව විනෝද වටයක්ද පැවැත්වීය.

**කොකුම් වාසනා ජයරුවන් ප්‍රනාන්දු**

# ස්වර්ණ ජයන්තිය දා ආසිරි ගැන්වෙන දකුණු වැලිහේන සා. සෙබස්තියන් දෙව්මැඳුර

මීගමුව හලාවත මාර්ගයේ දංකොටුව මං සංධියෙන් දකුණට හැරී මඳ දුරක් යන විට වැලිහේන හමුවේ. දකුනු වැලිහේන සා. සෙබස්තියන් දෙව්මැඳුරේ ස්වර්ණ ජයන්තිය පෙබරවාරි 02 03 දිනයන්හීදි පැවැත්වීමට, දේවස්ථාන සංඝය වැලිහේන මීසම් සේවක ගරු නිශාන්ත රුදිගු පියතුමා සමග පියවර ගෙන තිබේ.

වැලිහේනේ දෙව්මැඳුරක් තනන්නට යෝජනා කරන ලද්දේ ස්වර්ගස්ථ වී වදාළ දේව සේවක අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන්ගේ මැදිහත් වීමෙන් 1956 ජූනි 6 වැනිදාවකදීය. 1958 නොවැම්බර් 25 ගරු ඇන්තනි ප්‍රනාන්දු පියතුමා මුල්ගල තැබූ අතර දෙව්මැඳුර තනන්නට භූමි භාගය ලබාදී ඇත්තේ, නැසීගිය කපුරුවාරිගේ සිමියොන් ප්‍රනාන්දු මහතා විසිනි.

ගරු ජෝන් ගෝමස් පියතුමා 1968 ජනවාරි 27 ආසිරිගන්වා මෙහි ප්‍රථම දේව මෙහෙය පැවැත්විය. මුල්යුගයේ පළඟතුරය මීසමට අයත්වූ වැලිහේන සභාව වෙනම මීසමක් බවට පත්වීමෙන් පසු පියතුමන් 16 නමකගේ සේවය ලැබී ඇත.

වසර 50 කට පෙර අපේ මුතුන් මිත්තන් තැනූ දෙව්මැඳුරේ, අත්තිවාරම වියන්ගෙ රාජධානියක් බවට පත්වී ශක්තිමත්භාවය අඩුවීම හා ක්‍රමයෙන් වර්ධනය වන කිතුනු ව්‍යාප්තිය අනුව ඉඩකඩ ඇති නව දෙව්මැඳුරක් තැනීමේ අවශ්‍යතාවය මතුවිනි. මීසම් සේවක ගරු නිශාන්ත රුදිගු පියතුමන් සමගින් ප්‍රදේශවාසි ජනතාව අත්වැල් බැඳගෙන 2011 ජූනි 17 ශුද්ධාත්ම මංගල දිනදී කොළඹ අගරදගුරු පදවි මීගමු කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමාගේ සුරතින් මුල්ගල තබා, ගරාවැටෙමින් පැවැති දෙව්මැඳුර වෙනුවට නව දෙව්මැඳුරක් ඉදිකිරීමට කටයුතු ආරම්භ කෙරිනි.




දෙව්මැඳුරේ කුඩා කිතුනු සංඝ 15 ක පවුල් 400 ක් පමණ වේ. මීසම් ධර්මසේවා සභාව, දිව්‍ය හෘද සමිතිය, තරුණ සමිතිය, කිතුදන පුබුදුව, ජනවන්දනා කමිටුව, මරණාධාර සමිතිය, ගායනා කණ්ඩායම, පූජා සහයක සමිතිය, දෙව්මැඳුරේ ආධ්‍යාත්මික හා සමාජීය පෝෂණය සඳහා ඇත.

අප දෙව්මැඳුරේ ස්වර්ණ ජයන්ති සන්ධ්‍යා මෙහෙය පෙබරවාරි 02 සෙනසුරාදා ප.ව. 7.00 ට කොළඹ සහයක රදගුරු අතිඋතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන්ද, 03 ඉරිදා උදේ 8.30 ට නව දෙව්මැඳුර ආසිරි ගන්වා දේව ජනතාවට භාරදීම හා ජුබිලි මංගල මෙහෙය අගරදගුරු පදවි එඬේරාණන්වන අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ද පැවැත්වේ.

**එම්. ලලිත් ඉන්දික ප්‍රනාන්දු**

# නව වසරේ සැබෑ ජීවිත වෙනසක් අත්දකිමු

හැම නව වසරක උදාවත් සමග ආසිරි පතා ගන්නා බවත් එය යහපත් ක්‍රියාවක් වූවත් එහි ඇත්තේ ඒකාකාරී බවක් බවත් මෙහෙය නිම වී සුබ පතා නිවසට පැමිණ අප ගමන් කරන්නේ බොහෝ දුරට පරණ පාරේ බවත් එසේ නොව ලබන හැම නව වසරක්ම සැබෑ ජීවිත වෙනසකට සමිඳුන්ගේ වදන් සජීවිකරණ සැබෑ අධ්‍යාත්මික වෙනසක් අත් දකින්නට ඔබ අදිටන් කර ගත යුතු බවත් ඒ ඔබගේ පවුල් ජීවිතයේ. ඔබේ ගමේ සහ සමස්ත සමාජයේ යහ පැවැත්මට ලොකු ශක්තියක් වන බව හලාවත පදවි අනු නායක අති ගරු පීටර් චාල්ස් පියතුමා අගුණවිල වන්නිමඩු දේවස්ථානයේ දී පැවසීය.

මෙහිදී රෝගාතුරව මීසමෙන් බැහැරව සිටින මීසම් සේවක ගරු අනුර ගම්ලත් පියතුමාට ඉක්මන් සුවය පතා සමිඳු යදින්නටද අනුනායක පියතුමා අමතක කළේ නැත.

**පීටර් කැමිලස් සුබසිංහ**



තම පූජක දිවියේ 25 වන ජයන්තිය සැමරූ ගරු ක්‍රිෂාන්ත ප්‍රනාන්දු නිමල මරිය නිකායික පියතුමා තම උපන් ග්‍රාමය වූ බුරුල්ලපිටිය ග්‍රාමයට පසුගියදා පිළිගන්නා ලදි. ඉරුදින දිව්‍ය පූජාව එතුමන් විසින් පවත්වන ලදී. ගරු ක්‍රිෂාන්ත ප්‍රනාන්දු පියතුමා (මැද) පොල්වත්ත ජනසන්නිවේදන මධ්‍යස්ථානයේ ගරු එම්මෑනුවෙල් ප්‍රනාන්දු පියතුමා (වම) මීසම් සේවක ගරු සුභාෂ් චමින්ද පියතුමා (දකුණ) දිව්‍ය පූජාව පැවැත්වූ ආකාරයයි මේ.

**ලහිරු ලක්ශාන් ප්‍රනාන්දු**



බස්නාහිර පළාත් සභාවේ හිටපු අමාත්‍ය ලෝරන්ස් මාදිවල මහතාගේ අනුග්‍රහයෙන් හැඳල වැලිඅමුන ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට නොමිලේ පාසල් පොත් හා උපකරණ බෙදාදීමේ වැඩපිළිවෙලක් නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමාගේ ප්‍රධානත්වයෙන් නොබෝදා පැවැත්වින. එහිදී පියතුමා දරුවෙකුට පොත් පාර්සලයක් පිරිනැමූ අවස්ථාව මෙහි දැක්වේ. ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ජෝන් අමරතුංග, ලෝරන්ස් මාදිවල සහ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චාල්ස් රන්මුතු යන මහත්වරුද ඡායාරූපයේ වෙති.

**නිමල් පෙරේරා**

# කිතුනු අපට ඇති අභියෝග ජයගන්නේ කොහොමද?

**අළු යට ගිනි මෙන් අප රටේ කිතුනු ජනතාවට එල්ල වී ඇති අභියෝගාත්මක තර්ජනයන්ට මුහුණ දීම සඳහා පෙළ ගැසී සිටිය යුතු මොහොතක ශුද්ධවූ බයිබලය ඇසුරින් යමක් පැවසීම කාලෝචිතය.**

ශුද්ධවූ ලූක් සුභාරංචියේ 21 වන පරිච්ඡේදයේ 10 - 19 වගන්තිය මෙසේ කියයි. "එවිට උන්වහන්සේ ඔවුනට කතා කොට ජාතියක් ජාතියකට විරුද්ධව ද රාජ්‍යයක් රාජ්‍යයකට විරුද්ධව ද නැගී සිටිනු ඇත. මහා භූමි කම්පාද නොයෙක් තැන්වල සාගත වසංගත ද ඇති වන්නේ ය. ත්‍රාස ජනක දර්ශන ද, පුදුම ලකුණු ද අහසේ ඇති වන්නේ ය. එහෙත් ඒ සියල්ලට පෙර මාගේ නාමය නිසා ඔවුහු ඔබ අල්ලාගෙන ධර්මශාලාවලටත් හිරගෙවල්වලටත් ඔබ පාවා දෙමින් ඔබට පීඩා කරන්නෝ ය. ඔබව රජුන් හා ආණ්ඩුකාරයන් ඉදිරියට ගෙන යන්නේ ය. ඔබට එය සාක්ෂි දැරීමේ අවස්ථාවක් වන්නේ ය. ඔබ වග උත්තර දිය යුත්තේ කෙසේ ද? කල්තියා සූදානම් නොවන්න. ඔබගේ විරුද්ධ වාදීන් කිසිවකුට නොබිඳිය හැකි වාග් චතුර භාවයක් හා ප්‍රඥාවක් ඔබට දෙන්නෙමි. මාගේ නාමය නිසා සියල්ලෝම ඔබට වෛර කරන්නෝ ය. එහෙත් ඔබේ කෙස් ගහක්වත් නාස්ති නොවන්නේ ය. ස්ථිරව සිටීමෙන් ඔබ ජීවනය දිනා ගන්නහුය."

ක්‍රිස්තුන් වහන්සේගේ මේ ස්ථිරසාර අපූර්ව ප්‍රකාශය අනුව අපට ඇත්තේ විශ්වාසවන්තව ශුද්ධවූ සභාව තුළ සභාවේ ශ්‍රේෂ්ඨයින්ගේ මඟ පෙන්වීම තුළ විශ්වයේ ස්වාමීන් වහන්සේ සමඟ පිරිසිදු හදවත් තුළ යාච්ඤාවෙන් ද භාවනාවෙන් ද ස්ථිරව සිටීම පමණකි.



ක්‍රිස්තුන් වහන්සේ අපට මේ ගැන අවදිව සිටීමට මෙසේ පල කරයි. ලූක් 21 වන පරිච්ඡේදයේ 34 උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කරයි.

"ඒ දවස මළ පතක් මෙන් හදි සියේ ඔබ අසු කරගන්නා පිණිස ජීවිතයේ කරදර වලින් ද කම් සැපෙන් ද, බීමත් කමින් ද ඔබේ සිත් නොවෙහෙසෙන සැටියට බලාගන්න. මන්ද එය මුළු පොළොවෙහි සකල ලෝක වාසීන් පිට පැමිණෙන්නේ ය. එබැවින් ඒ සිදුවන ආපදා සියල්ලෙන් ගැලවෙන පිණිසද, මනුෂ්‍ය පුත්‍රයාණන් ඉදිරියේ පෙනී සිටින පිණිස අයදිමින් හැමවේලේම අවදිව සිටින්න."

මේ අනුව මේ අභියෝග ජයගන්නට අපගේ නිරන්තර යාච්ඤාව ද, ඉරුදින හා සභාවේ මෙහෙයයන්ට සහභාගි වී සභා ශ්‍රේෂ්ඨයන් විසින් වරින් වර කරන දේශනා හා ප්‍රකාශන හොඳින් තේරුම්ගෙන ඒ අනුව ශක්තිමත් විය යුතුව ඇත. ක්‍රිස්තුන් වහන්සේ ලූක් 6 වන පරිච්ඡේදයේ 22 ශුභාරංචියෙන් දේශනා කළ පරිදි මේ බව පැහැදිලි වේ. "මනුෂ්‍ය පුත්‍රයාණන් නිසා මිනිසුන් ඔබට වෛර බැඳ ඔබ ආශ්‍රයෙන් ඉවත් කොට ඔබට නින්දා කොට ඔබගේ නාමය හෙළා දකින කල ඔබ භාග්‍යවන්තයෝ ය. ඒ දවස් වලදී ප්‍රමෝද වන්න. ප්‍රීතියෙන් නටන්න. මක්නිසාද ඔබේ පල විපාක ඉමහත් වනු ඇත. තව ටික කලකින් අපට ද මේ දක්වන අභියෝග වලට මුහුණ දීමට සිදුවනු ඇත. අප කිතු දහම අදහන්නේ මරණින් පසු උන්වහන්සේ සමඟ ජීවත් වීමටය.

එසේ නම් ඉදිරියේ ඇතිවන මේ අභියෝග වලට මුහුණ දීම සඳහා උන්වහන්සේගේ මේ ප්‍රකාශ වලින් අපට හුවා දක්වන දෙයින් පන්නරය ලබා ශක්තිමත් වී මේ ලෞකික අභියෝගයන් මකුලු දැල් කඩන්නාක් මෙන් කඩා බිඳ දැමීමට ඉදිරිපත් විය යුතුය. ශුද්ධවූ ක්‍රිස්තියානි සභාව කිසිම රාජ්‍ය බලයකින් හෝ අණ පනත් මගින් විනාශ කළ නොහැකි බව ක්‍රිස්තුන් වහන්සේ ශු. මතෙව් තුමාගේ 16 පරිච්ඡේදයේ 16 ශුභාරංචි වගන්තියෙන් ප්‍රකාශ කර ඇත. "ඔබ පේදුරුය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනඟන්නෙමි. මරණයේ බලයට වුවද එය පරාජය කළ නොහැකිය. ලෝකාන්තිමය දක්වාම මම නුඹ සමඟ සිටින්නෙමි. ලෝකයට ශාස්තෘවරුන් ගණනාවක් බිහි වූ නමුත් අද දක්වාම පවතින්නේ ක්‍රිස්තුන් වහන්සේගේ උපන් වර්ෂයයි. මේ උන්වහන්සේගේ 2013 වසර අපගේ විශ්වාසය ප්‍රකාශ කිරීමේ වසරයි.

අප ශ්‍රී හෘදයේ මුරකාරයින්, සාක්ෂිකාරයින් හැටියට දිවුරා තිබෙන නිසා උන්වහන්සේගේ මේ බලය අත්දකින්නට ලැබෙන මේ අවස්ථාවට මුහුණ දිය යුත්තෙමු. එමෙන්ම අපි කිතුනුවන් හැටියට අපගේ මේ පූර්ණ විශ්වාසය තුළ එල්බ ගෙන ආත්ම පරිත්‍යාග යෙන් දහමේ පුනර්ජීවය රැකගැනීම සඳහා ඉදිරිපත් වීමට ස්වාමීන් වහන්සේ අපට සම්පූර්ණ බලය හා ශක්තිය දී එතුමන්ගේ පූර්ණ රාජ්‍ය තන්ත්‍රයම අප වෙත ලබා දෙන බව ශු. ලූක් තුමන්ගේ ශුභාරංචියේ 12 පරිච්ඡේදයේ 32 න් අපට ප්‍රකාශ කරන්නේ මෙසේය. "කුඩා රැළ බිය නොවන්න. ඔබට රාජ්‍යය දෙන්නට ඔබගේ පියාණන් වහන්සේ සැදී පැහැදී සිටින සේක."

ශ්‍රී ලංකාව තුළ අප සියයට 7 කටත් වඩා අඩු රැලකි. අප රැළෙන් කුඩා මුත් අපගේ ස්වාමීන් වහන්සේ විශ්වයටත් වඩා විශාලය. තවද අපට විරුද්ධව අභියෝග ඉදිරිපත් කරන අන්තවාදින් කැත කුනු මළකුණු කන හිවලුන් බවත් ඒ හිවලුන්ට විරුද්ධව අවි අමෝරා නොගෙන ධර්ම ශක්තියෙන් බිය නැතිව ක්‍රිස්තුන් වහන්සේ මෙන් නිර්භීතව නැගී සිටීමේ අවශ්‍යතාවය මෙසේ ශු. ලූක් තුමා 13 පරිච්ඡේදයේ 31 - 33 වගන්තිවලින් පෙන්වා දෙයි.

"ඒ මොහොතේම පරිසිවරුන්ගෙන් සමහරෙක් පැමිණ මෙතැනින් අහක්ව ගිය මැනව. මන්ද හෙරෝද් රජු ඔබ මරන රිසියෙන් සිටින්නේ යයි කීහ. උන්වහන්සේ ඔවුනට කතා කොට මෙසේ වදාළ සේක. "ඔබ ගොස් ඒ හිවලාට මෙසේ කියන්න. අදත් හෙටත් මම යකුන් දුරු කොට , රෝග සුව කරමි. තුන්වැනිදා මම මගේ පරමාර්ථය මුදුන් පත් කරගන්නෙමි.

එසේ වුවද අදත් හෙටත් අනිද්දාත් මා චාරිකාවේ යෙදිය යුතුය" අපගේ දහමේ උගන්වන ක්‍රිස්තු ධර්මය පැතිරවීමේ උත්තම කාර්යයට යමෙක් විරුද්ධ වුවහොත් අපිදු ඔවුනට ස්වාමීන් වහන්සේ වෙනුවෙන් මෙවැනි නිර්භීත දේ ප්‍රකාශ කර අපි අපේ කාර්යයන් ඉටු කළ යුත්තෙමු.

☛ 15 පිටුවට

ශුද්ධවූ බයිබලය ඇසුරෙන් සකස් කළේ

✍ **බොල්ලත ජෝර්ජ් හෙට්ටිආරච්චි**

---



## සභා පියවරු 58 කොටස

**මහාචාර්ය ඇන්ටන් මීමන විසිනි**

## හර්මස් තුමාගේ එඬේරා - 2

**පසුගිය සතිය හා සබැඳේ....**

මෙම ලිපියේ කතුවරයාට අනුව ඉතාම තරුණ වයසේදීම ඔහුව වහල් සේවයට විකුණා රෝමයට යවන ලදි. එහිදී රෝඩා නම් ආර්යාව විසින් ඔහුව මිලදී ගන්නා ලදි. හර්මස් තුමා තම කෘතිය ආරම්භ කරන්නේ එම සිද්ධිය සඳහන් කරමින්ය;"මාව හදා වඩා ගන්නා ලද ස්වාමියා මාව රෝමයේ සිටි රෝඩා නම් තැනැත්තියට විකුණන ලදි. වසර ගණනාවකට පසුව මට ඇයව මුණ ගැසුණි. එවිට මම ඇයට සහෝදරියකට මෙන් ආදරය කිරීමට පටන් ගතිමි."

හර්මස් තුමා තුළ යුදා ආගමික සම්ප්‍රදාය සහ වත් පිළිවෙත් ගැන මනා දැනුමක් පැවැතීමෙන් පෙනී යන්නේ එතුමා යුදා ජාතික පසුබිමකින් පැවත එන පුද්ගලයකු බව හෝ එසේත් නැත්නම් ඔහු යුදා ජාතික ගුරුවරුන් යටතේ සම්ප්‍රදායික අධ්‍යාපනයක් ලැබූ පුද්ගලයකු බවයි. එතුමා ඉතාමත් අවංක ලෙස තමා සම්බන්ධවත්, තම නෑදෑයින් සම්බන්ධවත් කරුණු කාරණා ඉතා පැහැදිලිව අනාවරණය කරයි.

එතුමාගේ ව්‍යාපාර කටයුතු ගැනත්, නිදහස් පුද්ගලයකු ලෙස එතුමා ඉපැයූ ඉඩකඩම් අහිමිවීම ගැනත් රෝමයේ සිට කුමේ නමැති ග්‍රාමය දක්වා ඇති මාර්ගය අසළ භූමියේ එතුමාට අයිති භූමියේ ගොවිතැන් කටයුතු කිරීමත් එතුමා සඳහන් කරයි. ග්‍රාමීය පසුබිමක තිබෙන අත්දැකීම්, පරිකල්පන ශක්තිය සහ සංකේතයන් එතුමාගේ කෘතිය තුළ බහුලව භාවිත වීමෙන්ම එතුමාගේ කෘෂිකාර්මික පසුබිම මොනවට පිළිබිඹු වේ.

එතුමාගේ දූ දරුවන් පීඩන සමයේ දී තම කිතුනු ඇදහිල්ල අත්හැර දැමූ බවත්, ඔවුන්ගේ දෙමාපියන්ව පාවා දුන් බවත්, ඔවුන් ඉතා නොහික්මුණු සහ අවුල් සහගත ජීවිත ගත කළ බවත් එතුමා පවසයි. එතුමාගේ බිරිඳ සම්බන්ධයෙන් එතුමාට කීමට යහපත් දෙයක් නොමැත. ඇය ඕනෑවටත් වඩා කියවන බවත්, ඇයගේ දිව ඇයට මැඩ පැවැත්විය නොහැකි බවත්, එතුමා සඳහන් කරයි. මෙම කරුණු කාරණා වලින් අපට පෙනී යන්නේ එතුමා ඉතා ශ්‍රද්ධාවත්, ධාර්මික සහ උද්යෝගිමත් පුද්ගලයකු වූ බවත් පීඩාකාරී සමයන්හිදී එතුමා තම ඇදහිල්ල පාවා නොදී අචලව සිටි බවත් ය.

මෙම කෘතිය පව් සමාව සහ මනස්ථාපනය පිළිබඳව දීර්ඝ දේශනාවකි. එය ලියැවී ඇත්තේ සැඟවුණු අනාවරණයක් ලෙසයි. එනම් එහි සැඟවී ඇති පණිවුඩය අප විසින් කියවා තේරුම් ගත යුතු දෙයක් ලෙසයි. කයිසාරියාවේ එව්සේබියස් රදගුරුතුමා මෙම කෘතිය ශුද්ධ ලියවිල්ලේ කොටසක් ලෙස සලකා එවකට දේවස්ථානවල කියවූ බව සඳහන් කරයි.

මෙම කෘතිය ප්‍රධාන කොටස් තුනකට බෙදා ඇත. ඒ තුළ දර්ශනයන් පහක්, නියෝගයන් දොළහක් සහ උපමා කතා දහයක් අඩංගු වේ. මෙම කෘතිය කොටස් තුනකට බෙදීම කතුවරයාගේ ක්‍රියාවක් වූවත්, ඒ සඳහා තර්කානුකූල පදනමක් නොමැත. ඊට හේතුව මෙම දර්ශනයන්, නියෝගයන් සහ උපමා කතා ආදි සියල්ලම එළිදරව් සාහිත්‍ය සම්ප්‍රදායයට අයිති වීමයි.

ලබන සතියට

---

# ලස්සන ලෝකයක්

**2013 නව වසර ආරම්භ වනවාත් සමඟම "ලෝක විනාශය" ගැන මනසේ රැව්දෙමින් පැවැති බියකරු සෙවනැලි වැනසී, අතුරුදන් වී කොයි කාගෙත් මනස නව ජීවයකින් ප්‍රබෝධමත් වන්නට ඇත.**



ඕනෑම මනුෂ්‍යයෙක් ස්වභාවයෙන්ම තම ජීවිතයට ආදරය කරයි. තමාගේ ආශා මුදුන්පත් කරගැනීමට වෙහෙසක් දරයි. එය තමාට යහපතක් වුවද, විනාශයක් වුවද බොහෝ විට කල්පනා නොකරයි. අයහපතට ද ඉඩදෙයි. මෙයයි විශාලතම ප්‍රශ්නය වනුයේ! අඳුරේ දූතයා, සාතන් මෙම උගුල මගින් දක්ෂ ලෙස ප්‍රයෝජන ගනිමින් මිනිසා ගොදුරු කර ගනී. තම ක්‍රියා ගැන මෙනෙහි කර බලන්නේ කවරෙක් ද? බුද්ධිමතා නිශ්චලව, සන්සුන් ලෙස කල්පනාවෙන් ක්‍රියා කරයි. ඕනෑම ක්‍රියාවකට පළමුව යහපත කිරීමේ ආශාවක්, ඇතුළාන්ත පෙළඹීමක් මිනිසා තුළ නිරායාසයෙන්ම හටගනී (අනුග්‍රහ වරප්‍රසාදය) දෙවනුව තම කැමැත්ත, ආශා අනුව වෙනත් හෝ අදහසක්, උදහසක් මනසින් නිකුත් කරයි. මිනිසා සතු නිදහස භාවිතයෙන් යහපත හෝ අයහපත ක්‍රියාවට නංවයි.

**තණ්හාව, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, හා පළිගැනීම වැනි සර්පයන් ළදරුවාට ළඟා නොවෙති. ඒ මන්ද, සිඟිති ඇතුළාන්තයේ සැඟවී දිදුළන දේව රාජ්‍යයේ රැස් ධාරාවට, ශක්තිමත් බලයට විෂකුරු සතුන් බිය වෙති. මෙන්න ලස්සන ලෝකය! සිඟිති ළමා ලෝකය සත්‍ය පිරිපුන් මිනිස්කම විදහා දක්වයි.**

දේව සංරක්ෂණය මගින් මිනිස්කම රැකගැනීම සඳහා ශක්තිමත් නොපෙනෙන බලයක් (ශුද්ධාත්මයාණෝ) මිනිසා සතුව පවතින්නේ උපතින්මය. කුඩා සිඟිත්තෙක් දෙස සුපරික්ෂාකාරීව බලන කල මෙම කරුණ මනාව අවබෝධ කරගත හැකිවේ. සිඟිත්තාගේ හැසිරීම් ප්‍රිය මනාපයි. පිරිසිදු සිතකින්, දිළිසෙන දෑසින් සිනාකට පුරවාගෙන ඔබ පිළිගනී. හදවතේ අවංක උණුසුම් ආදරයෙන් තම දෙමාපිය, සහෝදර නෑ හිතවතුන් තුරුළු කරගනියි. කළ වරද පිළිගනියි. සමාව දීම, සමාව ඉල්ලීම ළදරුවාට පහසුය. එකමුතුකම, ත්‍යාගශීලි බව නිසා කාගෙත් සිත් දිනාගනියි. ජාති, කුල, ආගම් භේද ළදරු මනසේ කොහෙත්ම නැත. ඇත්ත කතා කරයි. රෝගීන්, අසරණ වැඩිහිටියන් ආදරයෙන් පිළිගනියි. ඔවුනට සිඟිති උපකාරෙන් සංග්‍රහ කරයි. මේ ආදි උතුම් මිනිස් ගති පැවතුම් හිමිකර ජීවත්වන ළදරුවන්ගෙන් වැඩිහිටියනට උගත හැකි යහපත අප්‍රමාණය. සිඟිති සිත් තුළ ගැබ්වී පවතින වටිනා මුතු මැණික් මෙන් දිදුළන නියම මිනිස්ගති ඔබ, අප කොයි කාටත් පහසුවෙන්ම අත්කරගැනීමට වාසනාව ඇත. තණ්හාව, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, හා පළිගැනීම වැනි සර්පයන් ළදරුවාට ළඟා නොවෙති. ඒ මන්ද, සිඟිති ඇතුළාන්තයේ සැඟවී දිදුළන දේව රාජ්‍යයේ රැස් ධාරාවට, ශක්තිමත් බලයට විෂකුරු සතුන් බිය වෙති. මෙන්න ලස්සන ලෝකය! සිඟිති ළමා ලෝකය සත්‍ය පිරිපුන් මිනිස්කම විදහා දක්වයි.

ජනතාව අමතමින් ජේසුස් වහන්සේ මෙසේ වදාළ සේක. "සැබවින්ම මම ඔබට කියමි. ඔබ වෙනස් වී කුඩා දරුවන් මෙන් නොවුවහොත් කිසිසේත් ස්වර්ග රාජ්‍යයට ඇතුළු නොවන්නාහුය. එබැවින් කුඩා දරුවන් මෙන් යටහත්වන යමෙක් ඇත්ද, ස්වර්ග රාජ්‍යයෙහි ඉතාම උතුම් වන්නේ ඔහුය." (ශු. මතෙව් 18:3-4). "මේ බාලයන්ගෙන් එක්කෙනෙකුවත් නොමඟ යවන යමෙක් වේද, ඔහුගේ ගෙල වටා මහා ඇඹරුම් ගලක් එල්ලා මුහුදු ගැඹුරෙහි ගිල්වා දැමීම ඔහුට යහපත වේ." (ශු. මතෙව් 18:6).

මෙවැනි උතුම් දේව වදනින් උත්තම ජේසුස් වහන්සේ කුඩා දරුවන්ගේ වටිනාකම ලොවට පැහැදිලි කරන සේක. වැඩිහිටියාට කායික බවින් නැවත කුඩා වන්නට නොහැකි නමුත් අධ්‍යාත්මිකව වෙනසක් ඇතිකර ගත හැකි වේ. "උත්සහවන්තයා ජයගනී" මෙන්න ලස්සන ලෝකය! මෙහි මහිමාලංකාරය භුක්ති විඳින්නට ඔබත් කැමැතිද?

"ආරම්භයත් අවසානයත් වන සමිඳාණෝ මමය."

"එක එකා තම තමාගේ අසල්වැසියාට උපකාර කොට තම තමන්ගේ සහෝදරයන්ට ධෛර්යවත් වන්නැ"යි කියති. "බිය නොවන්න, මම නුඹ සමඟය. මා නුඹේ දෙවිඳාණන් වන බැවින් තැති නොගෙන සිටින්න. මම නුඹ ශක්තිමත් කර නුඹට උපකාර කරන්නෙමි. මගේ ජය හස්තයෙන් නුඹ ආරක්ෂා කර නුඹ ගලවන්නෙමි." (යෙසායා 41:5,6,10)

ගම්පොල

✍ **ගරු ලොරෙටා පැවිදි සොයුරිය** (S.B.V.)

ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

## දෙවැනි සතිය සඳුදා සැඳෑ යැදුම

ව්‍යක්ත කථිකයෙකි : මෙම වැකිය හෙබ්‍රෙව් පිටපතට අනුව "ඔබේ දෙතොල් දෙවි සමිඳාණන් විසින් ආසිරි ගන්වා ඇත" යනුවෙන් දැක්විය හැකිය. මෙහිදී කථිකත්වය බාහිර දෙයකට වඩා ඇතුළාන්ත ගැඹුරු බවට හා අවබෝධයට අදාළව අරුත් ගැන්වෙයි. (හිතෝප. 22:12).

වික්‍රමාන්විතය, තේජාන්විතය : දෙවි සමිඳාණන් වහන්සේ විසින් තමන් වහන්සේ නියෝජනය කිරීම සඳහා තෝරා ගන්නා අය සතුව පැවතිය යුතු ගුණාංග මේ වදන් වලින් ප්‍රබලව විස්තර වේ (ගීතා 21:5)

ඔබේ සිහසුන දෙව් සිහසුන මෙන් සදා වැජඹෙනු ඇත.: හෙබ්‍රෙව් පිටපතට අනුව මෙය "ඔබේ දෙව් සිහසුන" යනුවෙන් පරිවර්තනය කළ හැකිය. පුරාණ ගිවිසුමෙහි රජතුමාට "දේව පුත්‍රයා" යන නාමය යෙදුනු අතර, එය දෙවියන් වහන්සේ හා රජතුමා අතර සමීප සබඳතාව විදහා දැක්විය. (යෙසායා 9:6, ගීතා 2:7). නාතාන් දිවැසිවරයා දාවිත් රජ පරපුරේ සදාතන පැවැත්ම පිළිබඳව දෙන ලද දේව පොරොන්දුව මේ පසුබිමෙහි ප්‍රබලව දිස්වේ. එනම් මෙසියානික රජ දාවිත් රජ පරපුරෙන් මතු බිහිවීම පිළිබඳ පොරොන්දුවයි. (2 සාමුවෙල් 7:12-13, ගීතා 89:4). තවද නව ගිවිසුමෙහි හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද ලිපියෙහි ග්‍රීක සෙප්ටුවාජින්ත පිටපතට අනුව ගීතාවලියේ මෙම පාඨය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සඳහා යොදා ඇත. ඒ උන්වහන්සේගේ මෙසියානික අනන්‍යතාව සනාථ කිරීමටය (හෙබ්‍රෙව් 1:8-9).

ඕපිර්හි රන් අබරණින් : පුරාණ ගිවිසුමේ ලේඛන තුළ "එපිර්" යන නමින් නිරිත දිග අරාබියේ හෝ නැගෙනහිර අප්‍රිකාවේ ස්ථානයක් දැක්වෙන බව විශාරදයෝ පෙන්වා දෙති (1 රාජා 9:28). රන් අභරණ තුළින් රජතුමාගේ උතුම් බව හා තේජශ්‍රීය සංකේතවත් වේ.

(ඇ) වගන්ති 10 - 16 : මෙම කොටසින් රජුගේ තේජශ්‍රීය හා එක්ව යන විවාහ මංගල පිළිවෙතේ ගාම්භීර බව විස්තර වේ.

රජු වෙත ගෙනෙනු ලබන්නේ ය: මෙම කැඳවාගෙන ඒමේ චාරිත්‍රය විවාහ මංගල පිළිවෙත්වල විශේෂ අංගයක් ලෙස ශු. බයිබලීය ලේඛන පෙන්වා දෙයි. (1 මකබි 9:37,39, මතෙව් 25:1-12).

(ඈ) ව. 16 - 17
මෙම අවසන් කොටසින් රජතුමා හට ඔහු නියෝජනය කරන දාවිත් පරපුරේ අනාගත කාර්යභාරය ද ඒ සඳහා ඔහුට හිමිවන දේවාශිර්වාදය ද විස්තර කෙරේ.

කුමාරවරු : මෙයින් පසු කාලීනව ඊශ්‍රායෙල් දේශය පාලනය කළ නායකයන් හැඟවෙන බව පැහැදිලිය. එය සලමොන් රජ දවස පැවති කීර්තිමත් පාලනය ද (1 රාජා. 4:20-25), පසුව බෙදී ගිය රාජ්‍යයන් තුළ පැවති පාලනය ද (1 රාජා 20:14) සිහිපත් කෙරේ.

මුළු පොළොවෙහි : පුරාණ ගිවිසුම් පසුතලය තුළ මින් හැඟවුනේ දේව ජනතාව සැරි සැරූ, පැතිරුණු ප්‍රදේශයයි. (ද්වී. නීති 11:25, උත්. 11:1). ගීතාවලියෙහි රාජකීය ගී කාණ්ඩය මෙසියානික පාලනයක් තුළ ඇතිවන විශ්වීය බව නිතර සඳහන් කරයි (ගීතා 2:8, 72:8).

සිහි කරවන්නෙමි: සියලු ජනතාවන් වෙතින් දෙවියන් වහන්සේ වෙත නිරතුරු තුති පැසසුම් පුද කිරීම ගීතාවලියේ ප්‍රධාන තේමාවක් වේ (ගීතා 8:9, 111:9).




ශුද්ධ ලියැවිලි වසර

(42)

ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා

### යැදුම

විශ්ව රජාණන් වන දෙවි සමිඳාණන් වහන්ස, ඔබවහන්සේ දේව ජනතාවගේ මිදීම සඳහා දුන් මෙසියානික පොරොන්දුව ඔබ පුත්‍රයාණන් වූ කිතු සමිඳාණන් තුළින් මල්ඵල ගැන්වීම වෙනුවෙන් තුති පැසසුම් පුද කරමු. උන්වහන්සේ මෙසියානික ක්‍රියාවලියේ පල අප ජීවිත තුළ වඩවා ගනිමින් ලොවෙහි සැබෑ සාමය හා සෞභාග්‍යය වෙනුවෙන් ඇප කැපවීමට අපට පිහිට වුව මැනව.

ලබන සතියට

ගරු හෙන්රි සිල්වා පියතුමා

66

# පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යය හා ගීතාවලිය




### පසුගිය සතිය හා සබැඳේ

පුරාණ ගිවිසුම තුළ වැදගත් පුද්ගලයන්ගේ ගුණ වර්ණනා කෙරෙන 44:1-50:24 එහි පොදු තේමාවක් සහිත එකම කොටස වෙයි. මෙම ග්‍රන්ථය හිතෝපදේශයෙන් වෙනස් වන්නේ හිතෝපදේශය සතුවූ ප්‍රබල ආගමික හඬ ස්වරය නිසාවෙනි.

### සලමොන්ගේ ප්‍රඥාව

මෙම ග්‍රන්ථය ක්‍රි.පූ. 50 ආසන්නයේ ලියැවී ඇති බව කියැවේ. මෙම ග්‍රන්ථයේ අරමුණ වූයේ, ප්‍රබල දාර්ශනික පද්ධතින් මෙන්ම මිසදිටු ආගම් වලින් ද සමන්විත ග්‍රීක සංස්කෘතියේ දැඩි බලපෑම මැද, තම මුතුන් මිත්තන් සතුවූ ආගමික වතාවත් පිළිපැදීමෙන් ජුදා සංඝය ඉවතට යා නොදී ආරක්ෂා කිරීම ය. එමෙන්ම දේව සාධාරණත්වය හා සබැඳි ප්‍රතිවිපාක ලැබීමේ ගැටළුව ද මතුව තිබිණි. එනම් දැහැමියා තම ජීවිතාන්තය දක්වා දුක් විඳින අතරතුර දුදනන් සතුටින් දිවි ගෙවන්නේ කෙසේ ද යන ප්‍රශ්නයයි. පුරාණ ගිවිසුම් ලියැවිලි මෙනෙහි කරන කතුවරයා මරණින් පසු ජීවිතය යනු සංකල්පය කරා ළඟා වෙයි. ඔහුගේ අවසන් නිගමන, ග්‍රීක දර්ශනය තුළ මිනිස් ආත්මයේ අමරණීයත්වය පිළිබඳ අධ්‍යයනයේ ප්‍රතිඵලයක් නො වන බව ද කිව යුතුය.
සලමොන්ගේ ප්‍රඥාව පොත, ලිහිල්ව ප්‍රධාන කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකිය.

1. ප්‍රඥාව පැසසීම - 1:1-11:1
2. නික්මයාම සිදුවීම තුළ තම ජනතාව වෙනුවෙන් දෙවියන් වහන්සේගේ මැදිහත්වීම - 11:2-19:21

මුල් කොටස නැවත උප කොටස් වලට බෙදිය හැකිය.

- 1:1-6:21 ප්‍රඥාවේ විපාකය ලෙස ලැබෙන අමරණීයත්වය
- 6:22-11:1 සලමොන් විසින් ප්‍රඥාව සොයා යාම

මෙම ග්‍රන්ථය අපට වැදගත් වනුයේ එය මරණින් මතු ජීවිතය අවධාරණය කරන බැවිනි. එලෙසම ග්‍රීක දාර්ශනික චින්තනය, පුරාණ ගිවිසුම් (බයිබලීය) චින්තනය සමඟ එකට ගලපන බැවිනි. ආකාරයෙන් ඉදිරිපත් කර තිබීම ඇසුරෙන් ප්‍රේම ගී කෘතිය තේරුම් ගත හැකිය.

### නිගමනය

පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යය මූලික වශයෙන් ලෞකික ආකාරයකින් ඉදිරිපත් කර ඇතත් ඉශ්‍රායලයේ ඒක දේව වාදය හේතුකොටගෙන ආධ්‍යාත්මික දෘෂ්ටියක් ද එයට ගැබ් කර ඇත. කෙසේ වෙතත් පැරණි මැද පෙරදිග ප්‍රඥා සාහිත්‍යයෙන් බැහැරව එය තේරුම් කළ නොහැකිය. පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යයේ අනන්‍යතාව වන්නේ එය ඒක දේව සංකල්පය හා මුසුවීම තුළ අධ්‍යාත්මික බවකින් පෝෂණය වීමයි. මේ ආකාරයෙන් පුරාණ ගිවිසුමේ ප්‍රඥා පොත්වල කතුවරුන් පැරණි මැද පෙරදිග ප්‍රඥා සාහිත්‍ය පෝෂණය කිරීමට දායක වී ඇති බව ද පෙනේ.

ඉදිරියට...


# ඇදහිල්ලේ පරමාදර්ශ

දෙවන වතිකාන කතිකාවත (ක්‍රි.ව. 1962 - 1965) "නූතන සාන්ත සභාවේ දූත මෙහෙවර කුමක් ද? යන්න විවරණයක යෙදුනු ප්‍රධාන අවස්ථාව ලෙස හඳුන්වා දිය හැකි ය. එහි ප්‍රතිඵලයක් ලෙස සාන්ත සභා නවෝදයක සුසලකුණ වන්නට මන්ත්‍රණ සභාවට හැකි විය. දෙවන වතිකාන කතිකාවත සංවිධානය වී අර්ධ දශකයක් පසුවීම, සලකා බැලිය යුත්තකි; සැමරිය යුත්තකි. ජගත් සසුනිසුරාණ සොළොස්වන බෙනදික් ශුද්ධෝත්තම පියතුමා විසින් "විශ්වාසයේ වසර" ප්‍රකාශ කිරීම, ඒ අරබයා සිදු වූවකි. ඒ අනුව දෙවන වතිකාන කතිකාවත ආරම්භ කළ ක්‍රි.ව. 1962 ඔක්තෝබර් 11 දින සිහිගන්වමින් ක්‍රි.ව. 2012 ඔක්තෝබර් 11 දින සිට, සා. ලූක් ජනවන්දනා වසරේ (තෙවන වසර) අවසාන ඉරුදින වූ ක්‍රිස්තු රජාණන්ගේ මංගලෝත්සවය සැමරෙන ක්‍රි.ව. 2013 නොවැම්බර් 24 දින දක්වා විශ්ව කතෝලික සභාව, තම විශ්වාසය පිළිබඳ යළිත් සුපරික්ෂාකාරී අවධානයෙන් කටයුතු කෙරෙනු ඇත.

සාන්ත සභාව විශ්වාස කරන්නේ කුමක් ද? සාන්ත සභාවේ විශ්වාසය පිළිබඳ සාරාංශයක් ලිඛිතව ඉදිරිපත් කෙරුණු පළමු අවස්ථාව ලෙස ක්‍රි.ව. 325 දී පැවති නිසියානු මන්ත්‍රණ සභාව හඳුන්වා දිය හැකිය. කෙසේ වුවත් ක්‍රිස්තියානි විශ්වාසයට පදනම් වන්නේ, "එක ම දෙවියන් වහන්සේ" පිළිබඳ ඇදහිල්ල යි. ඒකදේවවාදය ක්‍රිස්තියානි ධර්මයට පමණක් ම ආවේණික සංකල්පයක් නො වේ.

ලොව ප්‍රධාන ආගම් රාශියකම මේ සංකල්පය පැහැදිලි ව ඉදිරිපත් වේ. හින්දු, ජුදා, ඉස්ලාම් ධර්මයන් ඒ අතර සුවිශේෂී ය. නමුත්, මේ ධර්මයන් සහ ක්‍රිස්තියානි විශ්වාසය අතර ඒ ඒ ලබ්ධියට අදාළ වූ සුවිශේෂී ඉගැන්වීම් ඇත. මේ අතර ජුදා, ක්‍රිස්තියානි, ඉස්ලාම් ධර්මයන් පුරාණ මැද පෙරදිග පොදු මූලාශ්‍රයන් සමඟ සබැඳී පවතින බැවින් විෂමතා අතර සමාන චින්තන ධාරාවන් ද හඳුනා ගත හැකිය. මේ ලිපිය මඟින් ක්‍රිස්තියානි විශ්වාසයේ පූර්වාදර්ශ ලෙස අගැයුමට බඳුන් වන චරිත දෙකක් පිළිබඳව සැලකිල්ලට බඳුන් වේ.

### ආදිපිය ආබ්‍රහම්



මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ ඌර් ජනපදවාසියකු ලෙස ශු. බයිබලය ඉදිරිපත් කරන ආබ්‍රහම් ක්‍රි. පූ. 18 වන සියවසේ පමණ ජීවත් වන්නට ඇතැ"යි සැලකේ. සියල්ල අත්හැර සමිඳාණන් වහන්සේ සොයා යන්නට ඔහු ලබන කැඳවීම සුවිශේෂී වේ. (උත්පත්ති 12:1-3). ඔහු සිය මව්බිම අත්හැර යන්නේ ඉසුරු සොයා නොවේ. මව්බිමේ ම සරණාගතයකු බවට පත් වූ නිසා නොවේ. මව්බිම ගැන කලකිරීමෙන් නොවේ. ඔහු සිය මව්බිමට ආදරය කරන්නට ඇත. ඒ ඔහු උපන් භූමිය ය. ඔහු සිය නෑසියයන් අත්හැර යන්නේ ඔවුන් සමඟ ජීවත් වන්නට නොහැකි වූ නිසා නොවේ. ඔවුන් සමඟ යම් අමනාපවීමකින් නොවේ. ඔහු සිය නෑදෑයන්ට ද ආදරය කරන්නට ඇත. මේ කරුණු අප තේරුම් ගත යුත්තේ ආබ්‍රහම් ජීවත් වූ ගෝත්‍රික සමාජ පසුබිම තුළය. සිය භූමිය, ගෘහය, නෑදෑයන් අහිමි වීම, වාසනාවන්ත අත්දැකීමක් විය නොහැකි ය. ඇරත් ඔහු යා යුතු මග නියම කර තිබුණේ නැත. හාරාන් දේශය - වයස්ගතව වැහැරුණු තම දෙපාවලින්, වඳයැ"යි සැලකුණු තම බිරිඳත් කැටුව, නිරුදක කාන්තාර තරණයෙන්, ශුෂ්ක දේශගුණයෙන්, අනාරක්ෂිත ගමන් මාර්ග යෙන් සො යා ගත යුතු විය. (උත්පත්ති 12:4). මේ සියලු අවදානම් මධ්‍යයේ ආබ්‍රහම් සියල්ල අත්හැර නික්ම ගියේ ය. මිනිස් බුද්ධි පරික්ෂණයෙන් සාධාරණ යැ"යි සැලකිය නොහැකි නිරර්ථක අඥාන තීරණයකට ඔහු පිවිසියේ ය. ඒ තුළ අපේක්ෂා සහගත විය හැකි එක් කරුණක් පමණක් ඔහු දුටුවේය. ඒ තමන් කැඳවූ දෙවියන් වහන්සේ ම තමන් සුරක්ෂිත ගමනාන්තයක් වෙත පමුණුවනු ඇතැ"යි යන "තිර විශ්වාසය"යි.

ආබ්‍රහම් තම ජීවිත කාලය තුළ තමන් විශාල ජාතියක පියා වන බව නුදුටුවේය. තම දරු සම්පත අහසේ තරු මෙන් - මුහුදේ වැලි මෙන් වර්ධනය වන බව නුදුටුවේය. (උත්පත්ති 15:5). තමන් ආගන්තුක ව විසූ දේශය, තම ජාතියේ උරුමය වන බව නුදුටුවේය. "ආබ්‍රහම්" (උත්පත්ති 17:5) වූ තම නාමය ආශිර්වාදයේ නාමයක් වන බව නොඇසුවේ ය. තම ප්‍රඥාවට එකඟ නොවන්නේ වුවද තේරුම් ගත නොහැකි වුවද දෙවියන් වහන්සේ සෑම විටම විශ්වාසවන්ත වන බව ඔහු ඇදහුවේ ය. (උත්පත්ති 15:6).

තම මුළු මහත් බලාපොරොත්තුවම වූ පුත්‍ර ඊසාක් පුද දීමට වුවද ඉදිරිපත් වීමෙන් එහි ප්‍රබල බව ප්‍රකට වේ. (උත්පත්ති 22:11-12). මේ නිසා ආබ්‍රහම්ගේ ජීවිතය, දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම තුළ තමන් ආදරය කළ සියල්ල පරිත්‍යාග කිරීමකි.

එනම් තමන්වම ත්‍යාජ කරමින් දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසවන්තව ජීවත් වීමකි.

### නිමල මරියෝත්තමාව

මරියතුමිය ශ්‍රේෂ්ඨ වන්නේ හුදු ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මෑණියන් වීම නිසා ම නොවේ; ඇය සතුව පැවති අචල විශ්වාසය නිසා ද වේ.

පළමුව ආබ්‍රහම් මෙන් ම ඇය ලැබූ කැඳවීම ද අසමසම වේ. ආබ්‍රහම් අභිබවා වන ශ්‍රේෂ්ඨත්වයක් ගැබ් වේ. ආබ්‍රහම් මෙන් ම අභියෝගාත්මක ජීවිතයකට දෙවියන් වහන්සේ ඈ කැඳවූ සේක. ලූක් ශුභාරංචිය ඉදිරිපත් කරති "ජේසුස් වහන්සේගේ උපත දැනුම් දීමේ" පුවත මරියෝත්තමාවගේ භූමිකාවේ ආරම්භක සටහනයි. දෙවියන් වහන්සේ මිනිසෙකු වීමේ පුවත පළමුව අදහාගත යුතු වූයේ ඇය ය. අති උත්කෘෂ්ට දෙවියන් වහන්සේට මනුෂ්‍යයකු විය හැකි ද? ඇරත් එම දෙවියන් වහන්සේ, බිළිඳෙකු ලෙස තම කුසින් බිහිවිය හැකි ද?



ගාබ්‍රියෙල් අග්‍රදේවදූතයාගේ පණිවුඩය පිළිගැනීමෙහිලා ඇය පත් වූ තත්ත්වය දුරවබෝධ ය. ඇය සැබවින් ම "අතිශයින් කැළඹී" ම යුක්ති යුක්ත නොවේ ද? (ශු. ලූක් 1:29) එහෙත්, "සමිඳාණන් වහන්සේ ඔබ සමඟ ය." (ශු. ලූක් 1:28) "ඔබ දෙවියන් වහන්සේගෙන් වරප්‍රසාද ලද්දෙහි ය." (ශු. ලූක් 1:30) "දෙවියන් වහන්සේට නො කළ හැකි කිසිවක් නැත." (ශු. ලූක් 1:37) යන්න අදහා ගැනීමට ඇය පැකිලුණේ නැත.

එබැවින් මනුෂ්‍ය ස්වභාවය (ශු. ලූක් 1:34). අතික්‍රමණය කරමින් දෙවියන් වහන්සේ තුළ යැපෙන්නට ඕ තීරණය කළා ය. තම ජීවිතය, තම ආදරවන්ත ජෝසෙප් සමඟ ජීවිත් වීමේ භාග්‍ය පරදුවට තබමින්, "දෙවියන් වහන්සේගේ විශ්වාසවන්ත දාසිය වීමට" ඇය එකඟ වූවා ය. (ශු. ලූක් 1:38).

ජොහාන් ශුභාරංචි කර්තෘවරයා, මරියෝත්තමාවගේ මේ ඇදහිල්ලේ ජීවිතය වෙනත් දෘෂ්ටි කෝණයකින් ඉදිරිපත් කර ඇත්තේ ය. කානාහි සරණ මංගල්‍යයේ දී (ශු. ජොහාන් 2:1-12). ක්‍රියාශීලි විශ්වාසවන්තියක් වූ ඇගේ භූමිකාව ප්‍රකට වේ. "මිදියුස" විමුක්තියේ සංකේතයයි. ආරම්භයේ දී මුල් මිනිස් යුවල සරණ කර ආශිර්වාද කළ දෙවියන් වහන්සේ, මේ විවාහ මංගල්‍යය සඳහා ද මිනිස් වෙසින් වැඩම කර ඇති බව ඇය දුටුවාය. දෙවියන් වහන්සේගෙන් විමුක්තිය අයදිනු මිසැ ඇය කුමක් කරන්නද? "මිදියුස නැතැ"යි (ශු. ජොහාන් 2:3) ඕ තම පුත් දෙවිඳුන්ට පවසන්නේ එබැවිනි.

විමුක්තිය උදා කළ හැක්කේ මිනිස් ප්‍රයත්නයන්ගෙන් නොව දෙවියන් වහන්සේට පමණක් බව ඕ ස්ථිරව විශ්වාස කළා ය. එහෙත් "නියමිත මොහොත" තවම උදා වී නැත. (ශු. ජොහා් 2: 4) විමුක්තිදායක දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසවන්ත වන්නට මරියතුමිය ඇරියුම් කරයි. ඒ සඳහා එතුමාණන් "ඔබට කියන කොයි දෙයක් වුව ද" කළ යුතුව ඇත. (ශු. ජොහාන් 2:5)

මරිය තුමිය ඒ විශ්වාසය තුළ ජීවත් වූවාය. "විමුක්තිදායක දෙවිඳාණන් යැ"යි ඇයට අනාවරණය කළ තම පුත් රුවන, ජනතාව සහ තම ජනතාවගේ නායකයන් විසින් ම දෙව් - මිනිස් සබඳතාව ප්‍රවර්ධනය කළ යුතු පූජකවරු විසින් ම ඝාතනය කළ යුතු යැ"යි නිර්ණය කරද්දී ඇය සසල වූයේ නැත. (ශු. ජොහාන් 19:15) ඇය විශ්වාසයේ කුරුසිය වෙත ගමන් කළා ය. දුරින් නොව ළඟින් - පාමුල සිටියා ය (ශු. ජොහාන් 19:25). විමුක්තියේ මොහොත උදා වන තුරු ඉවසීමෙන් විශ්වාසවන්තව සිටියාය. දෙවියන් වහන්සේට ප්‍රේම කරන උන්වහන්සේව විශ්වාස කරන සියලු ශ්‍රාවකයන්ගේ මාතාව බවට ඇය පත්වන්නේ එබැවින් ය.

බර්ට්‍රම් එස්. ප්‍රනාන්දු
බේරුවල

ජනතා හඬ

# චතාරිකය තුළ සැබෑ ජීවිත වෙනසක් අත්දකිමු!

**කතුතුමනි,**

කතෝලික ජනවන්දනා චක්‍රයේ 'චතාරික සමය' නොහොත් ජනතාව අතර ප්‍රචලිත 'කොරස්ම කාලය' අත ළඟටම පැමිණ ඇත. අළු බදාදායින් ඇරඹෙන දින 40 ක කාලය චතාරික සමයයි. අප ශාස්තෘවරයාණන් වන ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය සිහිපත් කරන මෙම සමය අපගේ පව් ණය වෙනුවෙන් පශ්චාත්තාපවීමේ කාලය ලෙස ද සැලකෙයි. සැබැවින්ම අපගේ ජීවිත තුළ 'සැබෑ පෙරළිය' ක් ඇතිකර ගැනීමට අපි හිතට ගත යුත්තෙමු.

ජේසුස් සමිඳාණන් දුක් විඳ කුරුසියේ මරණයට පත්වූයේ පව්කාරවූ අප වෙනුවෙන් මිස උන්වහන්සේගේ කිසියම් හෝ වරදක් නිසා නොවේ. සාතන්ගේ පරීක්ෂා හේතුවෙන් පාපයට ඇද වැටෙන අපි චතාරික සමය තුළ පාපයෙන් මිදී සමිඳු මඟ යන්නට තිරසාර අදිටනක් ඇතිකර ගත යුත්තෙමු. චතාරික සමය තුළ හුදු භක්ති අභ්‍යාස වල නිරත වීමෙන් පමණක් පලක් වේයැයි සිතිය නොහැකිය. ඒ වෙනුවට අපේ ජීවිතවල කැකෑරෙන පාප වලින් මිදීමට ක්‍රියාමාර්ග ගැනීම වඩාත් වැදගත් වනු නොඅනුමානය.

චතාරික සමය තුළ පව් කමාවේ ප්‍රසාද නිධානය හොඳ සූදානමකින් යුතුව ලබාගැනීම වැඩදායක වෙයි. පාදනමස්කාර පිළිවෙත චතාරිකය තුළ සිදුකෙරෙන භක්ති අභ්‍යාසයකි. එහිදී ජේසු සමිඳාණන් ගැන දුක්වීමට වඩා තම පව්කාර ජීවිතයෙන් මිදීමට හිතට ගැනීම වැදගත් වන්නේය. මෙවර චතාරිකයේ දින 40 ජීවිතය වෙනස් කර ගැනීමේ වැඩදායී කාලපරිච්ඡේදයක් කර ගැනීමට හිතට ගනිමු! එම කාලයට පමණක් එය සීමා නොකරමු! එවිට චතාරිකය වඩාත් අරුත්බර වනු නොඅනුමානය.!

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**
පේරලන්ද

# ගවලෙන පල්ලියෙන් ගිලිහෙන ලකුණු



**කතුතුමනි,**

නත්තලේ ප්‍රබල සංකේතය වනුයේ ගවලෙනයි. එය සෑම දෙව්මැඳුරකම, නිවසකම දැන් දැන් කඩ සාප්පුවල පවා නිර්මාණය වීම සතුටට කරුණකි. එදා ගවලෙන නිර්මාණය කළේ දෙමාපියන් දූ දරුවන් එකමුතුව තම තම හැකියාවන් පිළිබිඹු වන ආකාරයටය. එහෙත් එය අද වන විට කඩේ පවතින වෙළඳ භාණ්ඩයක් බවට පත්ව ජනතාව ඒවා මිලදී ගෙන නිවාස වල ප්‍රදර්ශනය කිරීම අරඹා ඇත. මේ ප්‍රවනතාවයෙන් ඈත්ව තම තමන් එය නිර්මාණය කිරීමට යොමුවීම වැදගත්ය.

එමෙන්ම අද වන විට දෙව්මැඳුරු වෙතින් ගවලෙන ගිලිහී යන තැනටද කරුණු යෙදෙමින් පවතින බවක් පෙනේ. සමහර දෙව්මැඳුරු තුළ නොව පල්ලිය වත්තේ, පල්ලිය ඉස්තෝප්පුවේ ගවලෙන සාදන තැනට පත්වෙමින් පවතී. නවීකරණය වූ දෙව්මැඳුරු තුළට ගවලෙන සුදුසු නොවන නිසා එය එසේ වනවා දැයි සැකයකි. කෙසේ වුවද මේ ප්‍රවනතාවය එතරම් සුදුසු නැත. ගවලෙන දෙව්මැඳුරේ නිසි ලෙස ජනතාවට ප්‍රදර්ශනය වන තැනක සෑදීම අතපසු නොකළ යුතුය. මන්දයත් මෙය පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යා යුතු සම්ප්‍රදායකි. අද සමහර නත්තල් උත්සව වලද නත්තල් ගසට තැන දෙනවා විනා ගවලෙනට තැන නොදීම බලවත් වරදකි. නත්තලේ මූලික සිද්ධාන්තය වූ ගවලෙන සමාජය තුළ ඒ ආකාරයෙන්ම ප්‍රදර්ශනය කිරීම වැදගත්ය. එය මතු පරම්පරාව වෙනුවෙන් ඉතිරි විය යුතුය.

මේ නිසා සෑම දෙව් මැඳුරක් තුළම ගවලෙන සෑදීම අනිවාර්ය කළ යුතුය. වගකිව යුත්තන්ගේ අවධානයට යොමු වේවා!

**සිසිල් පෙරේරා**
කෙරවලපිටිය

# විශ්වාසයේ දරුවන් වෙමු

**කතුතුමනි,**

**මේ කතෝලික විශ්වාසයේ වසරයි. මේ බව ශුද්ධෝත්තම පියතුමන් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත. කිතුනු විශ්වාසය ලැබෙන්නේ දෙවියන්ගෙනි. විශ්වාසය නොමැති තැන කිසිවක් කළ නොහැකිය. එදා ජේසුතුමා සුබාරංචිය දේශනයේදී ඇඹිල්ල ගසක් පෙන්වා මෙසේ වදාළේය.**

'ඔබට අබටැක් පමණවත් දේව විශ්වාසයක් තිබේ නම් ඇඹිල්ල ගස ගැලවී ගොස් මුහුදේ පැළ වෙන්න යයි අණ කරන්න. එය එසේම සිදුවේවි." උන්වහන්සේ ඇඹිල්ල ගසක්ම තෝරාගත්තේ ඇඹිල්ල ඇඹුල් රසය. මුහුදු ජලය ලුණු රසය. ඇඹිල්ල ලුණට හුරු නැත. වෙන ගසක් එසේ මුහුදේ පැළ වුනත් ඇඹිල්ල ගස නම් පැළ නොවන්නේමය. විශ්වාසයේ බල මහිමය එතරම්ම වටී.

අද ලෝකයේ සිටින සියලු ජනතාවගෙන් පහෙන් හතරක්ම ක්‍රිස්තියානීන් වී ඇත. ඇදහිල්ල බොහෝ



කොටස් වලට චාරිත්‍ර වශයෙන් බෙදී ඇතත් විශ්වාසය එකම දෙවියන් ගැනය. අතීතයේදී දරුණු රජවරුන් විසින් ක්‍රිස්තියානීන්ව ශරීරය සූරා තාර දමා පිළිස්සීමෙන් සහ පණ පිටින් අත් පා කපා දමා හෝ සිංහ, කොටි වැනි භයානක සතුන්ට ගොදුරු කරදීම වැනි අමු අමුවේ ඝාතන සිදුකළත් ඔවුන්ගේ විශ්වාසය සෙලවුනේ නැත. ඔවුන් එසේ මරු වැළඳ ගනිද්දී ඔවුන්ගේ දේව විශ්වාසය දුටු දුනු හේවායින්ද 'අපිත් ක්‍රිස්තියානි කාරයෝ' යයි ඔවුන්ගේ හෙල්ල විසිකරමින් රජුට අභියෝග කළ බවත්, ඔවුන්ටත් එම දඬුවම් ලබාදුන් බවත් කියැවේ. 'ලෙයෙහි ප්‍රසාද නිධානය' ලැබුවෝ යයි ඔවුන්ව හඳුන්වනු ලබයි.

"අත්ත මිදිවැලට සම්බන්ධ නොවේ නම් එහි පළ දරන්නේ නැතැයි" ද ජේසුතුමා පවසා ඇත. කිතුනු ජීවිතය කුරුසියට සම්බන්ධ ජීවිතයකි. එබැවින් අපගේ ජීවිත තුළින් විශ්වාසය ප්‍රකාශ කරන්න. ඒ තමා කිතුනුකම.

**ජේ. විල්ප්‍රඩ් සමරසිංහ**
හාල්දඬුවන

# යොවුන් වියේ සිය දිවි නසා ගැනීම්

**කතුතුමනි,**

**මෑත කාලයේ නව යොවුන්වියේ පසුවන ශිෂ්‍ය - ශිෂ්‍යාවන් සියදිවි හානි කර ගැනීමේ ප්‍රවනතාවයක් ජන සංනිවේදන මගින් සහ බොරැල්ල සුසාන භූමියට වාර්තාවන මරණවලින් පෙන්නුම් කරයි. මේ පිළිබඳව සිහියට නැගෙන කරුණු නව යොවුන් වියේ ප්‍රේම සම්බන්ධතා හෝ විභාග අසමත් වීම් වුවද එය පමණක්ම නොවන බවද දැනගන්නට ලැබේ.**

1960 දශකයට පෙර පාසල් වල අධ්‍යාපනය බෞද්ධ මුස්ලිම් - හින්දු - ක්‍රිස්තියානි - කතෝලික ආභාෂය තුළින් ගෙන ගිය බවත් එයින් කතෝලික - ක්‍රිස්තියානි සභාවල පාසල් ප්‍රමුඛත්වයේ සිටි බවත් නොරහසකි. පසුගිය වසරේ ජාතික රෝහලේ සා. පීතර දෙව්මැඳුරේ 125 වන ජුබිලිය සැමරුමේදී හෙළිදරව් වූ කරුණු අනුව සා. පීතර හෙදි නේවාසිකාගාරය - 18 වන සියවසේ අගභාගයේ සිට 1960 දශකය දක්වා ගරු කන්‍යා සොහොයුරියන්ගේ කන්‍යාරාමය - නිවස්නය වූ බවත් එතුමියන් එහි සිට ජාතික රෝහලේ රෝගින් හට ඇප උපස්ථාන කළ බවත් හෙළිදරව් විය. එහි සත්‍යතාව සා. පීතර හෙදි නේවාසිකාගාරය තුළින් සහ දේවස්ථානයට පිවිසෙන කොරිඩෝව මගින් අදටත් දක්නට ලැබේ.
අධ්‍යාපන සහ රෝහල් සේවය තුළ කතෝලික සභාව කළ සේවය නොරුස්නා බලවේග එවකට පිහිටි රජය නොමඟ යවා පාසල් රජයට පවරා ගෙන රෝහල් තුළ සේවය කළ පැවිදි සොහොයුරියන්ගේ සේවය නැවැත්වීමට කටයුතු කළහ. එදා අධ්‍යාපනයට සහ සෞඛ්‍ය සේවයට කළ කප්පාදු කිරීම්වල ප්‍රතිඵල අද එළි බැස ඇත. නාමික නිදහස් අධ්‍යාපනය ටියුෂන් පන්ති හරහා සහ මෑතකදි වාර්තා වුන අධ්‍යාපන ක්ෂේත්‍රයේ අර්බුද - විභාග අක්‍රමිකතා සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ රෝගීන් ඇපයට තබා දිනා ගැනීමට මාන බලන ඉල්ලීම් තුළ ද - කුමන ස්ථානයක වුවද සේවය කරන කවර තරාතිරමක වුවද සේවක - සේවිකාගේ හැසිරීම් හා ක්‍රියාවන් අධ්‍යාපනය හා ආධ්‍යාත්මික පෝෂණය තුළින් පෙන්නුම් කරයි.

වර්තමාන අධ්‍යාපනය තුළ ආධ්‍යාත්මික පෝෂණයකින් තොරව හුදෙක් විභාග පාස් වූ පුරවැසියන් බිහිවෙන වක වානුවක මුලින් සඳහන් කළ දිවිනසාගත් දරු දැරියන්ගේ තොරතුරු අතරට දෙදරා ගිය පවුල් සංස්ථාව තුළ ජීවත් වූ - දහම් පාසල් වලට සහභාගි නොවූ දරුවන් සිටීමද - සමාජයේ ඉහල ස්ථර වල සිටි පවුල් පසුබිම තුළ සාමාන්‍ය සිසු දරු දැරියන්ගේ ආශ්‍රය නොලැබූ අය වීමද සොයාගත් කරුණු අතර වූ බව සඳහන් කරමි. එකී කරුණු අතරින් පවුල් සංස්ථාවේ වගකීම් සහ යුතුකම්ද - දහම් පාසල් වල අගයත් එම ජීවිත තුළින් වැඩිහිටි අප අවදිකළ දුවා දරුවනි ඔබට බොරැල්ල සුසාන භූමියේ සිට 'සග සුවය' ප්‍රාර්ථනා කරමු.

**එන්. ජයන්ත පෙරේරා**
මහජන සෞඛ්‍ය පරීක්ෂක
බොරැල්ල

# මහා විපතේදී දෙව්ඳු ප්‍රේමය අත්දුටු විශ්‍රාමික විදුහල්පතිතුමා




**කතුතුමනි,**

**බදුල්ල සා. මරියා ආසන දෙව්මැඳුරේ මීසම්වාසියකු වන බණ්ඩාරවෙල දෙමෝදර සවුදම් විද්‍යාලයේ චන්ද්‍රසේකර මහතා එහි විශ්‍රාම ගිය විදුහල්පති තුමාය. බදුල්ල මීසම් සේවක ගරු ප්‍රියලාල් කුරේ පියතුමාට පැවසූ පරිදි ඒ මහතා දේවාශිර්වාදය අත්දුටු මොහොතක් මෙසේය.**

පසුගිය ජනවාරි 10 වන බ්‍රහස්පතින්දා අනෙක් ප්‍රදේශවලටට මෙන්ම බදුල්ල, බණ්ඩාරවෙලද නායයාම් වලටද ගොදුරු වූ දරුණු වර්ෂාවක් ඇද හැලුනි. මේ අවස්ථාවේ චන්ද්‍රසේකර මහතාගේ බිරිඳ සිටියේ මඩකලපුවේය. ඒ මහතා එදින බදුල්ලට පැමින පාසලේ දූ දරුවන්ට කේක් රැගෙන යනවිට බසය පැයක් ප්‍රමාද විය. ඔහු ගෙදර යනවිට නිවස බිමට සමතලා වී තිබුණි. නිවසේ ඇතිකරන සුනඛයා නිවසටත්, තම හාම්පුතාටත් අනතුරක් වී ඇති බව තේරුම්ගෙන ගල්තලාවක වැතිරී නිවස දෙස බලා සිටින අයුරු විදුහල්පති තුමාට දක්නට ලැබුනි. ගරු ප්‍රියලාල් පියතුමා අනිකුත් ගරු පියතුමන් සමග නිවස බලන්නට ගිය විට ඔහු පවසා ඇත්තේ "ෆාදර් අද මගේ නෝනා මඩකලපු නොගිහින් නිවසේ සිටියා නම් අද මට නෝනා කෙනෙක් නැහැ. ඒ වගේම බසය පැයක් ප්‍රමාද වූ නිසා මාත් අද ජීවතුන් අතර. දේව ප්‍රේමය මම අත්දැක්කා." තම නිවසට සිදුවී ඇති විනාශය දැක දැකත් ඔහුගේ දේව විශ්වාසය බලන්න. ගීතාවලියේ 91 සැමවිට කියවා බලන්නැයි ගරු පියනම පැවසීය.

**ශ්‍රීකාන්ති ගුණවර්ධන**
බදුල්ල



# ලක් මැණියන්ට කිතු

## (65 වන ජාතික නිදහස් දි

කිතුනු පිරිස යටත් විජිතවාදීන්ට කත් ඇද්දෝ නොවෙති. මෙයට විශේෂ සිද්ධියක් වනුයේ අප ජාතික නිදහස ලබා ගැනීම සඳහා මෙහෙය වූ නිදහස් සටනේ දී කිතුනුවන් ක්‍රියා කළ ආකාරයයි. එමෙන්ම 1915 දී ඇතිවුන බෞද්ධ - මුස්ලිම් කලහය හේතුවෙන් බෞද්ධ ජනතාවට සිදුවූ අසාධාරණයන්ට එරෙහිව කිතුනුවන් ගත් ක්‍රියා මාර්ගයන් අමතක කළ නොහැකිය. තවද, ජාතික ධජය තෝරා ගැනීම වෙනුවෙන්ද, අප රටේ ගැමි ජනතාවගේ සහ කම්කරු ජනතාවගේ ජීවිත මට්ටම උසස් කිරීම උදෙසා ද, කම්කරු අයිතින් උදෙසා ද, කලාව සහ සාහිත්‍ය ඔප නැංවීමට මෙන්ම, සෞඛ්‍ය, අධ්‍යාපනය වැනි නොයෙකුත් සේවාවන් තුළින් කිතුනුවන් මහ ජනතාව වෙනුවෙන් කර ඇති සේවය ඉමහත් ය. එවන් කිතුනුවන් සහ ඔවුන්ගේ ක්‍රියාවන් අතරෙන් සමහරක් පමණක් ඉතා කෙටියෙන් පහත සඳහන් වේ.

### බෞද්ධ - මුස්ලිම් කලහය

★ මහනුවර දිස්ත්‍රික්කයේ බෞද්ධයන් හා මුස්ලිම්වරුන් අතර කාලයක් තිස්සේ පැවතුනු සුළු අරගලයක් හේතුවෙන් දෙපිරිස අතර කළබල ඇතිවිය. මෙය වඩාත් බරපතළ වූයේ 1915 මැයි 28 වෙසක් පොහොදිනදී, ගම්පොල දී පැවති පෙරහරකට මුස්ලිම් පිරිසක් විසින් බාධා ඇති කිරීමයි. මැයි 31 වෙනිදා වන විට මේ කෝලහාලය මහනුවර සිට රඹුක්කනටත් කෑගල්ලටත් එතැනින් කොළඹටත් ව්‍යාප්ත විය. මේ නිසා ජුනි 02 වන දින යුද්ධ නීතිය ප්‍රකාශයට පත් විය. මහනුවර හා කොළඹ ස්ථාන කිහිපයක් හැරුණ විට අනික් ප්‍රදේශවල කලබලකාරි තත්ත්වය පැවතුනේ පැය කිහිපයක් පමණක් වූ අතර මරණ සංඛ්‍යාව 50 කට වැඩි නොවීය. මෙම කලහකාරී තත්ත්වය දින අටකින් පමණ (ජුනි 05 වන විට) මග හැරී ගිය ද, බ්‍රිතාන්‍ය යටත් විජිතවාදී පාලකයෝ ජුනි 10 වන දින "දුටු තැන වෙඩි තැබීමේ නියෝගය" පනවමින් මාස 3 ක් පුරා යුද්ධ නීතිය පවත්වා ගෙන ගියහ.

මෙහිදී ඔව්හු යුද්ධ නීතිය ප්‍රයෝජනයට ගත්තේ සිංහල බෞද්ධයන් පීඩාවට පත් කිරීමටය. බොහෝ ස්ථානවලදී කිසිදු වග විභාගයකින් තොරව බෞද්ධයන් වෙඩි තබා මරන ලදි. ධනවත් දේපල හිමි අය අත්අඩංගුවට ගෙන මුදල් ලබාගෙන නිදහස් කරන ලදි. ඉතාමත් දුෂ්ට අන්දමට බෞද්ධයන් බිය ගන්වා මුදල් පැහැර ගැනීම සිදු විය. සමහරුන්ට කස පහර පවා දෙනු ලැබුවේ ඔවුන් කලහකාරීන් ලෙස ක්‍රියා කළ නිසා නොව ඔවුන්ගෙන් මුදල් හා දේපල උදුරා ගැනීමේ චේතනාවෙන් ය. මුදල් නොලැබුන අවස්ථාවලදී ඔවුන් වෙඩි තබා මරන ලදි. විශිෂ්ඨ මෙන්ම ජනාදරයට පත්ව සිටි බෞද්ධ නායකයින් වන එෆ්. ආර්. හා ඩී. එස්. සේනානායක සොයුරන්, ඩී. බී. ජයතිලක, හෙන්රි අමරසූරිය, ඒ. ඊ. ගුණසිංහ, දොස්තර ඩබ්ලිව් ඒ. ද සිල්වා, ඩී. පී. විජේවර්ධන සහ පානදුරේ ඩයස් සහෝදරයින් අත්අඩංගුවට ගත් අතර ඔවුන් කොයි වේලේ හෝ වෙඩි තබා මරන බවට ද තර්ජන ඇතිවිය. මෙම දුෂ්ඨ ක්‍රියාවලට අමතරව, මුස්ලිම්වරුන්ට වන්දි ගෙවීම පිණිස බෞද්ධයන්ගෙන් බලහත්කාරයෙන් මුදල් ලබාගත් අතර එසේ මුදල් නොදුන් අයට කස පහර දීම ද අත්අඩංගුවට ගෙන සිරගත කිරීමද සිදුවිය. මෙම කාලය තුළදී යුද්ධ නීතිය යටතේ සිදුවූ සියළුම දාමරික සිදුවීම්වලට රජය වගකීමෙන් තොර බවට ප්‍රකාශයක් නිකුත් කිරීමෙන් අනතුරුව, 1915 අගෝස්තු 31 වන දින යුද්ධ නීතිය ඉවත් කෙරුණි.

★ මෙම බෞද්ධ - මුස්ලිම් කලහය මැඩලන්නට රජය ගත් දරුණු පියවර නිසා සිංහල බෞද්ධයන්ට විජාතික පාලකයන් විසින් කරන ලද දරුණු ක්‍රියාවන් වලින් ඔවුන් ආරක්ෂා කිරිම සඳහාත් එම අපරාධයන් ගැන විරෝධය පළ කිරීම සඳහාත් කිතුනුවන් බොහෝ දෙනෙක් පාලකයන්ට එරෙහිව නැගී සිටියහ. ඔවුන් අතරෙන් ශ්‍රීමත් ජේම්ස් පීරිස්, එඩ්වඩ් වෝල්ටර්, ඊ. ඩබ්ලිව් පෙරේරා සහ ඇල්බට් ඒ. වික්‍රමසිංහ යන මහත්වරුන් ප්‍රමුඛ තැනක් ගත්හ. සිරගෙදරට යෑම හෝ වෙඩි තබා මරණයට පත්වීම හෝ නොතකා, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මහතාගේ නිවසෙහි රහසිගතව රැස්වීමක් පවත්වන ලදි. මෙම රැස්වීමේදී ගන්නා ලද තීරණයක් අනුව, පාලකයන්ගේ දරුණු ක්‍රියාවන් ගැන බ්‍රිතාන්‍ය රාජ්‍ය නායකයන්ට කරුණු පෙන්වා දීම සඳහා දිස්ත්‍රික් ඒජන්තවරුන් විසින් 1915 ජුනි 10 වන දින නිකුත් කරන ලද "දුටු තැන වෙඩි තබනු" නියෝගයේ පිටපතක් තම පාවහන් අඩියෙහි සඟවාගෙන තම ජීවිතය පරදුවට තබා 1915 ජුලි මාසයේ දී බ්‍රිතාන්‍ය බලා නැව්නැංගේ සැදැහැවත් කිතු බැතිමතකු වූ ඊ. ඩබ්ලිව් පෙරේරා විරුවාණන් ය. ඔහු විසින් කරන ලද කරුණු පහදා දීමෙන් පසුව බ්‍රිතාන්‍ය රජය කේබල් පණිවුඩයකින් ආණ්ඩුකාර චාමර්ස් වහාම එම තනතුරෙන් ඉවත්කොට ඔහු වෙනුවට ශ්‍රීමත් ජෝන් ඇන්ඩර්සන් පත් කළේ ය.

★ සිංහල බෞද්ධයන්ට කරන ලද අපරාධයන් ගැන විරෝධය පළ කිරීම සඳහා 1915 සැප්තැම්බර් 25 දින කොළඹ "පබ්ලික් හෝල්" හි ප්‍රසිද්ධ රැස්වීමක් පැවැත්වුණි. ලංකාවේ නොයෙකුත් පළාත්වලින් පැමිණි 6000 ක් පමණ සිංහල ජනතාව සහභාගි වූ මෙම රැස්වීමේ මුලසුන හෙබවීම ක්‍රිස්තුභක්තික ජේම්ස් පීරිස් ශ්‍රීමතාණන්ට භාර කිරීම එතුමන් කෙරෙහි ජනතාව තුළ තිබූ ඉමහත් විශ්වාසයේ සහ ගෞරවයේ සංකේතයකි. සිදුකරන ලද අපරාධයන් ගැන අප්‍රසාදය පළ කරමින්, මේ ගැන කරුණු විභාග කර බැලීම සඳහා රාජකීය කොමිසමක් ඉල්ලා අඩු තරමින් පෙත්සම් පහක් මෙම රැස්වීමෙන් පසුව බ්‍රිතාන්‍ය ආණ්ඩුවට යවන ලදි. ඉන් පළමු පෙත්සමට අත්සන් තැබූ අයගෙන් අඩකට වැඩි පිරිසක් කිතුනුවෝ වූහ. එසේ කළ මුළු පිරිසගෙන් සියයට විස්සක්ම කතෝලික බැතිමතුන් විය.

★ කෑගල්ල දිස්ත්‍රික්කය තුළ විසූ බෞද්ධයන් රැකබලා ගැනීම සඳහා එහි විසූ භක්තිමත් කතෝලික බැතිමතකු වූ ඇල්බට් ඒ. වික්‍රමසිංහ මහතා නිර්භීතව ක්‍රියා කළේය. බ්‍රිතාන්‍ය රජයට යවන ලද (ඉහත සඳහන්) පෙත්සම් වලට තොරතුරු රැස් කිරීමේ කමිටුවට ඔහු තේරී පත් විය. එසේ යැවූ 4 වන හා 5 වන පෙත්සම්වල ප්‍රධාන වශයෙන් අඩංගු වූයේ කෝලහාලයෙන් පසුව කිසිදු නඩු විභාගයකින් තොරව කෑගල්ල දිස්ත්‍රික්කය තුළ මරා දමන ලද බෞද්ධයන් පිළිබඳව ඒ මහතා විසින් සපයන ලද තොරතුරුය. එම දිස්ත්‍රික්කය තුළ සිදුකරන ලද වෙඩි තැබීම් ගැන විභාග කිරීමට අලුතින් පත් වූ ඇන්ඩර්සන් ආණ්ඩුකාරතුමා විසින් 1916 ඔක්තෝබර් 26 වන දින "කෑගලු වෙඩි තැබීම් කොමිසම" පත් කරන ලදි. (මෙම කොමිසම සැලකිල්ලට ලක් කළේ, යුද්ධ නීතිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කය තුළ සිදුවූ දාමරික ක්‍රියා පමණි. මෙයට හේතුව, එවැනි ක්‍රියා අනෙක් දිස්ත්‍රික්කවල සිදුනොවූ නිසා නොවේ. එම දිස්ත්‍රික්කවල ද දාමරික ලෙස බෞද්ධයන් මරණයට පත් කළ ද මරණ පරික්ෂණ නොතිබුණ හෙයින් එම මරණ ගැන කිසිදු වාර්තාවක් නොතිබිණ. එහෙත් වික්‍රමසිංහ මහතාගේ වෑයම නිසා, පිළිගත හැකි පරිදි සාධක ඉදිරිපත් කරන ලද්දේ කෑගලු දිස්ත්‍රික්කයෙන් පමණි). කොමිසම් වාර්තාව 1917 ජනවාරි 18 වන දින නිකුත් විය.

★ සිංහල බෞද්ධයන් වෙනුවෙන් ක්‍රියා කිරීම අත්හරින ලෙස ආණ්ඩුකාර චාමර්ස් විසින් කරන ලද යෝජනාව අවඥා සහගතව ප්‍රතික්ෂේප කරමින් මෙම අවාසනාවන්ත කාලයේ දී සිංහල ජනතාවට නායකත්වය දී ඔවුන් නිසි මාර්ගයේ යොමු කළේ අව්‍යාජ දේශප්‍රේමියකු වූ ජේම්ස් පීරිස් ශ්‍රීමතාණන් ය.

### ජාතික නිදහස

★ කෑගලු කොමිසම් වාර්තාව නිකුත් වූවාට පසුව, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිතුමන් සහ හින්දු භක්තික ශ්‍රීමත් පොන්නම්බලම් අරුණාචලම් මැතිතුමන්ගේ නායකත්වය යටතේ, ලංකාවේ එවකට පැවති රාජ්‍ය ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පියවර ගන්නා ලදි. ඒ අනුව, "ලංකා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මණ්ඩලය" 1917 මැයි මාසයේ දී බිහිවිය. තවද, ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳව බ්‍රිතාන්‍ය රාජ්‍ය නායකයන්ගේ අවධානය පළමුව ඇති කළේ මෙම කොමිසම් වාර්තාවයි.

★ මෙරට පොදු ජනතාවගේ සහභාගිත්වය ඇතිව වඩාත් සාධාරණ රජයක් බිහිවීමට තුඩු දුන් කෑගලු කොමිසම ලබාග න්නටත් එය සාර්ථක කරගන්නටත් තමන් සතු සියල්ල පරදුවට තබා සටන් කළ වීරයා හැටියට ශ්‍රේෂ්ඨ කතෝලික බැතිමතකු වූ ඇල්බට් ඒ. වික්‍රමසිංහ මහතා හඳුන්වා දිය හැකිය.

★ 1918 දෙසැම්බර් 13 වන දින පවත්වන ලද "ලංකා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මණ්ඩල" සමුළුවේදී ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිතුමන් විසින්, අවුරුදු 100 කට අධික කාලයක් තිස්සේ ලංකාව පුරා ව්‍යාප්ත වූ රාජකීය යටත් විජිතවාදී පාලනය හෙළා දකිමින් ස්වයං පාලන ක්‍රමයක් ඇති කිරීම සඳහා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සිදුකළ යුතු බව යෝජනා කරන ලදි.

★ බෞද්ධ - මුස්ලිම් කලහයෙන් පසුව, 1915 සිට 1919 දක්වා කාලය තුළ ඊ. ඩබ්ලිව් පෙරේරා මහතා එංගලන්තයේ සිටිය හෙයින්, ජාතික නිදහස ලබාගැනීම වෙනුවෙන් දියත් කළ සටනේ දී ඔහුද එහි සිට අති ඉමහත් කැපවීමකින් තම දායකත්වය පිරිනැමීය. එම කාලය තුළදී, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් සහ අනිකුත් පරිපාලන නිලධාරින් රැසක් හමුවී ලංකාවේ සිදුවන අසාධාරණයන් ගැනත්, ලක්වැසියන්ට නිදහස ලබාදීම ගැනත් ඔවුන් දැනුවත් කරමින් මහඟු සේවයක් ඉටු කළේය. සිරගෙදරින් නිදහස් වීමෙන් පසුව එංගලන්තයට පැමිණි ඩී. බී. ජයතිලක (පසුව ශ්‍රීමත්) මහතා ද මෙහිදි ඔහුට සහය විය. ලංකාවේ එවකට සිටි පාලකයන්ගේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිවලට අකමැති වීම නිසා ලංකා සිවිල් සේවයෙන් විශ්‍රාම ලබා එංගලන්තයට ගොස් සිටි බ්‍රිතාන්‍ය ජාතික ලෙනාඩ් වුල්ෆ් මහතා ද (බැද්දේගම - නවකතා කතෘ) ඔවුන්ට නොමද සහයක් ලබා දුන් කෙනෙකි. මොවුන්ගේ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සම්බන්ධව සාකච්ඡා කිරීමට ලංකාවේ නියෝජිත පිරිසක් හමුවීමට යටත් විජිත භාර ලේකම්වරයා එකඟ විය.

★ මෙම උත්සාහයන් සියල්ල හේතුවෙන් යටත් විජිතයන් පිළිබඳ බ්‍රිතාන්‍ය රාජ්‍ය ලේකම් මිල්නම් සාමිවරයාණන් හමුවීමට නියෝජිත පිරිසක් යැවීමට අවස්ථාව ලැබුණි. ඒ අනුව, 1919 දී "ලංකා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මණ්ඩලය" විසින් බලගතු නියෝජිත පිරිසක් යවන ලදි. එෆ්. ආර්. සේනානායක, ශ්‍රීමත් බාරොන් ජයතිලක, ඩබ්ලිව්. ඒ. ද සිල්වා වැනි ශ්‍රේෂ්ඨ පුද්ගලයන් හත් දෙනෙකුගෙන් යුත් මෙම නියෝජිත කණ්ඩායමට ගරු ඩී. ජේ. නිකුලස් පෙරේරා පියතුමා සහ කතෝලික දොස්තර වී. ගේබ්‍රියෙල් මහතා ද අඩංගු විය. (ආචාර්ය මයිකල් රොබට්ස් විසින් ඉංග්‍රීසි බසින් ලියන ලද"DOCUMENTS OF CEYLON NATIONAL CONGRESS AND NATIONALISTIC POLITICS IN CEYLON , 1929 - 1950" - "ලංකා ජාතික සංගමයේ ලේඛන" 1 වන කාණ්ඩය, 213 පිටුව)

1919 දෙසැම්බර් මාසයේ දී පිහිටුවන ලද "ලංකා ජාතික සංගමය" බිහිවූයේ 1917 දී බිහිවූ "ලංකා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මණ්ඩලයේ" ප්‍රතිඵලයක් ලෙසය. මෙම සංගමයේ පළමු සභාපතිවරයා බවට පත්වූයේ ශ්‍රීමත් පොන්නම්බලම් අරුණාචලම් මැතිතුමන් ය. ඔහුට පසුව (1920 නොවැම්බර් 18 වන දින) එම තනතුරට පත්වූ ක්‍රිස්තු භක්තික ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිතුමන්, ලංකා ජාතික සංගමයේ සභාපති ධුරය හිමිකරගත් පළමු සිංහලයා විය. ජාතික සංගමය පළමු වරට (ක්‍රි.ව. 1918 - 1920) පත් කරගත් සහ-ලේකම්වරුන් දෙදෙනා අතර වූ ඊ. ටී. ද සිල්වා මහතා බැතිමත් කතෝලිකයෙකි. ඔහු එහි භාණ්ඩාගාරික ධුරය දැරූ පළමුවැන්නා ද විය. ජාතික සංගමයේ දෙවන වසරේදී (ක්‍රි.ව. 1921 දී) එහි එක් ලේකම්වරයකු හැර අන් ප්‍රධාන නිල සියල්ලම කිතුනුවන්ට හිමිවිය.

**ලංකා ජාතික සංගමයේ සභාපති ධුරය දැරූ අනිත් කිතුනුවන් මෙසේ ය.**

ෆ්‍රැන්සිස් ද සොයිසා 1925/1926
ඊ. ඩබ්ලිව්. පෙරේරා 1926/1927
පී. සී. එස්. (ශ්‍රීමත් ක්ලෝඩ්) කොරෙයා 1932/1933
(තුන් වතාවක්) 1939 / 1940
1941/1942
ජෝර්ජ් ඊ. ද සිල්වා (නොකඩවා 6 වසරක් ) 1944 / 1945 සිට 1949/1950

(මහනුවර සා. පාවුළු ඇන්ග්ලිකානු දේවස්ථානයට ආගමික කටයුතු සඳහා නිතර පැමිණි සැදැහැවත් කිතුනුවෙකි)

(ආචාර්ය මයිකල් රොබට්ස්, "ලං. ජා. සං. ලේඛන", 1 වන කාණ්ඩය, පිටු 3 සහ 4.)

★ ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිතුමන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳව යෝජනා රැසක් බ්‍රිතාන්‍ය රජයට ඉදිරිපත් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස නියෝජිතයන් 49 ගෙන් යුත් නව ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාව (Legislative Council) 1924 දී පිහිටුවන ලදි. 1924 ඔක්තෝබර් 16 වන දින මෙම නව මන්ත්‍රණ සභාව පළමුවරට රැස්වූ විට ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිතුමන් එහි උප සභාපති ලෙස නිතරගයෙන් පත්විය. එහි සභාපතිධුරය නීත්‍යානුකූලව දැරුවේ රටේ ආණ්ඩුකාරවරයා වුවද, සාමාන්‍යයෙන් ඔහු රැස්වීම්වලට සහභාගි නොවූ හෙයින් රැස්වීම් පවත්වන ලද්දේ උප සභාපතිගේ ප්‍රධානත්වයෙන් ය. ("Life of Sir James Peiris", පිටු 62, 81, 82).

★ ව්‍යවස්ථාව තවදුරටත් ප්‍රතිසංස්කරණය කිරීම ගැන කරුණු සොයා බැලීම සඳහා ඩොනමෝ ආදිපාදවරයාණන්ගේ නායකත්වය යටතේ විශේෂ කොමිසමක් බ්‍රිතාන්‍ය රජය විසින් 1927 නොවැම්බර් මාසයේ දී පත් කරන ලදි. ඊ. ඩබ්ලිව්. පෙරේරා මහතාගේ නායකත්වය යටතේ ලංකා ජාතික සංගමය විසින් මෙම කොමිසමට ඉදිරිපත් කළ පෙත්සමෙහි අඩංගු වී තිබූ කරුණු රාශියක් මත ඩොනමෝර් ව්‍යවස්ථාව සැකසුණු බව නොරහසකි. ("E.W. Perera..... Portrait



of a True Patriot", පිටු 73 සිට 76 ).

★ ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිතුමන් හා ඊ. ඩබ්ලිව් පෙරේරා මහතා, 1909 සිට ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සඳහා කළ උද්ඝෝෂණවල දී මූලිකව කටයුතු කළහ. මැනිං ආණ්ඩුකාරවරයාට විරුද්ධව විශ්වාසභංග යෝජනා දෙකක් ඉදිරිපත් කිරීමට තරම් ඔව්හු නිර්භීත වූහ. තවද 1922 දී මැනිං ආණ්ඩුකාරයා විසින් සමහර බදු මුදල් වැඩි කිරීම සම්බන්ධව දෙදෙනාම තද බල ලෙස විරෝධය පෑ අතර, සුදු නිලධාරීන් විසින් එම අවස්ථාවේදී විරෝධතාවයන් මර්ධනය කිරීමට ගත් උත්සාහයට එරෙහිව විරුද්ධත්වය ප්‍රකාශ කිරීමක් ලෙස ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවෙන් දෙදෙනාම පිට වී ගියහ.

★ ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිතුමන් ආගමික කටයුතු සඳහා නිතරම පොල්වත්තේ ශා. මයිකල් දේවස්ථානයට පැමිණි අයෙකි. වයස අවු. 74 දි 1930 මැයි 5 වෙනි දින ඔහු ස්වර්ගස්ථ විය. සැදැහැවත් ක්‍රිස්තු භක්තිකයකු වූ එතුමන් ජාතික නිදහස ලබා ගැනීම වෙනුවෙන් ගෙන ගිය අරගලය ඉන්දියාවේ ගාන්ධි ශ්‍රීමතාණන්ගේ අරගලය සමඟ සැසඳිය හැකි බව ඩබ්ලිව්. ටී. කේබල් ලේඛකයා සඳහන් කර ඇත්තේ මෙසේය:

"අපට ඔහුව ගාන්ධි ශ්‍රීමතාණන් සමඟ සැසඳිය හැකිය.... ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිතුමන් ඉතා මානුෂික දයාවකින් යුත් පුද්ගලයෙකි. ඉන්දියානු මහාද්වීපයට නිදහස දිනා දුන් ගාන්ධි ශ්‍රීමතාණන් තුළ තිබුණාවූ ධෛර්යය ද, පීඩිත ජනතාව කෙරෙහි අනුකම්පාවද, ඔහු තුළ තිබිණ. ශ්‍රී ලංකාව දැන් සතුටින් භුක්ති විඳින නිදහස දිනා ගැනීම වෙනුවෙන් ජේම්ස් පීරිස් ශ්‍රීමතාණන්, ඉන්දියාවේ ගාන්ධි තුමන් මෙන් ඉමහත් කැපවීමකින් පුරෝගාමීව ක්‍රියා කළේය." ("Life of Sir James Peiris" , 112 පිටුව).

★ ජාතික නිදහස වෙනුවෙන් ද, තම සහෝදර බෞද්ධ ජනතාව වෙනුවෙන් ද කැපවීමකින් ක්‍රියා කළ සැදැහැවත් කිතුනුවන්, අප රටේ එවකට විසූ බොහෝ නායකයන්ගේ පැසසුමට ලක් වී ඇත. මොවුන් අතරින්, නිදහස් අධ්‍යාපනයේ පියා වශයෙන් හඳුන්වන සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර මහතා විසින් ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිතුමන් සහ ඊ. ඩබ්ලිව් පෙරේරා මහතා පිළිබඳව කරන ලද පැසසුමෙන් බිඳක් පමණක් පහත සඳහන් වේ. :-

### ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිතුමන්

"ලංකා ජාතික සංගමයේ දෙවන වසරේදී සභාපතිධුරය දැරූ මෙතුමා දිගු කලක් අපගේ මඟ පෙන්වන්නා, දාර්ශනිකයා සහ මිතුරා විය. බ්‍රිතාන්‍ය පාලකයන් ඉදිරියේ ඔහු අපගේ නියෝජිතයා සහ ජනතාවගේ හඬ වශයෙන් බොහෝ අවස්ථාවන්හි ක්‍රියා කළේය. එවකට පැවති ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව අනිකුත් ලාංකීය නායකයන් සිතන්නටත් පෙර එය ගැන ඔහුගේ අවධානය යොමු විය....... 1915 දී ඇති වූ බෞද්ධ - මුස්ලිම් කලහය හේතුවෙන් විපතට පත් තම බෞද්ධ සහෝදර සහෝදරියන් වෙනුවෙන් ක්‍රියා කිරීම අත්හිටුවාදමන්න යැයි ඔහුගෙන් ආණ්ඩුකාර චාමර්ස් ඉල්ලා සිටියද, එතුමා එය අවඥා සහගතව ප්‍රතික්ෂේප කළේය. සෑම ජනතා ප්‍රශ්නයකදීම එතුමා තම ප්‍රතිපත්ති සහ පැහැදීම් මත සෑමවිටම එඩිතරව නැගී සිටියේ නියම ශ්‍රේෂ්ඨ රාජ්‍ය නායකයකු ලෙසය... එතුමන්ගේ ශ්‍රේෂ්ඨ සහ පරාර්ථකාමී සේවාවේ මතකය අප තුළ සදාකල් රැඳී පවතින්නේය. කෙතරම් සුළුවෙන් වුවද රට වෙනුවෙන් අවංක සේවාවක් ඉටුකිරීම සඳහා එතුමාගේ ආදර්ශය අපවද අපගේ මතු පරම්පරාවන් ද පෙළඹවන්නේය." (1930 දෙසැම්බර් 12 වන දින පවත්වන ලද කථාව - ආචාර්ය මයිකල් රොබට්ස් "ලං. ජා.සං. ලේඛන, 2 වන කාණ්ඩය, 965 පිටුව).

# ...නු අපගේ දායාදය

## (...දින සමරුව නිමිත්තෙනි)

**ඊ. ඩබ්ලිව්. පෙරේරා මහතා**

"ගාල්ල අවටින් උපත ලත් ඔහු තම සහෝදර ජනතාවගේ ගැළවුම්කරු විය. සෙසු ජනතාව අසහනයට පත්වද, තම ජීවිත අවිනිශ්චිතවද, ඕනෑම කෙනෙකුව දුටු තැන වෙඩි තැබීමට ලක් කළ හැකිවද තිබූ අවස්ථාවේදී මෙම ඛේදජනක සිද්ධීන් ගැන බ්‍රිතාන්‍ය රාජ්‍ය නායකයන්ට කරුණු පෙන්වාදීම සඳහා, ලක් මාතාවගේ එක් ශ්‍රේෂ්ඨ පුතනුවකු තම ජීවිතය පරදුවට තබා බ්‍රිතාන්‍ය වෙත නැව් නැංගේය. මෙම වීර ක්‍රියාවට පමණක්ම ඔහු දුටුගැමුණු, වලගම්බා, පරක්‍රමබාහු වැනි ජාතික වීරෝධාර නායකයන් සමඟ සැසඳීමට හැකිවේ." (1926 දෙසැ. 17 ගාල්ලේ දී පවත්වන ලද කතාව - "E.W. Perera.... Portrait of a True Patriot", 50 පිටුව).

★ ජාතිය රැක ගැනීමට මුළු ජීවිත කාලය පුරාම අපමණ වෙහෙසක් දැරූ "කෝට්ටේ සිංහයා" යන විරුදාවලිය ලත් ඊ. ඩබ්ලිව්. පෙරේරා මැතිතුමා, 1953 පෙබරවාරි 16 වන දින ස්වර්ගස්ථ විය. ඔහුගේ සොහොන් කොතේ සඳහන් කර ඇති, ඔහු විසින්ම තෝරා තිබූ බයිබලීය සංක්ෂිප්ත පාඨයක් වන "ජනතාවට සේවය කළ අයෙක් මෙහි නින්දට වැටී ඇත" යන පාඨයෙන්ම ඔහුගේ නිහතමානිකම හා ශ්‍රේෂ්ඨ බව පැහැදිලි වේ. එතුමාගේ ඉලක්කය වූයේ ලංකාවට සම්පූර්ණ ස්වපාලන බලය ලබා ගැනීමයි. එතුමා අතීතයේ සිටි ශ්‍රේෂ්ඨ



ස්වදේශාභිමානින්ගේ විශිෂ්ඨ උදාහරණයකි. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කතානායකධුරය හා 1931 දී ඔහුට පිරිනමන ලද "නයිට්" (ශ්‍රීමත්) පදවිය වැනි තනතුරු ඔහු එකහෙලාම ප්‍රතික්ෂේප කළේ ඒවා ලබා දෙන්නේ යටත් විජිතවාදී පාලකයින් ඍජුව විවේචනය කිරීම හා "අපට පූර්ණ නිදහස දී පිටවෙයව්" යන හඬගෑම නිශ්ශබ්ද කරවීමට යැයි ඔහුට හැඟුණ නිසාය. තවද සැදැහැවත් ක්‍රිස්තුභක්තිකයකු වූ එතුමා ද තම පියා මෙන් බුදු දහම නගා සිටුවීම සඳහා ඉමහත් සේවයක් ඉටු කළේය. (වෙසක් පොහෝ දිනය ප්‍රසිද්ධ නිවාඩු දිනයක් බවට පත් කර ගැනීම සඳහා ඔහුගේ පියාවූ එඩ්වර්ඩ් ෆ්‍රැන්සිස් පෙරේරා සහ මහාචාර්ය බටුවන්තුඩාව විසින් යටත් විජිතවාදී පාලකයන් වෙත කරුණු ඉදිරිපත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ පළමු වරට ප්‍රසිද්ධ නිවාඩු දිනයක් බවට පත් වූ වෙසක් පොහෝ දිනය 1885 අප්‍රියෙල් 28 වන දින විය). කඳුරට පන්සල් කීපයකම භික්ෂූන් වහන්සේලා සතුව ඒ දක්වාම සැඟවී පැවතුනු තොරතුරු ඇතුළත් තල් කොළවල ලියූ අත් පිටපත්, පොත්, කොඩි සහ තවත් ලේඛන සොයා ගැනීමට එතුමාට හැකි විය. මහත් ඓතිහාසික වටිනාකමකින් යුත් සැලසුම් දෙකක් ඔහු විසින් සොයා ගන්නා ලදි. ඉන් එකක් ක්‍රි.ව. 1344 දී අඳින ලද ලංකාතිලක විහාරයේ සැලසුමක් විය. අනික ඉතා විශාල (අඩි 5 රි 4 1/2) රාජකීය මාලිගාවක ගෘහ නිර්මාණ සැලසුම විය. ඔහු විසින් සොයාගන්නා ලද වැදගත් ලියකියවිලි අතර 14 වන ශත වර්ෂයේ අඳින ලද රුහුණු, පිහිටි, මායා යන ප්‍රාන්ත සීමාවන් ඇතුළත් පුරාණ ශ්‍රී ලංකා සිතියමක් ද විය.

ප්‍රථම පාර්ලිමේන්තු සභා ගර්භය තුළ ඔහුගේ සේයාරුවක් නිරාවරණය කරමින් එවකට අගමැතිව සිටි ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා එතුමන්ට ප්‍රණාමය පුද කරමින් ඔහුගේ නාමය ස්වදේශාභිමානී යුගයක මතකයන් පුබුදු කරවන බවත් මේ යුගයේ එවැනි පුද්ගලයන් ඇත්තේ ඉතා ස්වල්ප දෙනෙකු බවත්

**වික්ටර් සිල්වා**
**(FCA, FCMA, MCIM)**
**ලේකම්**
**ජාතික කතෝලික ගිහි සංවිධානය**

ප්‍රකාශ කළේය. විපක්ෂ නායකයාව සිටි එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා එතුමන්ව විශිෂ්ඨ ගණයේ දේශප්‍රේමියකු ලෙස හඳුන්වාදෙමින් එම උත්සවයේ දී කළ දීර්ඝ දේශනයේ දී ඊ. ඩබ්ලිව්. පෙරේරා මැතිතුමන්ගේ නිර්භීත භාවය ගැන, විශේෂයෙන්ම 1915 දී පැවති අඳුරු සමයේ දී ඉතා නිර්භීත ලෙස කටයුතු කළ ආකාරය සඳහන් කළේ ය.

★ පී. සී. එස්. (ශ්‍රීමත් ක්ලෝඩ්) කොරයා මහතාගේ ප්‍රධානත්වයෙන් 1941 දෙසැ. 27 සිට 30 දක්වා පැවැත්වූ ලංකා ජාතික සංගමයේ 23 සැසිවාරය කතෝලික ග්‍රාමයක් වූ දුම්මලදෙණියේ (අද කටුනේරිය ලෙස හැඳින්වෙන) "ස්වරාජ්පුර" භූමියෙහි පවත්වන ලදි. මෙම සැසිවාරයේ සංවිධානය කතෝලික බැතිමතකු වූ ඩී. පීටර් පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවකට බාර විය.

"අපගේ පරමාර්ථය ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය කිරීම නොව, සම්පූර්ණ ජාතික නිදහස ලබාගැනීම සහ ආණ්ඩු කිරීමේ අයිතිය ජනතාව වෙත පවරා අපගේම ව්‍යවස්ථාවක් ඇති කරගැනීම" බව ශ්‍රීමත් ක්ලෝඩ් කොරෙයා මහතා සිය මුලසුන කථාවෙහි සඳහන් කළේය. තවද, කතෝලික බැතිමතුන් වූ, ලංකා ජාතික සංගමයේ හිටපු සභාපති (1926) ෆ්‍රැන්සිස් ද සොයිසා මහතා මෙන්ම ඔහුගේ පුත්‍රයා වූ ස්ටැන්ලි ද සොයිසා මහතා ද මේ රැස්වීමේ දී නිදහස ලබා ගැනීම ගැන වැදගත් කරුණු ඉදිරිපත් කළෝය. (ආචාර්ය මයිකල් රොබට්ස්, "ලං. ජා. සං. ලේඛන", 2 කාණ්ඩය, පිටු 1418 සිට 1456).

★ මෙම සැසිවාරයට හලාවත රදගුරු අති උතුම් එඩ්මන්ඩ් පීරිස් හිමිපාණන් සහභාගි වූ වග වැඩිදෙනෙකු නොදන්නා කරුණකි. සිංහල භාෂාව හොඳින් නොදත් අය සඳහා රදගුරුතුමන් විසින් ඇතැම් සිංහල පරිවර්තන පිළියෙළ කර දී ඇත. (අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් අගරදගුරු හිමිපාණන් විසින් ලියන ලද "ශ්‍රී ලංකා මාතාව හා කතෝලික සසුන", පිටු 11 සහ 12).

★ නිදහස් සටනේ තීරණාත්මක අවස්ථාවක් හැටියට, 1942 දෙසැ. 18 - 20 දින දක්වා පවත්වන ලද ලංකා ජාතික සංගමයේ 24 වන සැසිවාරය හඳුන්වාදිය හැකිය. ශ්‍රී ලංකාව නිදහස් ස්වෛරී රාජ්‍යයක් බවට පත් කළ යුතුය යන අරමුණ ස්ථිරකොට පිළිගෙන, ඒ අනුව සංගමයේ ව්‍යවස්ථා මාලාව අනුමත කරගන්නා ලද්දේ මෙම සැසිවාරයේ දීය. මෙම යෝජනාව හිටපු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා ඉදිරිපත් කළ අතර එය ස්ථිර කළේ බැතිමත් කතෝලිකයකු වූ නීතිඥ ජෝශප් ඒ. එල්. කුරේ මහතා ය. ඔවුන් දෙදෙනා සංගමයේ සම ලේකම් වශයෙන් මෙම සැසිවාරයේ දී නිතරගයෙන් පත් වූහ. (ආචාර්ය මයිකල් රොබට්ස්, "ලාං. ජා. සං ලේඛන" 2 කාණ්ඩය, පිටු 1457 සිට 1498)

★ නිදහස් ව්‍යාපාරයේ පුරෝගාමීව ක්‍රියා කළ තවත් කතෝලිකයන් දෙදෙනෙකු සැටියට ඊ. ජේ. සමරවික්‍රම මහතා සහ එච්. ඒ. පී සන්ද්‍රසාගර මහතා ද හඳුන්වාදිය හැකිය. මෙම උත්තමයින් දෙදෙනාගේ විශිෂ්ඨ සේවාවන් පිළිබඳව ශ්‍රීමත් එඩ්වින් විජේරත්න මහතා (දියවඩන නිලමේ තනතුර දැරූ නිරංජන් විජේරත්න මහතාගේ සීයා) ලංකා ජාතික සංගමයේ 22 වන සැසිවාරයේ දී කළ කථාවේ සඳහන් වී තිබේ. (ආචාර්ය මයිකල් රොබට්ස්, "ලං, ජා. සං ලේඛන" 2 කාණ්ඩය, 138 පිටුව).

★ ක්‍රි.ව. 1991 මුළු ලංකාවම නියෝජනය කිරීම සඳහා රාජ්‍ය සභාවට තරග කළ මාකස් ප්‍රනාන්දු මහතා ද කතෝලිකයෙකි.

ජාතික නිදහස් අරගලය වෙනුවෙන් සිංහල කිතුනුවන්ගේ සහභාගිත්වයේ ද විශේෂත්වයක් ඇත. එනම්, සිංහල බෞද්ධයන් කැරැළිකරුවන් ලෙස බ්‍රිතාන්‍ය පාලකයන් හංවඩු ගසා තිබුණු යුගයකදී නිදහස ලබා ගැනීම වෙනුවෙන් දියත් කළ අරගලය ජාතික අරගලයක් ලෙස පාලකයන්ට පවා පිළිගන්නට සිදුවූයේ සිංහල කිතුනුවන්ගේ සහභාගිත්වය නිසාය. කිතුනුවන්ගේ සහභාගිත්වය හේතුවෙන් ලැබූ ශක්තිය නොතිබුණා නම්, මෙම අරගලය ලත් සාර්ථක ප්‍රතිඵල කිසිසේත් නෙලා ගන්නට හැකිවන්නේ නැත. ("Reminiscene of the Riots of 1915", 19 පිටුව).

### ජාතික ධජය

රට ජාතිය වෙනුවෙන් ඊ. ඩබ්ලිව් පෙරේරා මහතා තුළ තිබූ ඉමහත් ආදරය සහ කැක්කුම හේතුවෙන් ජාතිකත්වය පිළිබඳ සියලු කරුණු ගැන විශේෂ අවධානයක් ඔහු විසින් යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස 1908 දී එංගලන්තයේ චෙල්සි රෝහලේ තිබී ලාංකීය ධජ තුනක් ඔහු විසින් සොයා ගන්නා ලදි. ඉන් එකක් ලංකාවේ අන්තිම රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමන්ගේ රාජකීය ධජය විය. දකුණතින් කඩුවක් ඔසවා සිටින සිංහරූපය ඇති මෙම ධජයේ අනුරුවක් ඔහු නිර්මාණය කළේය. ඉන් පසුව, ඩී. ආර්. විජයවර්ධන මහතාගේ ඉල්ලීම අනුව එංගලන්තයේ සමාගමක් විසින් එය වර්ණවත් කරන ලදි. ඊ. ඩබ්ලිව්. පෙරේරා මහතා විසින් සොයාගත් මෙම සිංහ ධජය ජාතික ධජය ලෙස පිළිගෙන , එය 1948 පෙබරවාරි 4 දින නිදහස් උත්සවයේදි ගාම්භිර ලෙස ඔසවන ලදි. ("E.W. Perera .... portrait of a true patriot", පිටු 95 සහ 96 )

### සමාජ නීති ප්‍රඥප්තිය

අප රටේ ගැමි ජනතාවගේ සහ කම්කරු ජනතාවගේ ආර්ථිකය සංවිධානය කොට දියුණුකර ඔවුනගේ ජීවිත මට්ටම උසස් කිරීම සඳහා ද, කම්කරු ජනපද ඇති කිරීම සඳහා ද, ලංකා ජාතික සංගමයේ ප්‍රතිපත්ති යෝජනා මාලාවක් ඇති කරන ලෙස කතෝලික නීතිඥ ජෝසප් ඒ. එල්. කුරේ මහතා යෝජනා කළේය. මෙම සමාජ නීති ප්‍රඥප්තිය ඔහු විසින් යෝජනා කරන ලද්දේ දුම්මලදෙණියේ "ස්වරාජ්පුර" භූමියෙහි පැවැත්වුණු ලංකා ජාතික සංගමයේ 23 වන සැසිවාරයේ දීය. (ආචාර්ය මයිකල් රොබට්ස්, "ලං. ජා. සං. ලේඛන", 2 වන කාණ්ඩය, පිටු 1424 සහ 1449).

### කම්කරු අයිතිය

★ කම්කරු අයිතිය සඳහා සටන් කළේ වාමාංශික පාක්ෂිකයන් පමණක් ය යනු බොහෝ අයගේ මතය වුවද සත්‍යය මෙය නොවේ. කතෝලික "සමාජ සාම" ව්‍යාපාරය තුළින් ද මේ සඳහා විශාල සටනක් ගෙන ගිය බව නොරහසකි. එච්. ඊ. පී. ද මෙල්, ජී. සී. එස්. (ශ්‍රීමත් ක්ලෝඩ්) කොරයා, දොස්තර සී. ජේ. සි. ද සිල්වා, නීතිඥ ජෝසප් ඒ. එල්. කුරේ වැනි ක්‍රිස්තු භක්තිකයන් ද කම්කරු ශුභසිද්ධිය සඳහා පුරෝගාමීව ක්‍රියා කළ පිරිසට අයත් වෙති. අවම වැටුප් ආඥා පනත ඔවුන් ගෙන ගිය ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් වන්නේ ය.

★ ලංකාවේ සියලු කම්කරුවන්ගේ ද, සාප්පු සේවකයන්ගේ ද, ලිපිකරුවන්ගේ ද ශුභසිද්ධිය සඳහා වන අර්ථසාධක අරමුදල පිහිටුවන ලෙස යෝජනා කරන ලද්දේ කිතුනු බැතිමතෙකු වන එච්. ඊ. පී. ද මෙල් මහතාණන් විසිනි. එවකට තලවාකැලේ පාර්ලිමේන්තු මන්ත්‍රීව සිටි එතුමා මෙම යෝජනාව 1953 නොවැම්බර් මස 25 වන දින පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කළේය - (හැන්සාඩ් වාර්තාව, 16 වන කලාපය, 25. 11. 1953). මෙම යෝජනාව සභා සම්මත වී 1958 සිට ක්‍රියාත්මක විය. රජයෙන් මෙම කාර්යය ඉටුවන්නටත් පෙර තමාගේම වතු සහ කර්මාන්තශාලා කම්කරුවන් සඳහා 1947 දීම අර්ථසාධක අරමුදලක් ආරම්භ කිරීමේ ගෞරවය එතුමන්ට හිමිවේ.

★ ලංකා ජාතික සංගමයේ ආරම්භක සාමාජිකයකු වූ ද මෙල් මහතා 1955 දී කම්කරුවන් සඳහා පළමුවරට සමූපකාර නිවාස ක්‍රමයක් ද ආරම්භ කළේය.

★ ලංකාවේ සියලු කර්මාන්ත සහ වෙළෙඳ ව්‍යාපාර ලාංකිකයන් අතට පත් කළ යුතු බවට 1953 අගෝස්තු 28 වන දින එඩිතරව අදහස් ප්‍රකාශ කිරීමේ ගෞරවය ද එතුමන්ට හිමිවන්නේ ය. (හැන්සාඩ් වාර්තාව, 15 වන කලාපය, 28/08/1953).

### කලා සහ සාහිත්‍ය සේවාව

★ එවකට ලක්දිව පාලනය කළ ඕලන්ද ජාතිකයන් විසින් දැඩි පීඩාවට පත් කරන ලද කතෝලික ජනතාව රැක බලා ගැනීම සඳහා ක්‍රි.ව. 1687 දී ඉන්දියාවෙන් මෙහි පැමිනි භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමන් සහ එතුමන් විසින් පසු කලක ඉන්දියාවෙන් ගෙන්වාගත් ගරු ජාකොමෙ ගොන්සාල්වෙස් පියතුමන් දෙනම ගෙන් දේශීය සංස්කෘතියට මෙන්ම සාහිත්‍යයට ද අති විශාල සේවයක් ඉටු වී ඇත. හෙළ කිතුනු සාහිත්‍යයේ පියා වන ගරු ජාකොමෙ ගොන්සාල්වෙස් පියතුමා හෙළ බස රැස මැනවින් උගත් බහුශ්‍රැත පඬිවරයෙකි. එතුමන් අතින් හෙළ බසින් ග්‍රන්ථ 22 ක් ද දමිළ බසින් ග්‍රන්ථ ස්වල්පයක් ද ලියැවී ඇත. එමෙන්ම සිංහල නාට්‍ය කලාව හා සංගීතය ද මෙරටට හඳුන්වාදීමේ පුරෝගාමිත්වය හිමිවන්නේ එතුමන්ටය. (මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් ද මෙම සත්‍යය ප්‍රකාශ කර තිබේ.

★ ගරු ජාකොමෙ ගොන්සාල්වෙස් පියතුමා විසින් රචනා කරන ලද වන්දනා ගීතිකා, නාඩගම් ගීත මෙන්ම එතුමා ඉදිරිපත් කළ රාග තාල අප දේශීය සංගීතයේ තොටිල්ල විය. ඒ කාලයෙන් ආරම්භ වූ මෙම හෙළ කලා සහ සාහිත්‍ය සේවා අද දක්වාම ඉටුවන බවත් කතෝලික සභාව වැඩියක්ම දේශීයකරණයට නැඹුරු වී ඇති බවත් සක්සුදක් සේ පැහැදිලි වනුයේ,

ගරු මර්සලින් ජයකොඩි පියතුමන්, අති උතුම් එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමි, මාහිමි ඩබ්ලිව්. එල්. ඒ. දොන්. පීටර් පියතුමන්, ගරු ඩී. ජේ. ඇන්තනි පියතුමන්, ගරු මෝසස් පෙරේරා පියතුමන්, ගරු මොල්ලිගොඩ මෝසෙස් පෙරේරා පියතුමන්, ගරු එස්. ජී. පෙරේරා පියතුමන්. ජෝන් ද සිල්වා, ජේ. කේ. එස්. පෙරේරා, හියුබත් දිසානායක, හියුගෝ ප්‍රනාන්දු, සී. ටී. ප්‍රනාන්දු, ක්ලැරන්ස් විජයවර්ධන, චන්ද්‍රලේඛා සහ රූකාන්ත ගුණතිලක, ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්, සුනිල් සාන්ත, අයිවො ඩෙනිස්, එඩී ජයමාන්න, බී. ඒ. ඩබ්ලිව් ජයමාන්න, රුක්මනි දේවි, නෙවිල් ප්‍රනාන්දු, ස්ටැන්ලි පීරිස්, විජය කුමාරතුංග, රවින්ද්‍ර රන්දෙණිය, නිමල් මෙන්ඩිස්, ලතා වල්පොල, ඇන්ජලින් ගුණතිලක වැනි ඉතිහාසඥයින්, ගත්කරුවන්, කලාකරුවන්ගේ සේවාව විග්‍රහකොට බලන විටයි.

★ අප රටේ අද පවතින පැරැණිතම සිංහල සඟරාව සහ පැරැණිතම සිංහල පුවත්පත වීමේ මහිමය හිමි වී ඇත්තේ "භක්ති ප්‍රබෝධනය" (ආරම්භය 1801) සහ "ඥානාර්ථ ප්‍රදීපය" (ආරම්භය 1866) වෙතයි. එසේම හෙළ බසින් පළ කරන ලද පළමු විද්‍යා ග්‍රන්ථය වන "ස්වභාවික සිද්ධි විද්‍යාව", 1932 දී කරන ලද්දේ ගරු එෆ්. ඊ. ඔබේරට් නමැති ප්‍රංශ ජාතික කතෝලික පියතුමන් විසිනි.

(ඉහත සඳහන් කරුණු බොහෝමයක්, අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් ලියූ "ශ්‍රී ලංකා මාතාව හා කතෝලික සසුන" ප්‍රකාශනයෙන් උපුටා ගෙන ඇති බව ස්තූති පූර්වකව දන්වා සිටිති. )

★ අද කතෝලික ජනතාව ශ්‍රී ලංකා ජාතික ක්‍රියාදාමයට කොතෙක් යාවී පවතින්නේ ද යැයි කිවහොත් ප්‍රධාන වශයෙන් තම ජනවන්දනා කටයුතු සිදු කරන්නේ සිංහල හා දෙමළ භාෂාවලිනි. 1965 ට පෙර කතෝලිකයන් දිව්‍ය පූජාව පැවැත්වූයේ ලතින් භාෂාවෙනි. නමුත් 1962 - 1965 කාලය තුළ පවත්වන ලද දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් පසුව, දිව්‍ය යාගික යාච්ඤාවන් සහ අනිකුත් සියළුම යාච්ඤාවන් ජාතික භාෂාවන් වලට පරිවර්තනය කරන ලදි. දිව්‍ය පූජාව සහ අනිකුත් දේව මෙහෙයයන් සියල්ලම සිංහල සහ දමිළ භාෂාවෙන් සිදුකරන බව කතෝලික සහ අනිකුත් ක්‍රිස්තියානි බැතිමතුන්ට සාඩම්බරයෙන් ප්‍රකාශ කළ හැකි වුවද එවැන්නක් ගැන කිතුනු නොවන ආගම් ලබ්ධීන්ට ප්‍රකාශ කළ නොහැකිය.

ලාංකිකයන් අතර ඉතාමත් ජනප්‍රිය ගීතයක් වන "දන්නෝ බුදුන්ගේ" ගීතයේ පද මාලාව කිතුනු බැතිමතෙකු වූ ජෝන් ද සිල්වා මහතා විසින් ලියන ලදි.

★ 1948 දී අප රට නිදහස ලබන විට අපට ජාතික ගීයක් නොතිබිණි. ආනන්ද සමරකෝන් මහතා විසින් තනන ලද "නමෝ නමෝ මාතා" ගීතය ලක් දෙරණේ ජාතික ගීතය ලෙස 1950 දී පාර්ලිමේන්තුව විසින් සම්මත කරගැනීමට ප්‍රධාන හේතුව වූයේ ශ්‍රී ලංකාවට නිදහස ලබාදීම වෙනුවෙන් පැවැත්වුණු විශේෂ උලෙළෙහිදී ගරු මර්සලින් ජයකොඩි පියතුමා විසින් පුහුණු කරන ලද මියුසියස් බාලිකා විදුහලේ ගායනා කණ්ඩායම මෙම ගීතය අති රමණීය ලෙස ගායනා කිරීම බව එවකට සිටි අගමැති ගරු ඩී. එස්. සේනානායක මහතා ඇතුළු බොහෝ දේශප්‍රේමී සාහිත්‍ය කලාකරුවන්, දේශපාලනඥයන් සහ විද්වතුන් පවසා ඇත.

★ ස්වර්ගස්ථ වූ ගරු මර්සලින් ජයකොඩි පියතුමා ගෙන් සිංහල කලාවට ඉටු වූ අනුපමේය සේවය මෙන්ම ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා ලබා දෙන දායකත්වය සැම දෙනාම ස්තූති පූර්වකව හොඳින් හඳුනාගෙන ඇති කරුණකි. එසේ වුවද අභාවප්‍රාප්ත විශාරද සුනිල් සාන්තයන් අමතක වී තිබීම කණගාටුදායකය. විශාරද සුනිල් සාන්තයන් හට ගෞරව කිරීම පිණිස දෙහියගාත කුඩා මඩු සුසාන භූමියේ ඉදිකරන ලද ස්මාරකය 2005 අගෝස්තු 27 වන දින කොළඹ අගරදගුරු අති

15 පිටුවට »



## රැජින

තරු කිරුළෙන් සඳ පතුලෙන් සුසැදි අපේ මව් රජිණි
සඳු සේලෙන් හිස් වැසුමෙන් සැරසුණ ඒ අග රජිණි
හිස් පතුලෙන් කටු අකුලෙන් මතුවුණ දෙව් දූතු රජිණි
සපු සිරසෙන් මැඩැගනිමින් තෙද පෙන්වූ විරු රජිණි

ජපමාලෙන් සුරලොව යන මග පෙන්වූ සුර රජිණි
දුක් සෝකෙන් මිදෙනා සැටි ලොව දැක්වූ සුව රජිණි
ලොව පාපෙන් මුදවන්නට පුතු බිහිකර දුන් රජිණි
සුර ලෝකෙන් බට දෙව් දූතු පිරිවරන් ඇති රජිණි

පවු නිදොසින් පිළිසිඳගත් ලොව එක සිරිලිය රජිණි
යුද බීතෙන් මුළු සිරිලක ගලවා ගත් සුර රජිණි
නෙකවිලසින් තැන තැන දිස්වුණ මනරම් මොක් රජිණි
හිස මුදුනින් දෝත නගා වැඳගමු මරි මව් රජිණි

**ලයනල් වර්ණකුල**
දළුගම

## නිදහස් පැතුම

නිදහස් හැඟුම් පතුරා ගෙන දී සුවඳ
නිදහස් කරට හිමි කරුවන් අප නොවෙද
නිදහස් කර දෙමින් ලක් මැණිට නිබඳ
නිදහස් දැයක සුරු විරුවන් වෙමු සබඳ

**ඩබ්. ඩී. මැටිල්ඩා අධිකාරම්**

## වේ තුති වේ

ගෙවුනි වසර එකසිය පනහක් අදට
වග මීසමේ පිපි නර්බෝනා කුසුමයට
සැමදා සුව දුන්නා අප සැම අසිරි කොට
සෙබස්තියම් මුනිඳුනි තුති වේ ඔබට

ඉරිදා සවස සීනුව ඇහෙනා කලට
ගමේ කතෝලික සැම එයි ඔබ වෙතට
ඔබ වැනි මුනිවරයකු අප හට දුන් පිනට
තුති වේ දෙව් පියාණනි තුති වේ ඔබට

මියගිය මුතුන් මිත්තන්ගේ ශක්තියට
ගොඩ නැගුනාවූ ඒ අප මහ පල්ලියට
අප හට හැකි විලස අප රැක ගනිමි එය
තුති මල් මිටක් දෙමි මිය ගිය ඔබ සැමට

**රේණුකා රූපසිංහ**
මාවල්ගම

## ගංවතුර

නියං රකුසාට එරෙහිව කළ යාදිනි රට පුරා
වැහි වලාහක කළුවලාවන් පාවුනා අස්කුස පුරා
නිසි වෙලාවට වැසි ලැබේවා පැතුම් පොදි ඉටුවෙන තුරා
බලන් හිටියා පැතුම ඉටුවිය වැස්ස වැස්සැයි ගම පුරා

පැව්වත් බැහැ වැස්සටත් රොස්පරොස් අහසට ගොරවලා
ටිකින් ටික මද නොමඳ මහවැහි වැව් පොකුණු දෙගොඩම තලා
සිව් මහා ගං උතුරලා මුළු රටම ගං මෝයක් වෙලා

කලාවැව මහකන්දරා වැව තිසාවැව තෝපා වැව
ගිරිතලේ මින්නේරියේ වැව වාන්දා කන්තලෙ වැව
නියගයට මොන බියද හතරත දොරෙ ගලනව හැම වැව
මනා ජල කළමනාකරණේ ඇතොත් ඇතිවෙයි සවිබව

කෙතේ නොබසින නිසා ජල කඳ ගොයම් පළ ටික කුණුවෙලා
එසේ පස්ටික ගොහුරු මඩවී හේනෙ එළවළු මැළවිලා
සමහරක් බැමි කැඩී යාමෙන් නිවෙස් සම්පත් නැතිවෙලා
අසිරි අරගෙන වෙස්වලාගෙන දිවිනැගුම ඇත පැමිණිලා

**ජෝර්ජ් අයිවන් රෙක්සි**
අනුරාධපුරය

## ඔබ නම සිරිලක

## දිලෙයි සදා

සපැමිණ අප වෙත පෙම්පාලා
අමදෙව් දහමින් අප පුරවාලු
ජුසේවාස් අප මුනිඳු පියේ
ඔබ නම සිරිලක දිලෙයි සදා//

හිස් පතුලෙන් ඔබ පියනගලා
දන සැමවෙත දෙව් වදන දෙසා
විස්වාසයෙ තිර දල්වාලු
දිදුලන සිළුමිණ ඔබයි පියේ//
සපැමිණ අප වෙත පෙම් පාලා..........

බොහොදුක් පීඩා ඉවස දරා
කිතුමග අපහට එළි කරලා
රැළ එතුමන් වෙත පෙළ ගැස්වූ
සිරිලක නියමුව ඔබයි පියේ//
සපැමිණ අප වෙත පෙම්පාලා......

රහසින් සැඟවී පූපකඩා
නියගය නිමකොට වැසිවස්වා
හෙළදිව දම්කෙත අස්වැද්දූ
දහම් දූතය ඔබයි පියේ//
සපැමිණ අප වෙත පෙම්පාලා......

**කොල්වින් ඒ. ප්‍රනාන්දු**
කටුනේරිය

## සිනහවක ගැඹුර

සිනාසිය හැකි එකම සත්ත්වයා මිනිසාය......!
මම නුඹේ සිනහව
රැගෙන ආවෙමි සොහොයුරේ
නුඹෙන් සමුගෙන එන ගමන්...!
මොනාලිසා මෙන් ගුප්ත නොවන එහි
පැහැදිලි යමක් දුටුවෙන්
සුරැක ගන්නට සිතුනි තබා එය
මහද පූජාසනේ........!

සෙනෙහසක්, ලෙන්ගතු බවක්
ගැඹුරට පැතිර ගිය දයාවක්
වරදවා වටහා නොගන්නා බැල්මක්
අගැයුමක් සේ ම පැසසුමක්
දකින්නට ලැබීමෙහි නොවක් සතුටක්......
සියල්ලම කැටිකොට සැදුන එය
ඇත්තට ම දිව ඔසුවක්.....
වැටි වැටී නැගිටිමින් මා යන ගමනට
ශක්තියක් සේ ම ආශිර්වාදයක්...!

**ගරු මේරි මර්සි නෙත්සිංහ පැවිදි සොයුරිය**
දේව සංරක්ෂණයේ දියණියෝ - පළඟතුරේ

## රිසානා නංගෝ

ජීවිතේ වසන්ත සිහිනය නුදුටු ඔබ
පවුලේ බර දැක දැක සුසුම්..... හලන ඔබ
රාමසාන් සඳ බැලුවා කඳුළු බරින්......
රිසානා නංගෝ

දිළිඳු බවට සිතුවිලි ගලා ආවෙ
උපන් දිනේ වෙනස් කළා
අරාබියෙ වැඩට ගියෙ සිනාබරින්......
රිසානා නංගෝ

දරුවෙක් දුනි ඔබෙ දෝතට
බලා ගන්න....... අණක් ලැබුණි
හදවත ඔබෙ ගොළුවූවා
රිසානා නංගෝ

දංගෙඩියට හිස තැබුවා
හිස කඳෙන් වෙන්ව ගියා
වැලිකතරේ ලේ කඳුළු ගලා ගියා
රාමසාන් සඳ කළු වලාවෙන් වැසී ගියා
රිසානා නංගෝ

**ආර්. ජෝශප් ප්‍රිය**
කොටිකාවත්ත

## දැදුරු නදී උතුරා



දැදුරු නදී දිය උතුරා
වියරුව එන මොහොතේ
ගිනි ගත්තා ළය චිතකය සේ
රුදුරු වෙසින් හඬ පතුරා
කෙත් වනසන මොහොතේ
පැතුම් නිවහනයි පහල ගියේ

**පී. එඩ්වඩ් පීරිස්**
හෙන්ගමුව

## අවදි කළ ගුරු මවුනි !

දස මසක් කුස දරා
මෙළොවට එළිය කළ
මව් මෙන්ම
කුස දරා නොසිටියද
ලේ කිරට නොදුන්නද
ලඟ නැතත් දුකේදී
මැණියෙනි ගුරු
තනන්නට ලොවක් හෙට
පෝෂිතව දැනුම තුළ
කළා වූ ගුණ මහිම
සේ දැනේ මවක් සේ
වියපත්ව දැන් ඇතත්
ගුරු මව්නි එදා දුන්
ගුණ වදන් තව තවත්
හදවතේ මෝදු වෙයි

**අජිත් කමල්ප්‍රිය ජයලත්**
බොල්ලත

## සැම නපුරෙන් මුදා

කොඩිවැල් පිරෙමින් චාමර සලමින්
ආසිරි මල් දසඅත සුවඳින්
ලස්සන විකසිත හැම අත මුතුමෙන්
ඇතුලත හිස්නම් කුමටද මනරන්

රජසැප තනතුරු ඉවත දරා
රැකගත් විශ්වාසය ඔටුනු දරා
දෙවිඳුන් ලවා අද ඔබ සතුට දරා
ගනු මැන මුනිඳුනි සැම සත දෙවිඳු කරා

යකු බල රෝදුක් මුදවා හැමවිට
අමිලවූ සැනසුම අත්කර ලන්නට
කැපවූ මුනිඳුනි රන් අකුරින් ලියනට
නමදිමු බැතියෙන් සුදුවර මුනිඳුට

**ඇග්නස් සියඹලාපිටිය**
කටුවපිටිය

## ආදරයයි, ජීවිතයයි

වචන දෙකකි,
ස්වර හා ව්‍යංජන එක්වී සෑදුනු
අර්ථ දෙකකි
එනමුදු
බැඳී ඇත එය,
කුස තුළ කලලය හා මව් ලෙස
සොයයි සැම දෙන එය
සොයා වින්දොත් එය නිසි ලෙස
සාර්ථකව ලැබෙයි එක් වචනයක්

**සුවනි සමරතුංග**
සීදුව

## මවකගේ පැතුමක්!

පනස් වසරකට පෙර අප ලද තිළිණේ
පිදුවෙමු යළි ඔබටම පඬුරක් ලෙසිනේ
සුරමෑණියේ බාදකපිරි මේ ගමනේ
ඔබෙ පුතු සුරැකි ලෙසම ම'පුතුද රකිනු මැනේ

'එනු මා අනුව' යයි දෙව් පුතු කී බසට
අවනත වෙලා හැම අතහැර එක හිතට
නගුලට අත තබා නොහැරී පසු පසට
යනමග එළියවේවා මගෙ පූජක පුතුට

පනහක් පිරී එළඹෙන පුතු උපන් දිනේ
රණවිරු පියා නැති පාළුව තදින් දැනේ
පස්දෙන එකට බැඳී සුරතේ ඇඟිලි මෙනේ
හැමදා ඉන්න අදවාගෙම ඇතිව සෙනේ

**ඇම්. ඒ. වැන්ඩලන්**
වෙන්නප්පුව

## නෑසුනු ගීතය

උකුළට නාවත් සදා ඔබේ
මා ඔබෙමයි අම්මේ
ගත නැති කෙරුවත් තවමත් මා
හිත ඔබෙ ළඟ අම්මේ.....

අත පය ටික ටික වැඩෙමින් සිටි මා
ඔබෙ කුසයේ අම්මේ
කුරා කුහුඹුවෙකුටත් වරදක් නැති
මම ඇඬුවා අම්මේ - ඔබ එක්කම අම්මේ

කටු කොහොලින් පිරුනද ඔබෙ ලෝකෙට
මා වැඩි ඇයි අම්මේ
රෑ දහවල් පෙරුමන් පිරුවේ මා
ලොවට එන්න අම්මේ - මා ඇඬුවා අම්මේ

ගබ්සාව පිළිබඳ මෙම සංවේදී පද රචනය නැවත සකස්කළේ
**ප්‍රීති ජයසූරිය**
අගරදගුරු පදවි පවුල් සේවාව

## නූපන් දරුවෙනි

මල් කැකුලක් වගේ පිබිදී සැලෙන කුසේ
දරු කැකුලක් පොවා වස විස නසන දෙසේ
මව් කුස තුළින් එළියට ඇද මරනු දිසේ
ඇයි පුත උපදින්න පෙරුමන් පුරනු මෙසේ

නූපන් දරු කළල් උපදින්නට පතනා
මේ ලොව සුර ලොවක් යැයි උන් ඇත සිතනා
මනු ලොව දොර ලඟට විත් කුස තුළ කැඩෙනා
ලේ කැටියන්ගෙ මර හඬ නො ඇසෙද මෙදිනා

මව් කුස ඇතත් එහි දරු පෙම හිස්ව දිසේ
පිළිසිඳ ගන්න නොපතන් එහි මරුව වෙසේ
සකසා සිරි යහන් දරු සෙනෙහසට කුසේ
පුදදෙන තුරු නොඑන් නූපන් දරුනි මෙසේ

දිව එනු එපා උපදින පෝලිම පස්සේ
මිනිසත් ලොවම නැහැවෙයි අදමිටු වැස්සේ
පාපී ගිනි පුපුරු හිස් ඉහලින් දිස්සේ
නූපන් දරුවෙනී උපදිනු සුර දෙස්සේ

**ඩබ්. ඇන්ටනී පීටර් ප්‍රනාන්දු**
කටුනේරිය



## විශ්ව සභාව

බැසිල් ෆොන්සේකා විසිනි

# කිතුනුවන් ඊජිප්තුව හැර නොයන්නේ යයි කොප්ටික් නායක පවසයි



ඊජිප්තු ප්‍රදේශයන් බෙදා එක් කොටසක් කොප්ටික් රාජ්‍ය සේ වෙන් කිරීමට ඉදිරිපත් කරති යෝජනාව කොප්ටින් ඔතොඩොක්ස් නායක තුමා විසින් අවිචාරවත් මෙහෙයුමක් ලෙසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත. 'කොප්ටික් සභාව ඊජිප්තු දේශය තුළ අඛණ්ඩ හා සංගෘහිත වේ.' යැයි කොප්ටික් සභා නායක තුමා අවධාරණය කරයි.

අලුතින් නීතිගත කිරීමේ නියමිත ව්‍යවස්ථාව අනුව විශේෂයෙන් කිතුනුවන්ගේ මූලික අයිතිවාසිකම් හා නිදහස කෙරෙහි බාධා පැමිණිය හැකි නියමයන් පවත්නා නිසාවෙන් සමස්ත කොප්ටික් කිතුනුවන් සංකාවට හා කලකිරීමට පත්ව ඇති බැව් වාර්තා වේ. ව්‍යවස්ථාපිත මාර්ග ඔස්සේ හෝ කොප්ටික් කිතුනුවන් ඊජිප්තුවෙන් පන්නා දැමීමට උත්සහ දැරිය හැකි නමුත්, එම කුට ප්‍රයත්නය කිසිදා සිදු නොවන්නේ යයි ද කොප්ටික් කිතුනු නායක තුමා තිර වදනින් ප්‍රකාශ කරයි. 'නව ව්‍යවස්ථාවක් මගින් ඉස්ලාමීය බල ප්‍රදේශයන් පිහිටුවාලීමට දැඩි ප්‍රයත්නයක් පවතී. ඊට සමගාමීව කිතුනු පීඩනයක් ද ව්‍යාප්ත කිරීම නිරන්තරයෙන් සිදුවෙයි. එහෙත් කිතුනුවන් කිසිසේත්ම බියට පත්විය යුතු නොවේ. සියලු ඊජිප්තු කිතුනුවන් බිය සැකෙන් තොරව සිය ඇදැහිල්ල ප්‍රකාශ කළ යුතු කාලය දැන් උදා වී ඇත. එක් ජන කොට්ඨාශයක් නියෝජනය කරනු ලබන ව්‍යවස්ථාවක් නොව, කිතුනුවන් ඇතුළු අනෙකුත් සියළු ඊජිප්තු ජනතාවන් ද නියෝජනය කරනු ලබන සාධාරණ ව්‍යවස්ථාවක් ලබාදිය යුතු වේ. එම අරමුණ ඔස්සේ සියළු කිතුනුවෝ සහෝදරත්වයෙන් දෙව් සවිය ඔස්සේ ඒකරාශි විය යුත්තාහ. ඔතොඩොක්ස් නායක තුමා එලෙසින් ද අනුශාසනය කරයි.

# ඉන්දියානු ස්ත්‍රී දූෂණයට එරෙහි දැඩි නීති ඕනෑ !

ඉන්දියාවේ මෑතකදී සිදු වූ කල්ලි ස්ත්‍රී දූෂණයෙන් පසුව 23 හැවිරිදි වෛද්‍ය සිසුවියක් මරා දැමීමත් සමග සුළු ජනකොටස් වලට අයත් වනිතාවන් ප්‍රසිද්ධියේ හා අප්‍රසිද්ධියේ දූෂණයට ලක්කිරීමට එරෙහිව එරටේ රජය විසින් වහා දැඩි නීති ක්‍රියාමාර්ග යන් දියත් කළ යුතු යයි 'ජගත් කිතුනු සහෝදරත්වය' විසින් ලෝ වටා ව්‍යාප්ත මහා හඬක් නැගීම ආරම්භ කොට ඇත.

වසර කීපයකට ඉහතදී ගුජරාට හා ඔරිස්සා යන ජනපද වලද සුළුතර ආගමිකයන් කෙරෙහි දැවැන්ත සාපරාධි ක්‍රියාවන් පැවැති සමයන් හිදී ඉස්ලාම් හා කිතුනු සුළුතර ආගමික කාන්තාවන් දූෂණයට හා මරණ හානියට පාත්‍ර කළ ආකාරයත්, එම කිතුනු සංවිධානය විසින් යළි යළිත් පෙන්නා දෙමින් වර්තමානයේදී සිදුවන අමානුෂික ස්ත්‍රී දූෂණයන් නවතා දැමීම සඳහා නීති රීති වහා පැනවීම තවදුරටත් පමා කළ නොයුතු යයි එම සංවිධානය විසින් අවධාරණය කැරේ.

ඉන්දියාවේ යම් යම් ප්‍රදේශයන්හි ජීවත්වන කුළහීන ජනයා ලෙසින් හංවඩු ගසනු ලැබ ඇති සමාජයන් හි ජීවත්වන කාන්තාවන් නිරන්තරයෙන් දූෂණයට භාජනය කැරුණත් ඒ බැව් හෙළි නොකෙරෙන්නේ මරණ බිය නිසාය. එවන් අපරාධයන් හෙළි කරනු ලැබුවත්, බළධාරීන් විසින් කිසිදු නීතිමය ක්‍රියාදාමයක් නොග න්නා බැව් ද ප්‍රකට සත්‍යයකි. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ද ඉන්දියාවේ පවත්නා මෙම අමානුෂික කාන්තා දූෂණ ව්‍යාප්තිය සාකච්ඡාවට භාජනය කොට ඇත. ඒ අනුවද යෝජනා වී ඇත්තේ, ඉන්දියාවේ පවත්නා වනිතා දූෂණයන් වළකාලීම සඳහා දැඩි නීතිරීති එරට විසින් වහා ක්‍රියාත්මක කළ යුතු බවයි.

ඉන්දියාවේ පවත්නා මෙම ස්ත්‍රී දූෂණ රැල්ල කෙරෙහි එරටේ රජය විසින් දක්වනු ලබන ඇල්මැරුණු ප්‍රතිචාරය බෙහෙවින් හුවා දැක්වෙන සිද්ධියක් වර්ෂ 2008 ඔක්තෝබර් මස 24 වෙනිදා සිදුවිය. ඒ දින හින්දු ත්‍රස්ත කණ්ඩායමක් විසින් කතෝලික පැවිදි සොයුරියන් පැහැරගෙන ගොස්. ඈ මහ මගදී නිර්වස්ත්‍ර කොට කල්ලි ගැසී දූෂණය කරනු ලැබුවේ ඇතැම් පොලිස් නිළධාරින් ද බලා සිටියදීය. ඈ විසින් ලබාදී ඇති සත්‍ය තොරතුරු තිබියදී අදවන තුරුත් කිසිවකු හෝ නීතියේ රැහැනට නතුකොටගෙන නොමැත.

# කාදිනල් හිමි හොං කොං දේශයට ඡන්ද බලය ඉල්ලයි

"නව තවත් කල් යල් නොබලා හොං කොං දේශයට සර්ව ජන ඡන්ද බලය ලබා දිය යුතුය. එමෙන්මැ රටේ පවත්නා ආර්ථික හා සංස්කෘතික බිඳ වැටීම හමුවේ පවුල කේන්ද්‍රකොටගත් සමාජ ප්‍රවර්ධනයක් ඇති කළ යුතුය. එසේ නොකළහොත් ප්‍රජනනය පවා එන්ඩ එන්ඩමැ පහළ වැටී ගොස් ජනගහන වර්ධනයේ ඌණතාවය නිසාවෙන් හොං කොං දේශයේ පැවැත්මද අභියෝගයට පාත්‍ර වනු ඇත." එලෙසින් ප්‍රකාශකරනු ලැබුවේ හොං කොං හි කාදිනල් කාර්ඩ් ජෝන් තොං හිමිපාණෝය.

හොං කොං දේශය බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් ලෙසින් පැවැති සමයේදී කිසිදු ආකාරයේ නිදහස් පාලනයක් කරා එරට ගෙනගියේ නැත. වර්ෂ 1997 දී එරට චීනයේ අණසකට යටත් වීමෙන් පසුවද ස්වාධීන දේශපාලන පැවැත්මක් කරා යාමට ඔවුන්ට අවස්ථාව ලබා නොදෙන ලදී. චීනය විසින් අදටත් පවසනු ලබන්නේ වර්ෂ 2017 දක්වා හොං කොං හි පවත්නා පාලන තන්ත්‍රය වෙනස් නොකරනා බවයි. වර්තමානයේදී හොං කොං පාර්ලිමේන්තුවේ ඇත්තේ මහජන නියෝජිතයින්ගේ මුළු සංඛ්‍යාවෙන් අඩකි. තවද ප්‍රධාන විධායක වරයාද චීන බලධාරින්ගෙන් සමන්විත කමිටුවක් විසින් පත් කෙරේ. මෙම තත්ත්වය යටතේ කාදිනල් කාර්ඩ් ජෝන් තොං හිමිපාණන් ඇතුළු එම කතෝලික සභාව විසින් ස්වාධීන පාලනයක් කරා ගෙන යන මෙහෙයුම සැමගේ සතුටට පාත්‍රවී ඇත.

කාදිනල් තුමන් විසින් සිය ප්‍රකාශයේ අවධාරණය කරනු ලැබ ඇත්තේ රටේ පවත්නා ආර්ථික බිඳ වැටීම හමුවේ ජනතාවගේ රැකියා නියුක්තිය ද, නිවාස හිගයද අධ්‍යාපනයද, වැඩිහිටි රැකවරණයද දිනෙන් දින උග්‍රතත්වයට පත්වන හෙයින් ඒවාට පිළිතුරු සෙවීමේදී ප්‍රජා සහභාගිත්වය ලබාගත යුතු බවය. පවත්නා එම සමාජ ජීවිත බිඳ වැටීම හේතුකොටගෙන ප්‍රජනනයේද සීග්‍ර බිඳවැටීමක් සිදුව ඇති හෙයින් පවුල් වර්ධනය සඳහාද සැළැසුම් සහගත ක්‍රියාදාමයක් දියත් කළයුතු යයිද එතුමෝ දක්වති.

සභා නායකයන් විසින් දියත් කරති එම ජනතා හඬ කෙරෙහි ඉමහත් ජනප්‍රසාදයක් ද උදාවී තිබේ. ඒ අනුව දෙවිඳුන් තුළ යැපෙන ජනතාවද වර්ධනය වෙමින් පවතී. පසුගිය වසරේදී 3500 කට අධික සංඛ්‍යාවක් අලුතින් සභාව තුළ බෞතිස්මය ලබාගෙන ඇත.

# 2005 සිට සුදොතුම් පිය උලෙළට සහභාගි වූවෝ ලක්ෂ 200 ක්



පසුගිය 2012 වර්ෂයේදී අති උතුම් XVI වැනි බෙනඩික්ට් සුදොතුම් පියා සපැමිණි උලෙළ සඳහා සහභාගි වූ ජන සංඛ්‍යාව 2,351,200 කි. එම සංඛ්‍යාව අතර, හමුවීම් වලදී 4,47,000 දෙනෙක් ද, පෞද්ගලික හමුවීම් වලදී 146,800 දෙනෙක් ද දේව මෙහෙයන් හිදී 501,400 දෙනෙක් ද. තුන්කාල ආරාධනාවන් හී 1,256000 දෙනෙක් ද වශයෙන් ගැනෙන බැව් පසු ගිය සතියේදී ශුද්ධාසන පුවත් මගින් වාර්තා කර තිබිණි.

මෙවන් ඇදහිළි වන්තයන් ප්‍රමාණයක් විසින් සුදොතුම් පියාණන් දැක බලාගනිමින් පිතෘක සෙනෙහස අත්දැක ඇත්තේ වතිකානයේ පැවැති ඒ ඒ හමුවීම් හා සිද්ධීන් තුළදීය. වතිකානයේදී හමුවීම් වලට අතිරේකව පසුගිය වසරේදී එතුමා මැක්සිකෝවට ද කියුබාවට ද ලෙබනනයට ද පැමිණි අවස්ථාවන් හිදී ලක්ෂ සංඛ්‍යාත ජනතාවෝ එතුමා වටා රොක්වූහ. එමෙන්මැ එතුමා ඉතාලිය තුළ, විවිධ ස්ථානවලට ගොස් විශාල ජනකායන් මුණ ගැසුනු බැව් ද එම වාර්තාවේ දැක්වේ. මේ අනුව 2005 වර්ෂයේ සිට පසුගිය 2012 වර්ෂ දක්වා එතුමා හමුවේ ලක්ෂ 200 කට වැඩි දේව ජනතාවක් ඒකරාශි වී ඇදැහිල්ල ප්‍රකාශ කරති බැව් ද එම පුවතින් වාර්තාවේ.

# ස්ත්‍රී පුරුෂ විවාහය වෙනුවෙන් දස ලක්ෂයක් වීථි බසිති

දස ලක්ෂයකට අධික ප්‍රංශ ජනතාවක් ජනවාරි මස 13 වෙනිදා පැරිස් නගරය පුරා වීථි බැස්සේ ජනාධිපති ෆ්‍රැන්කෝයිස් හොලන්දෝ විසින් සමලිංගික විවාහය නීතිගත කිරීමේ ප්‍රයත්නයට එරෙහිවය. බොහෝ මාධ්‍යයන් විසින් ප්‍රකාශ කොට තිබුණේ කිසිදා නොවුවිරු ආකාරයෙන් දස ලක්ෂයකට අධික විරෝධතා කරුවන් සටන්පාඨ කියමින් හා බැනර් ඔසවාලමින් මුළු පැරීසිය පුරා දෙවනත් කළ බවයි.

එම විරෝධතාවය මෙහෙය වූ කමිටුවේ ක්‍රියාකාරිනියක වන වෛද්‍ය කැතරින් වයර්ලින් විසින් පවසනු ලැබුවේ විරෝධකරුවන් කෑ කෝ ගසමින් සැමතැන ගලාගියේ සුනාමියක් ලෙසින් බවයි. එබැවින් ජනාධිපති වරයා විසින් ජනවාරි මස 29 වෙනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත එම පනත අනිවාර්යයෙන් හකුලා ගැන්මට සිදුවනු ඇතැයි විශ්වාස කැරේ.

"ස්ත්‍රිය හා පුරුෂයා අතර ඇතිවන විවාහය පමණක් සැබෑ විවාහය බැවින් ඊට එරෙහි සම ලිංගික විවාහයන් කිසිසේත්ම පිළිගත නොහැකිය යන්න විරෝධතා කරුවන්ගේ ඒකායන මතය හා පිළිග ැන්ම වේ. විරෝධතාවයට සහභාගි වූ සියල්ලෝ විවිධ ආගම් වලට අයත් වූහ. ජනපති ෆ්‍රැන්කෝයිස් වෙත දේශපාලනික සහයෝගය දක්වන්නාවූ මුස්ලිම් ජනතාව පවා ඔහුගේ එම පනතට එරෙහිව වීථි බැස සිටීම විශේෂ සිද්ධියක් සේ හුවා දක්වා තිබුණි. තවද ප්‍රංශයේ විවිධ පළාත් වලින් පැමිණි විරෝධතා කරුවන් අතර විශාල පිරිසක් තරුණ තරුණියෝ වූහ. ඔවුන් විසින් කෑ මොර දෙනු ලැබුවේ සැබෑ විවාහ සංස්කෘතිය විනාශ කිරීම කෙරෙහි නොව ඔවුන්ට රැකියා නිර්මාණය කිරීම කෙරෙහි ජනාධිපති වරයා විසින් වහා ක්‍රියා කළ යුතු බවයි.

## හින්දු දහම වැළඳ නොගතහොත් ජලය නොලැබේ

ඉන්දියාවේ මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ පල්ජහාර් නම් නගරයේ ගෝත්‍රික කිතුනුවෝ 50,000 කට අධික සංඛ්‍යාවක් ජීවත් වෙති. ඔවුන් වෙත විවිධාකාර හිංසා පීඩාවන් පමුණු වනු ලබන අතර නත්තල් සමයේදී ඔවුන් වෙත තර්ජනය කර ඇත්තේ හින්දු දහම වහා වැලඳ නොගතහොත් ඔවුන්ට පානීය ජලය හා පිසීම සඳහා දර ලබා නොදෙන බවයි.

කිසිදු කිතුනුවෙක් විසින් මෙම තර්ජනයට ප්‍රතිචාරයන් නොදක්වා ඇති හෙයින් පසුගිය දෙසැම්බර් මස 30 වෙනිදා සන්ධ්‍යා කාලයේ 400 ක් පමණ හින්දු ත්‍රස්ත කණ්ඩායමක් ප්‍රදේශයේ කිතුනු දෙව්මැඳුරකට ගල් පහර එල්ල කරමින් අවට ජීවත් වූ කිතුනු වැසියන්ට බොහෝවෙලා පහර දුන්හ. දේවස්ථානය ඇතුලේ තුබූ පූජ්‍ය බඩු බාහිරාදිය විනාශ කොට තිබුණි. පහරදීමෙන් 25 කට වැඩි කිතුනුවෝ තුවාල ලදහ. ප්‍රතිකාර ලබා ගැන්ම සඳහා ඈතින් පිහිටි රෝහලක් කරා ඔවුන් ගෙනයාමද කඩි මුඩියේ නොකෙරුණි. වසර ආරම්භයේදීම ගෝත්‍රික කිතුනුවන්ට පහරදීමෙන් වසර පුරා මෙවැනි සිද්ධීන් වර්ධනය වීමේ ප්‍රවනතාවයක් උදාවී ඇති බැව් ප්‍රදේශයේ ගිහි කතෝලික සංවිධානයන් විසින් ප්‍රකාශ කොට ඇත.

## සිරියානුවෝ බඩගින්නෙන් මැරෙතැයි රදගුරු හිමි වැළපෙයි

දවස්පතා සිරියානුවෝ සිය දහස් ගණන් යුද්ධයෙන් පමණක් නොව බඩගින්නෙන්ද මැරී වැටෙති. එම බියකරු යථාර්ථය ජැකේස් බෙච්තාන් හිනිදෝ රදගුරු තුමෝ තමන් වෙසෙන ජසීසා ප්‍රදේශයේද දිනපතා ඇස් පනා පිට අත් දකිති. රටපුරා ආර්ථික නිෂ්පාදනයන් බිඳ වැටී ඇත. පවතින්නාවූ අල්ප කෘෂිකර්ම නිෂ්පාදනයන් පවා ප්‍රවාහනය කිරීමට නොහැකිවී ඇත්තේ සියළු ගමන් මාර්ගයන් අවහිරතාවයන්ට ලක් කර ඇති නිසාය.

සඟවා ගනු ලැබ ඇති ආහාරවල මිල අධිකවී ඇත. එම අත්‍යවශ්‍ය ආහාර මිලදී ගැනුමට බොහෝ දෙනාට අතේ සතේ නැත. ආහාරපානාදිය සොරා ගැනීමද පවත්නා හෙයින් ඔවුනොවුන් අතර ආහාර සඳහා ගැටීම් ද පවතී. තවද ඇතැම් අමානුෂික වෙළෙන්දෝ සඟවා තබාගෙන ඇති ආහාර ද්‍රව්‍යයන් එහි පැමිණෙන තුර්කි ජාතික වෙළඳුන්ට වැඩි මිලට විකුණති. කිසිදා ආර්ථික හෝ සමාජ පාලනයක් නොපවත්නා පරිසරයක් තුළ එවැනි දෑ සිදුවීමෙන් අසරණ ජනතාවෝ සර්වාකාරයෙන්ම පීඩනයට ලක්ව සිටිති.

පවත්නා මෙම විපත්තිදායක තත්ත්වය යටතේ හීන්දෝ අගරදගුරු හිමිපාණෝ සිරියාවේ යථා තත්ත්වය පිළිබඳ තමන්වහන්සේම සාක්ෂි දරමින් අඩුතරමින් පීඩිත සිරියානුවන්ගේ කුසගිනි පිරවීම සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන්ද ආසන්න රටක් වන ඉරාකයේ අගමැති නූරි අල් වලිකිගෙන්ද හදිසි කෑම බීම්ද බෙහෙත් වර්ගද ඉන්ධන තෙල්ද ඉල්ලා සිටිති.

තිරිඟු පිටි ආශ්‍රිත ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය ඉන්ධන ටැංකි, හින්දෝ රදගුරු තුමාගේ ඉල්ලීම පරිදි ඉරාකය විසින් වහා සපයනු ඇතැයි අපේක්ෂිතය. හින්දෝ අගරදගුරු හිමිපාණන් විසින් තවදුරටත් අවධාරණය කරනු ලැබ ඇත්තේ මෙම අමානුෂික යුධ වාතාවරණයෙන් දිනපතා පීඩා විඳින දරුවන්ට අවශ්‍ය කැරෙන කිරි වර්ගයන්ද බෙහෙත්ද ප්‍රතිජීවකයන් ද ආදී දෑ එක්සත් ජාතින්ගේ ආහාර සංවිධානය විසින් වහා එවනු ඇතැයි තමන් වහන්සේ විශ්වාස කරන බවයි. මෙම ශෝචනීය තත්ත්වය යටතේ හින්දෝ අග රදගුරු හිමිපාණන් කිතුනු සහෝදරත්වයේ නාමයෙන් පීඩිත සිරියාන ජනතාව වෙනුවෙන් නිරන්තර යැදුම් අපෙන් ඉල්ලා සිටිති.

සංවාද මණ්ඩපය

# ඉතිහාසය, ජාතික අනන්‍යතාවය සහ අනාගතය

**අප ජීවත්වන සමාජයේ ඉතිහාසයට ඉතාමත්ම ඉහළ අගයක වැදගත්කමක් ලැබෙන්නේ ජාතික අනන්‍යතාවය ඉතිහාසය හා බැඳගැනීමට ඇති ප්‍රවණතාවය නිසාය. එහෙත් එය ඉතිහාසයට මෙන්ම පුරවැසි අනන්‍යතාවයට කරන සාධාරණයක් ද?**

අප සමාජයට මෙන්ම බයිබලයෙන් පිටස්තර සියළු සමාජයනට ඉතිහාසයක් කියා සංකල්පයක් නොවීය. ඉතිහාසය යනු එකිනෙකට සම්බන්ධ සිදුවීම් ජාලයක් යන සංකල්පය එළිදුටුවේ ජුදා ජාතිය තුළිනි. බයිබලයෙන් පිටස්තර ලෝකයේ දක්නට ලැබුණේ ගෝත්‍රයක ජන්මය පිළිබඳ මිථ්‍යාවන්ය. ඒවායේ පරමාර්ථය වූයේ ඉතිහාසයක් කීම නොව ගෝත්‍රයක පැවැත්ම සඳහා ඉතාම අවශ්‍ය වූ ගෝත්‍ර අනන්‍යතාවය දැක්වීමය.

බලවත් ගෝත්‍ර අනන්‍යතාවයක් නොමැතිව සාමාජිකයා ගෝත්‍රයට පක්ෂපාතිව තබාගැනීමටත් ගෝත්‍රයේ නඩත්තුව සහ ආරක්ෂාවට යොදාග ැනීමටවත් නොහැකි බව සියළුම මිනිස් කණ්ඩායම් දැන සිටි දෙයකි. පුද්ගලයා ගෝත්‍රය තමන්ගේ අනන්‍යතාවය කරගත් තරමට ගෝත්‍රය වෙනුවෙන් කැපවනු ඇත. ගෝත්‍ර උත්පත්ති මිත්‍යා කතාන්දරය එම අනන්‍යතාවය පිහිටුවා පුද්ගලයා ගෝත්‍රයට නතුකර ගත්තේ ය. එසේම යම් රජෙකු හෝ පුද්ගලයකු යම්කිසි සිදුවීමක් ලියා තැබුවේ ඉතිහාසයක් කීමට නොව තමන්ගේ නම හෝ සිදුවීම මිනිස් මතකයේ රඳවා තැබීමට හෝ යමක් යමෙකුට අයිතිය යන්න කීමට ආදිය සඳහා ය. සිංහල වංශකතාවක් වන මහාවංසය පවා කතුවරයාම පවසා ඇති පරිදි ලියා ඇත්තේ බෞද්ධයාගේ ශ්‍රද්ධාව වඩවනු පිණිස මිස ඉතිහාසයක් කීමටම නොවේ. එම නිසාම කතුවරයා තම පරමාර්ථයට නොගැලපෙන ඓතිහාසික කරුණු ඉවත දමා අතිශයෝක්තියෙන් සහ මිථ්‍යාවන්ගෙන් බහුල කතාන්දර ඉදිරිපත්කොට ඇත. මෙසේ මහාවංශයෙන් ද ගම්‍ය වන්නේ සමාජයීය අනන්‍යතාවයක් පිහිටුවීම සඳහා ඉතිහාසයක් අවශ්‍ය නොවන බවත් මිත්‍යාවන් පවා යොදාගෙන ඓතිහාසික දත්ත මත සකසාගත් කතාන්දරයක් වඩා උචිත බවත් ය.

වර්තමාන ශිෂ්ටාචාරයේ දී වුවද ගෝත්‍රික අනන්‍යතාවයන් තවමත් තැන තැන පැවතුනත් සමාජයීය අනන්‍යතාවයන් ප්‍රධාන වශයෙන් සැකසෙන්නේ දේශපාලන සීමාවන් අනුවය. අද අනන්‍යතාවයන් නිර්මාණය වන්නේ අතීතයට වඩා වර්තමානයේ ආර්ථික සහ සමාජයීය තත්ත්වයන් මතය. එපමණක් නොව පුද්ගලයකුට පුද්ගලිකානු කරගත හැකි විවිධ අනන්‍යතාවයන් ඇත.

ගෝත්‍රික සහ වැඩවසම් සමාජවල පුද්ගලයාට තමාගේම අනන්‍යතාවයක් නොවීය. පුද්ගලයාගේ අනන්‍යතාවය වූයේ ගෝත්‍රයේ අනන්‍යතාවයමය. එහෙත් වර්තමාන ප්‍රජාතාන්ත්‍රික සමාජයේ පුද්ගලයාට කුල ගෝත්‍ර අනන්‍යතාවයන්ගෙන් නිදහස්ව තමන්ටම සුවිශේෂී අනන්‍යතාවයක් නීතියෙන්ම ලැබෙන අතර පාරම්පරික සහ ගෝත්‍රික අනන්‍යතා බැම්වලින් මිදී තමන්ගේ පෞරුෂය සහ සමාජ ප්‍රතිරූපය තමන් ආශා කරන අනන්‍යතාවයක් ඔස්සේ හැඩගස්වා ගත හැකිය. මෙම නිසාම පාරම්පරික සහ ගෝත්‍රික අනන්‍යතා අද සමාජයට අවශ්‍ය නොවේ. ගැහැනු පිරිමි අනන්‍යතා පවා තමන්ට සිතැඟි ආකාරයට හැඩගස්වා ගත හැකි ලෝකයකි අද ඇත්තේ.

කරුණු මෙසේ තිබියදී ජාතික අනන්‍යතාවය ඉතිහාසය මත පදනම් කරගන්නේ ඇයි යන්න ප්‍රශ්නයකි. එසේ කිරීම ඉතිහාසය අනවශ්‍ය ලෙස දේශපාලනීය කරගැනීමක් වන්නේ ය. එය සමාජානුබන්ධනය වෙනුවට විවිධ වූ පුද්ගල සහ සමාජ සංඝට්ටන වලට හේතුපාදක වන්නකි. සමාජයේ සුළුතරයනට බහුතර ඉතිහාසයට නෑකම් කීමට නොහැකි නම් සිදුවන්නේ දෙවන තුන්වන පන්තිවල පුරවැසියන් වීමය. අසාධාරණකම් වලට ගොදුරු වීමය. එවන් දෝෂයකට ගොදුරු නොවීමට නම් ඉතිහාසය කුමක්දැයි අප නිවැරදිව තේරුම් ගත යුතුය.

ඉතිහාසයට "ඉහත දී එය මෙසේ සිදුවිය" යන අර්ථ විවරණයක් සමහරකු විසින් දෙනු ලැබූවත් අතීතයේ යමක් මෙසේ සිදුවී යැයි කීමට නොහැකිය. කිව හැක්කේ "බොහෝ දුරට මෙසේ සිදුවන්නට ඇත" යන්න පමණකි. ඊට හේතුව කිසිම දිනක යම් සිදුවීමකට හේතුපාදක වූ සියළුම දත්ත අපට නොලැබෙන නිසාය. විද්‍යාඥයකුට පවා කිසිදිනක යම් සිද්ධියකට හේතු වූ සියළුම දත්ත සොයාගත නොහැකිය. එම නිසාය විද්‍යාඥයා තමන්ගේ අධ්‍යයන වලදී දෝෂ සඳහා 5% හෝ 10% ක මායිම් තීරුවක් වෙන් කරන්නේ. අතීතය ගැන විමසීමකදී තත්ත්වය ඉතාමත් අසීරු වන්නේ ඉතිහාසඥයාට අතීතය ගොඩනගා ගැනීමට සිදුවන්නේ ඉතාමත් සීමිත දත්ත ප්‍රමාණයකිනි.

තමන් සතු දත්ත කිහිපයකින් අතීත සිදුවීමක් ගොඩනගාගන්නට ඔහුට ඇති එකම පහසුකම නම් න්‍යායක හෝ දෘෂ්ටිකෝණයක ආධාරයෙන් සාදා ගන්නා අර්ථවිචාරක රාමුවයි. එම නිසාම ඉතිහාසය යනු මූලිකවම දෘෂ්ටිකෝණයකි.

උදාහරණයට රජෙකු විසින් අහස සිඹින ස්මාරකයක් සැදුවේ ඇයි දැයි අසමු. එයට උත්තර එකක් නොව ඒ ඒ පුද්ගලයාගේ දෘෂ්ටිකෝණය අනුව විවිධ උත්තර ලැබෙනු ඇත. කෙනෙකු කුරිරු රජෙකු තමන්ගේ ආත්මාර්ථකාමී වීරත්වයත් ප්‍රෞඪත්වයත් ලෝකයට ප්‍රකාශ කරන්නට අහිංසක මිනිසුන්ගෙන් මරව මරවා වැඩ අරගෙන සදාගත් පාපස්ථම්භයක් ලෙස දකිනු ඇත. තවත් අයෙකු එය ධාර්මික රජෙකුගේ ශ්‍රද්ධාව ප්‍රකාශ කිරීමක් සේ දකිනු ඇත. වෙනත් අයකු එය ජනතාවගේ චිත්ත අන්ධ කර බුද්ධි ආධිපත්තිය පිහිටුවා ගැනීමට යොදාගත් උප්පරවැට්ටියක් ලෙස දැකිය හැකිය.

ඔවුන්ගෙන් කවුරුන් සත්‍යයට ආසන්නද යන්න බොහෝ විට තීරණය කරනු ලබන්නේ බුද්ධිය නොව බලයයි. මෙහි සත්‍යය මනාව ඔප්පුකර පෙන්වන යුගයකි අද. සංනිවේදන තාක්ෂණය මෙතරම් දියුණු යුගයක සත්‍ය තරම් සැඟවුනු දෙයක් තවත් නැත. එය ධනය සහ බලය විසින් ඉතා සූක්ෂම ලෙස වසන් කරනු ලැබේ. බොරුව නැවත නැවත කීමෙන් එය සත්‍යයක් ය යන විශ්වාසය ගොඩනගා ගැනීමට හැකිය. එමෙන්ම බලවතකු ධනවතකු මත තම පැවැත්ම සඳහා යැපෙන්නාට බුද්ධිමය නිදහසක් නැත. ඔහුට තම ස්වාමියා සාධාරණීය කිරීමට අවශ්‍යය.

ඉතිහාසයට සම්බන්ධව හෝ විද්‍යාවේදී හෝ යමක් සත්‍යයක් බවට පත්වන්නේ එය බුද්ධිමතුන් විසින් විචාරා සම්මතයකට පැමිණි විටය. එහෙත් බුද්ධිමතා බුද්ධිමතකු වන්නේ අනාවරණය වූ මෙන්ම නොවූ සියළුම දත්ත දෙස විවාදාත්මක විවෘත මනසකින් බැලීමට හැකි පුළුල් දෘෂ්ටිකෝණයකින් සමන්විත වූ විටය. අවාසනාවකට මෙතරම් දියුණු යුගයක පවා බුද්ධිමතා දේශපාලකයාගේ ධනපතියාගේ සහ සංස්කෘතාධිපතියාගේ ග්‍රහණයෙන් සහ අභිලාෂයන්ගෙන් නිදහස් නැත. සමහර ආගම්වල පවා ආත්ම විවේචනයට සියළු ඉඩ අවුරා විවේචකයා මරා දමන අවස්ථා අද ද දක්නට ලැබේ. මිථ්‍යාවන් නග්නකර අවිද්‍යාවෙන් මිනිසුන් මුදවා ගැනීම වෙනුවට මිථ්‍යාවන්ම වගාකර ජනයාගේ මනස තම අණසකට නතුකර ගැනීමේ ඉතිහාස සහ සංස්කෘතික ව්‍යාපාර බලවත් සමාජ වාතාවරණයක අපි සිටිමු. මොවුන් විසින් සත්‍යය යැයි සම්මත කරන ලද දෙයකට පරස්පර යමක් කීමට ඉඩ නැත.

සත්‍යය ජයග්‍රාහකයාගේ බූදලයකි. අසත්‍යය පරාජිතයාගේ උරුමයකි. ඉතිහාසය පුරාවට දක්නට ලැබෙන්නේ එයයි. එහෙත් සත්‍යය කවදා හෝ එළිදරව් වේ යැයි විශ්වාසයක් මිනිසුන් අතර පවතී. එම විශ්වාසය සත්‍යය ජයගනීවායි කරන ප්‍රාර්ථනාවකි. එහෙත් එයට සාධක ඉතිහාසයේ නැත්තේම නොවේ. එහි ඉතිහාසයේ අති ශ්‍රේෂ්ඨතම සාධකය ක්‍රිස්තියානි ධර්මයයි. ක්‍රිස්තුන් වහන්සේ සමාජ මායිමෙන් බැහැරකොට මරාදමා සත්‍යය ඉතිහාසයේ කුණු බක්කියට විසිකරනු ලැබූවත් එය බලවතුන් කුණු බක්කියට දමා ඉතිහාසය ජයගත්තේ ය.

මෙයින් ගම්‍ය වන මූලික කරුණක් වනුයේ කුණු බක්කියට දමන වටිනාකමක් නැතැයි සලකන සාධකයක් සත්‍යයේ මුල්ගල විය හැකි බවය. ඒ අනුව නියම ඉතිහාසඥයා ඉතිහාසයට සමීප වන්නට නම් ඓතිහාසික සාධක දෙක සුළුතරයේ නැතහොත් මායිමෙන් බැහැර කළ (මායිම් නොකළ) දෘෂ්ටි කෝණයෙන් බැලිය යුතුය. අනුරාධපුරයෙන් හුදකලා කුරුසියක් හමුවූයේ නම් අනුරාධපුර ඓතිහාසික සාධක දෙස එම කුරුසියේ දෘෂ්ටිකෝණයෙන් ද බැලිය යුතුය. එසේ නොකොට අනුරාධපුර යුගයේ යම් තරමකින් හෝ පූර්ණ ඉතිහාසයකට සමීප විය නොහැකිය.

ඉදිරියට

✍ **පී. එම්. ප්‍රනාන්දු**

# අධ්‍යාපන කළමනාකරණය ද පරිපාලනය ද ?

**කළමනාකරණය යන්න සරලව අර්ථ දැක්වුවහොත් කළ යුතු දේ මැනවින් කිරීමයි. ඕනෑම සංවිධානයක හෝ ආයතනයක ඉලක්ක තිබේ. එම ඉලක්ක ඉටු කර ගැනීමට සම්පත් සහ වෙනත් අවශ්‍යතා තිබේ. ඒ අනුව සරල අර්ථ දැක්වීම තවත් පුළුල් කළහොත් සංවිධානයක හෝ ආයතනයක ඉලක්ක ඉටු කර ගැනීමට සම්පත් සැළසුම් කිරීම සංවිධානකරණය මෙහෙයවීම හා පාලනය කිරීමේ ක්‍රියාවලිය ලෙස නිර්වචනය කළ හැකිය.**

අධ්‍යාපන කළමනාකරණයක් ද පරිපාලනයක් ද යන්න විමසා බැලිය යුතුය. කළමනාකරණයේ අවසන් කාර්යය පාලනයයි. එය තවත් පටු කර පරිපාලනය ලෙස ගත හැකිය.

කළමනාකරණය ඉතා පුළුල් ය. එය තුළ පරිපාලනය අන්තර්ගත බව පෙනී යයි. පාසලක් වැනි ආයතනයක කළමනාකරණයක් පවතී. එමෙන්ම විදුහල්පති භූමිකාව තුළ එදිනෙදා පරිපාලනයක් ද පවතී. ආයතන සංග්‍රහය චක්‍ර ලේඛන, අණ පනත් ආදිය නිසා පරිපාලනයට මිස කළමනාකරණයට ඉඩ නැත. එහෙත් සීමිත ඉඩකඩක් තුළ කළ හැකි කළමනාකරණ වැඩ කටයුතු රාශියක් ඇත. ඒ නිසා කළමනාකරණ අවස්ථා තුළ ව්‍යවසායක ක්‍රියාකාරකම් ඇත. ව්‍යවසායකත්වය හුදෙක් ව්‍යාපාර කටයුතුවලට පමණක් අදාළ නොවේ. අවස්ථාවක් තුළ, නව ක්‍රියාකාරකම් හෝ නවෝත්පාදන ක්‍රියාකාරකම් කිරීමයි. ඒවා පාසලක් තුළ හෝ සිදුවිය යුතුය.

පොදු ඉලක්ක ඉටු කිරීමට සම්පත් සැළසුම් කිරීමත් සිදු කළ යුතුය. සැළසුම්කරණය තුළ ඉලක්ක පරමාර්ථ ස්ථාපිත වේ. ඉන් සකස් කරන සැළසුම ක්‍රියාත්මක කිරීම සම්පත් ඒ ඒ අංශවලට බෙදීම, අංශ ඇති කිරීම අංශ තුළ තනතුරු ඇති කිරීම බලතල පැවරීම වගකීම් ස්ථාපිතය වගවීමේ ක්‍රමවේදයන් සකස් කිරීම කළ යුතු වේ. මෙම සමස්ථ ක්‍රියාදාමය සංවිධානකරණයයි. ඉන්පසු ඉලක්කය වෙත මානව සම්පත මෙහෙයවීම කළ යුතුයි. එයට නායකත්වය දීම සංවිධිත සන්නිවේදනය හා සහයකයින් කැමැත්තෙන් ආශාවෙන් වැඩට යොමු කරවා ගැනීම හෙවත් අභිප්‍රේරණයක් සිදුවිය යුතුයි.

සැලසුමට අනුව කටයුතු සිදුවේද යන්න පරික්ෂාවට ලක් කළ යුතුයි. එය කළමනාකරණයේ දී පාලනය ලෙස හැඳින්වේ. ඒ අනුව කළමනාකරණයට අයත් සැළසුම් කිරීම සංවිධාන කරණය මෙහෙයවීම හා පාලනය යන මූලික කළමනාකරණය කාර්යයන් එකිනෙකට බැඳීම පවතිනවා සේම එකිනෙකට රඳා පවතියි.

පාසල් කළමනාකරණය තුළ වැදගත් සංකල්ප රාශියකි. ඒවා අතර මධ්‍යගත කිරීම විමධ්‍යගත කිරීම හා පාලන අවකාශය පමණක් සලකා බැලූ විට පාසලක ප්‍රධාන තීරණ ගැනීමේ බලතල ඉහළ කළමනාකරණය තුළ රඳවා ගැනීම මධ්‍යගතකරණයයි. එමෙන්ම ප්‍රධාන තීරණ ගැනීමේ බලතල පහළ කළමනාකරණ අංශවලට පැවරීම විමධ්‍යගත කිරීමයි. මෙය පාසල් භූමිකාව තුළ විවිධ මට්ටම්වලින් සිදු කෙරෙයි. මෙම දෙ අංශය තුළ වාසි හා සීමාවන් දැකිය හැකි නිසා මෙ දෙඅංශයම සමතුලිත තත්ත්වයකින් පවත්වාගෙන යයි විමධ්‍යගත කිරීමට බාධාකාරිත්ත්ව රාශියක් පවති.

1) අග්‍ර කළමනාකරණයට බලතල රඳවා ගැනීමට දක්වන අධික කැමැත්ත.

2) පහළ කළමනාකරුවන් වගකීම් භාර ගැනීමට දක්වන අකමැත්ත.

3) පහළ කළමනාකරුවන් කෙරෙහි පවතින අවිශ්වාසය

4) පහළ කළමනාකරුවන් තමන්ට වඩා හොඳින් කාර්ය ඉටු කරයි යන බිය.

පාසල් කළමනාකරණය තුළ පවතින තව වැදගත් සංකල්පයක් වන්නේ පාලන අවකාශය, මෙයින් අදහස් කරන්නේ එක් ප්‍රධානියෙකුට සෘජුවම වාර්තාකරණ සහයකයින් ගණන, මෙය පාසලක් වැනි සේවා ආයතනයකට ඉතා වැදගත් ය. කර්මාන්ත ශාලාවක මෙන් නිෂ්පාදන ඒකක ප්‍රමාණය හෝ සෘජුවම ගුණත්ව පරික්ෂා කර කළ හැකි කාර්යයක් නොවේ.

මානව සම්පත සජීවිය, ප්‍රතිචාර දැක්විය හැකි නිෂ්පාදන ඒකක ප්‍රමාණය හෝ සෘජුවම ගුණාත්මකව පරික්ෂා කර කළ හැකි කාර්යයක් නොවේ.

මානව සම්පත සජීවිය, ප්‍රතිචාර දැක්විය හැකිය, පුහුණුව හා පළපුරුද්ද තුළින් ඵලදායිතාවය වැඩි කළ හැකිය. ඒ නිසා පාසලක ඉලක්කය වෙත ගෙන යෑමට මානව සම්පත මූලික වේ. පාලන අවකාශය පටු හා පුළුල් ලෙස වර්ග කළ හැකිය. එක් ප්‍රධානියෙකුට සෘජුවම වාර්තා කරන සහයකින් සාපේක්ෂව ඉහළ අගයක් ගනී නම් එය පුළුල් පාලන අවකාශයයි. සාපේක්ෂව සහයකින් ගණන සාපේක්ෂව අඩු නම් එය පටු පාලන අවකාශයයි.

ඒ අනුව පාසැල්වල අංශ බෙදා පවත්වාගෙන යෑම සිදුවේ. එය තුළ බලතල විමධ්‍යගත කිරීමේ ස්වරූපයක් පවතී. ඉන් අපේක්ෂා කරනුයේ පරිපාලනය පහසු කර ගැනීමක් ද කළමනාකරණය පහසු කර ගැනීමක් ද යන සළකා බැලීම වටී. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විකාශන ක්‍රමවේදය සළකන විට ඉංග්‍රීසි පාලන සමයේ සිටම විවිධ වූ ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රියාවට යොමු විය. ආධාර ලබන පාසල් ආරම්භ කිරීම, සෘජුවම රජය පාසල් ආරම්භ කිරීම නිදහස් අධ්‍යාපන ක්‍රමය යටතේ මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කිරීම, විභාග දෙපාර්තමේන්තුව පිහිටුවීම, ආධාර ලබන පාසල් රජයට පවරා ගැනීම, පෞද්ගලික පාසල්වලට රජය ආධාර දීම නැවත ආරම්භ කිරීම, නැවත ඉංග්‍රීසි මාධ්‍ය විභාග ක්‍රමය ක්‍රියාත්මක කිරීම, මධ්‍යම රජයේ පාලනයට ජාතික පාසල් රඳවාගෙන අනෙකුත් පාසල් ඒ ඒ පළාත් සභාවලට පැවරීම ඒ අතර වේ.

අනෙක් අතට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විවිධ වෙනස්කම් සිදුවිය. කාර්මික විද්‍යාලය, නීති විද්‍යාලය, වෛද්‍ය විද්‍යාලය යනාදියෙන් ආරම්භ වී ජාතික විශ්ව විද්‍යාල රාශියක් රට පුරා ක්‍රියාත්මක වේ. ඒවාට සමගාමී දෙස් විදෙස් උසස් පාඨමාලා ආරම්භය විය. කලක් සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රයම පූර්ණ රාජ්‍ය ඒකාධිකාරයක් විය. වර්තමනයේ එම තත්ත්වය පහව ගොස් රාජ්‍ය පුද්ගලයකින් සම්මිශ්‍රණයකින් අධ්‍යාපන ක්ෂේත්‍ර සමගාමීව ගමන් කරයි.

එංගලන්ත අධ්‍යාපන ආභාෂයට අනුව මෙරට තුළ අධ්‍යාපන පරිපාලනය ක්‍රමවත්ව සිදුවිය. එයට මුල් අවධියේදී හිමිවූයේ පූර්ණ නිදහසකි. ඒවා සියල්ල ක්‍රියාත්මක වූයේ ආගමික පසුබිමක් තුළය.

ඉදිරියට

✍ **රංජිත් ජයනාද වික්‍රමආරච්චි**

# පාරිශුද්ධ වූ කිතුනු විවාහය

**"ප්‍රේමය ලොව හැම තැනම ඇති.... හැම දෙනටම හමුවෙලා ඇති... එනමුදු ප්‍රේමය කිමැයි කියා හඳුනාගත් කිසි කෙනෙකු නැති"**
**(චන්දන ලියනාරච්චි මහත්මා ගයන ගීයක කොටසකි)**

දැනට විවාහ දිවියට ඇතුළු වී තිබෙන සහ වර්තමානයේ කෝඩුකාරයන් ලෙසින් විවාහ දිවියට ඇතුළු වන, එයට පා තබන බහුතරයක් තුළ මෙම ප්‍රේමය සැබැවින්ම පවතින්නේද යන්න විශාල ගැටලුවකි. විටෙක එය ප්‍රහේළිකාවක් මෙන්ම අපගේ ආශ්චර්යටද තුඩු දෙන කරුණකි. අප රටේ පවත්නා සිවිල් නීතියට අනුකූලව විවාහයක් තුළ සිදුවන්නේ වයස අවු. 18 සම්පූර්ණ වූ හෝ ඊට වැඩි ගැහැනු - පිරිමි යන දෙදෙනෙකු තම තමන්ගේ කැමැත්ත හා ආශාව මත වැඩිහිටියන්ගේද ආශිර්වාදය ඇතිව එකට ජීවත් වීමේ අභිලාෂයෙන් නිත්‍යානුකූල ලෙස එක වහලක් යටට පැමිණීමය. එහෙත් කිතුනු විවාහය නොහොත් පවුල් දිවිය ඊට වඩා වෙනස් මුහුණුවරක් ගන්නේ එය නීත්‍යානුකූල බැම්මෙන් නොනැවතී තවත් බොහෝ සේ ඉදිරියට යන බැවිනි. මන්ද කිතුනු අප සැමට මෙම විවාහ දිවිය යනු සක්‍රමේන්තුවකි. දේව ආශිර්වාදය හා වරප්‍රසාද ගලා එන ක්‍රමයකි. එබැවින් කිතුනු ඇසින් බලන කල විවාහය යනු කොන්දේසියක් හෝ කොන්ත්‍රාත්තුවක් හෝ නොව මේවා අභිබවා පෙරට ගිය ගිවිසුමකි.

සැබැවින්ම මෙය ජීවිත ක්‍රමයක් තෝරා ගැනීමකි. එමෙන්ම ඒ ජීවිත ක්‍රමය තුළ අවසානය දක්වාම රැඳෙන්නට පොරොන්දු දීමකි. තවද, සාමාන්‍ය සිවිල් විවාහයක් හා නිත්‍යානුකූල කිතුනු විවාහයක් තුළ සැබෑවටම වෙනසක් හා පැහැදිලි ගැඹුරක් ඇති බව තේරුම් ගත හැක්කේ, එහිදී දෙපාර්ශවය එකිනෙකාට වෙන පොරොන්දු මතය. සිවිල් විවාහයක් සිදුවන්නේ, "........වන මම....... ඔබ මාගේ ස්වාමිපුරුෂයා (භාර්යාව) වශයෙන් අද පටන් පිළිගන්නා බව සාක්ෂිකරුවන් ඉදිරියේදී දිවුරා පොරොන්දු වෙමි" යනුවෙනි. එහෙත් කතෝලික විවාහය මීට වඩා බොහෝ සේ වෙනස් හා ගැඹුරු දෙයක් වන්නේ එය ජීවිත ක්‍රමයකටම ඇතුළු වීමට පොරොන්දු වන බැවිනි. "වාසනාවත් කල්හිද අවාසනාවත් කල්හිද, ලෙඩ දුකේදී හා සුව සැපේදී ද ඔබට විශ්වාසවන්ත වන්නට මම පොරොන්දු වෙමි. මාගේ මුළු ජීවිත කාලය තුළදීම මම ඔබට ප්‍රේම කරමි. මම ඔබට ගෞරව කරමි."

කිතුනු අපගේ ඇදහිල්ලට අනුකූලව ලොව මැවුම්කරුවාණෝ - දෙවි මහෝත්තමයාණන් වහන්සේ විසින්ම, විවාහ දිවියට කැඳවීමක් ඉතාම ගැඹුරු ලෙස ගැහැනු හා පිරිමි යන ස්වභාවයන් දෙක තුළම රචනා කළ සේක. එහෙයින් ශු. ලියවිල්ල පැහැදිලි ලෙස අපට පෙන්වා දෙන පරිදි ආරම්භයේ සිටම ස්ත්‍රිය හා පුරුෂයා දෙවියන් වහන්සේ මවා වදාළේ එකිනෙකා වෙනුවෙනි. තවද දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ශුද්ධවූ අභිප්‍රායට අනුකූලව පළමු මිනිසාව පොළොවේ දූවිල්ලෙන් සාදා නිම කළ පසු ඔහුට අවැසි හා ඔහුට සරිලන සහකාරියක මැවූ සේක. මෙලෙස ආරම්භයේ සිටම දෙවියන් වහන්සේ සහ සම්බන්ධතාවය නිර්මාණය කළ බව ශු. ලියවිල්ල අපට සාක්ෂි දරයි. එලෙසම මෙය විවාහ දිවියේ ආරම්භය ලෙස ගිනිය හැකිවේ. "දෙවිසමිඳාණන් වහන්සේ කතා කොට, මිනිසා තනිව සිටීමට සුදුසු නැත; ඔහුට සුදුසු සහකාරියක මවා දෙන්නෙමි"යි වදාළ සේක. (උත්පත්ති 2:18) තවද "උන්වහන්සේ ඔහුගෙන් ගත් ඉල ඇටයෙන් ස්ත්‍රියක මවා ඔහු වෙත ගෙනා සේක්; මිනිසකු තම පියා ද මව ද අත්හැර සිය භාර්යාවට බැඳෙන්නේ එබැවින්ය. මෙලෙස ඔවුහු එක මාංශයක් වන්නෝය." (උත්පත්ති 2:22, 24) එසේම දෙවියන් වහන්සේගේ අභිප්‍රාය පරිදි උන්වහන්සේ ස්ථාපිත කළ මෙම විවාහ දිවිය මොනම ක්‍රමයකින් හෝ බෙදා වෙන් කරන්නට නොහැකි බව ජේසුස් වහන්සේම ප්‍රකාශ කර තිබේ. "එබැවින් දෙවියන් වහන්සේ එක් කළ අය මනුෂ්‍යයා වෙන් නොකෙරේවා!" වදාළ සේක. (ශු. මාක් 10:9) එලෙසම ශුද්ධාසනීය නීතියට අනුව විවාහය 'පුරුෂයෙකු හා ස්ත්‍රියක අතරේ, ඔවුන්ගේ මුළු ජීවිත කාලය පුරාම පවතින්නාවූ පංගුකාරකමක් වශයෙන් පිහිටුවා ගනු ලබන්නාවූ ද, දෙපාර්ශවයේම යහපත සඳහාත්, මනුෂ්‍ය වර්ග යාගේ වර්ධනය (ප්‍රජනනය)



සහ දරුවන් හදා වඩා ලොවට ඉදිරිපත් කිරීම සඳහාත් එල්ල වී පවතින්නාවූ ද, ප්‍රසාද ස්නාපනය ලැබූවන් අතරේ සිදුවන විවාහ ගිවිසුම, අප ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දේව ප්‍රසාද නිධානයක් බවට උසස් කළ සේක." (සාසන නීති සංග්‍රහය 1055,1) ඒ අනුව අඹු සැමි ප්‍රේමය මිහිපිට දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ සලකුණකි.

එහෙත් වත්මන් ලොවේ පවුල තරම් අර්බුදකාරී තත්ත්වයට පත්ව තිබෙන සමාජ සංස්ථාවක් නොමැති තරම්ය. එදා අතීතයේදී ඉතා බෙහෙවින්ම පූජනීයත්වයේලා සැලකූ මෙම පවුල් දිවිය වර්තමානයේ නොයෙකුත් බාල්දුවීම්, කිසිදු තැකීමක් නොකරන හා ප්‍රමාණවත් සැළකිල්ලක් නොලැබෙන දෙයක් බවට පත්වී ඇත. එබැවින් කිතුනු විවාහයේ පාරිශුද්ධ බව නූතන ලොවේ පෙර ලෙසින්ම ආරක්ෂාවී නැති බව සුපැහැදිලි කරුණකි. වර්තමානයේ විවාහ දිවියට එළඹෙන බහුතරයකගේ අරමුණු මොනවාද යන්න පිරික්සා බැලීමේදී පැහැදිලි වනුයේ විවාහයේ ගැඹුරු, මූලික පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීම වෙනුවට දියඹට නොගොස් තවමත් ගොඩබිමේ රැඳී සිටින සේයාවකි. තවද අද බොහෝ අයගේ විවාහ ජීවිත වෙළඳසැලේ තිබෙන ක්ෂණික නූඩ්ල්ස් ටිකිරි පැකට්ටුවක් හා සමානය.

'ගත්ත ගමන් කැඩුවා (දැක්ක ගමන් යාළු උනා), කඩපු ගමන් හැදුවා (යාළු වුනු ගමන් බැන්දා). හදපු ගමන් කෑවා (බැඳපු ගමන් දික්කසාද වුනා)". අද බොහෝ විවාහ වල උතුම් අභිලාෂයන් ලෙස ඉහළින් පවතින්නේ පිටස්තර රූපශ්‍රීය, තම දෙමව්පියන් හා වැඩිහිටියන් සතුටු කිරීම, තෘප්තිමත් කිරීම, කෙටිකාලීන හැඟීම් සපුරා ගැනීම, තව අයෙකුගේ අභියෝගයක් බාර ගැනීමක් ලෙස (පුළුවන්නම්... දුවව විවාහ කරගෙන පෙන්නපන්) සහ තවත් එක් ප්‍රවනතාවයක් වන්නේ තම දරුවාව කතෝලික පාසලකට ඇතුළු කර ගැනීමය. එහෙයින් කතෝලික නොවන බොහෝ අය ඉක්මනින් කතෝලිකයන් බවට පත්වී ඉක්මනින් කසාද බැඳ බලාපොරොත්තු වන්නේ දරුවාගේ අනාගතය ආලෝකමත් කිරිමටය. එහෙව් බොහෝ දෙනෙකුට කිතුනු විවාහයේ ශුද්ධවන්ත බවෙන් කම් නැත. එහෙයින් අද කිතුනු විවාහයේ පාරිශුද්ධ බව ඉතාම සීග්‍රව කඩා වැටීමකට ලක්ව ඇති බව ඉතා කණගාටුවෙන් වුවද පිළිගත යුතු කරුණකි.

මෙයට ඉතාම සෘජු ලෙස පාදක වන කරුණු අතර;

- ජීවිතය පිළිබඳව හා සමාජය පිළිබඳව ඉතාම අල්ප දැනුමක් ඇති දෙදෙනෙක් එක්වන හෙයින් දෙදෙනා අතර පවතින පැහැදිලි අනවබෝධය හා සාමාන්‍ය දැනුම මදකම.
- බොහෝම සැහැල්ලු මට්ටමක පවතින ආදරයක් බෙදා ගැනීම.
- පරිත්‍යාගශීලීබවත් හා එකිනෙකා වෙත ගෞරවයක් කෙලෙසකවත් නොමැතිවීම.
- දෙදෙනා අතර අගය කිරීම. සමාව දීම, බැහැපත්වීම, මගපෙන්වීම හා සුහදව අඩුපාඩුකම් පෙන්වා දීමක් මොනම අයුරකින්වත් නොමැතිවීම.
- අනියම් ප්‍රේම ජවනිකා, ප්‍රේම වෘත්තාන්ත හා සම්බන්ධතා සීග්‍ර ලෙස වැඩිවීම.
- අසම්මත ලිංගික ක්‍රියාවන් හා චර්යාවන් නිසා ස්වපාලනයක් නොමැතිවීම.
- අධික ලෙස මුදල් වියදම් කිරීම හා සැප විහරණයෙන් පමණක්ම දිවි ගෙවීමට මාන බැලීම.
- මෙරට අප දිවියේ සියල්ලම බටහිර සංස්කෘතිය නමැති උපැස් යුවළ පැළඳීමෙන් පමණක් දකින්නට උත්සුක වීම (විශේෂයෙන් ඉතාලි ජීවිතය)
- ලිංගිකත්වයේ පූජනීය බව ඉවත ලෑම නිසා බොහෝ දෙමාපියන් හා වැඩිහිටියන් පැහැදිලිවම අන්ධ වූ හා විකෘති වූ මානසිකත්වයකින් කටයුතු කිරීම. යන දෑ වැදගත් වේ.

මෙකී නොකී බොහෝ කරුණු කාරණා නිසා වත්මන් කිතුනු විවාහයේ පාරිශුද්ධත්වය ලාභ වී තිබේ. තත්ත්වය එසේ වී තිබෙන බව දැන දැනම තවත් සුළු පිරිසක් උගුරට හොරා බෙහෙත් බොන්නට වෙර දැරීම තවදුරටත් අප හදවත් කම්පා කරවන්නකි. කිතුනු විවාහයේ කිතුනු පවුල් දිවියේ ශුද්ධවන්ත බවට පිටුපා ක්‍රියා කරන බොහෝ දෙනා එහි තිබෙන පාපය හා බරපතළකම මොනම අයුරකින්වත් දකින්නට වෙහෙසක් නොග නිති. එවැනි අසම්මතයේ සිටින බහුතරය ක්‍රියා කරන්නේ 'දත් තියන කල් මස්ම පමණක් කනවා' යන හැඟීම තුළය.

කිතුනු විවාහය යනු එවැනි තුප්පහි දෙයක් නොවන බව අවබෝධ කර ගත යුතුවේ. 'විවාහය යනු බිහිසුණු දෙයකි' යන හැඟීම ඇතිවීම එය දෙදරුම් කෑමට බොහෝ සේ බලපායි. දෙදෙනෙකු එකට ජීවත් වීමේදී ගැටලුවක් ඇති වන්නේ එක් අයෙකුගේ වරදක් නිසා නොව දෙදෙනාගෙ'ම වරදක් හෝ අඩුපාඩුවක් නිසා බව තේරුම් ගැනීම වැදගත් වේ. විවාහ දිවිය රඳා පවතින්නේ බාහිර දේවල් මත නොව 'දෙදෙනාගෙ ආදරය එකිනෙකාට දැනෙන අයුරින් ජීවත්වීම මත' බව පිළිගත යුතු වේ. එබැවින් කිතුනුවන් ලෙස අප ජීවිතවල මෙන්ම පවුල් දිවියේද මුල්ම තැන දෙවියන් වහන්සේට දෙන්නේ නම් එය පාරිශුද්ධ බවේ ඉහළම සලකුණයි. එමෙන්ම දෙමාපිය හා දූ දරු සම්බන්ධකම සැබෑ ආදරය මත පමණක්ම ගොඩනැඟීම අද කාලීන අවශ්‍යතාවයකි. මෙමගින් කිතුනු පවුල් දිවියේ පාරිශුද්ධ බව සෙවීමට පහසුවනු ඇත.

**"අද මුළු ලොවේම බොහෝ අය ආහාරයට වඩා ආදරය හා අගය කිරීම සොයමින් කුසගින්නෙන් හඬා වැටෙන්නෝය."**
**(සා. තෙරේසා මව්තුමිය)**

කටුනේරිය සහය මීසම් සේවක
**ගරු ප්‍රභාත් සංජය තමෙල් පියතුමා**

# කිතුනු විවාහය හා විවාහ දිනය

විවාහය ඕනෑම සමාජයකට පොදු කරුණක් වුවත් කිතුනුවන් වශයෙන් අප තනන විවාහය ශුද්ධවූ සක්‍රමේන්තුවයි. එය සභාවේ සක්‍රමේන්තු අතර අපට ලැබෙන අනගි ප්‍රසාද නිධානයකි. විවාහය වූ කලී එදා මෙන් අද ද එහි පාරිශුද්ධතාව රකින්නට අපි බැඳී සිටිමු. කිතුනු විවාහය ස්ත්‍රී පුරුෂ පාර්ශව දෙක අතර ගොඩ නැගෙන අතර විවාහය සරුකර ගන්නට එයට වග කියන්නට මුල සිටම අදාල දෙදෙනා බැඳී සිටියි.

වර්තමානයේ පවා මෙම විවාහය වලංගු විවාහයක් වන්නේ මේ සිව් කාරක නිසාය. ස්ත්‍රී පුරුෂ පාර්ශවයන් දෙක, ලියාපදිංචි වී ඇති කතෝලික දෙව් මැඳුරක, නිල පූජකවරය ලැබූ පියතුමෙක් ඉදිරිපිට හා සාක්ෂිකරුවන් දෙදෙනෙකු එකතුවුවහොත් එය නිතැතින්ම වලංගු වේ. නොකිතුනු විවාහයකට පවා කිතුනු විවාහය යට ගියාවත් සමග යම් ගැඹුරක් ඇත. සත්‍ය වශයෙන්ම කතෝලික සභාව තවමත් මෙම විවාහයේ පාරිශුද්ධතාව යම් යම් ලිපි ලේඛන, සභා ඉගැන්වීම් හා ශාසන නීති සංග්‍රහය මගින් ගොඩනගා ඇත.

කිතුනු විවාහයද දෙදෙනෙකු අතර පවතින ගිවිසුමක් බැවින් එය නිතැතින්ම රකින්නට දිරි දෙන්නට සභාවද බැඳී සිටී. මුල සිටම ආශිර්වාදකාර බන්ධනය ලැබූ අය, දැහැමි කිතුනුවන් පවසා ඇත්තේ විවාහය ආශිර්වාදයක් බවයි. එම ආශිර්වාදය පවුල් ජීවිතයේ සතුට ලබා එය දෙවියන් වහන්සේට සුදුසු හා ප්‍රසන්න දිවි පෙවෙතක් බවට පත් කරන්නටයි. ඒ සඳහා එදා මෙන් අද ද අද මෙන් හෙට දවසේද විවාහයට ඇතුලත්වන යුවල වග බලාගත යුතුය.

විවාහය ගැන කතා කරන්නට, සැලකිය යුතු කරුණු ගැන පහදන්නට ඉඩ කඩ හා අවස්ථාව තිබුණද විවාහයත් සමගම පරීක්ෂාවක් මෙන් විවාහ වන යුවල අන්ධවන කඩ ඉමක් නම් ඔවුන්ගේ විවාහ දිනයයි. විවාහය සඳහා සූදානම් වීමේදී විවාහ දිනයටද ඇත්ත වශයෙන්ම ඔවුන් සූදානම් වේ. එය කළ යුතුමය. නමුත් ඔවුන් දීර්ඝ කාලීනව දිවෙන විවාහයට සූදානම් වීමට වඩා විවාහ මංගල්‍යය, දෙවැනි ගමන හා අනෙකුත් දෑ කෙරෙහි අවධානය යොමු කරයි. සමහරු දේවස්ථානයේ හැම දෙයක්ම ලස්සනට කළ යුතු බව පවසයි. කෙසේ වෙතත් මල් සැරසිලි, ඇඳුම් ආයිත්තම්, කෑම බීම, මධුසමයට හෝටල් පහසුකම්, ලස්සනට අන්දවන කෙනෙක්, කේක්, ආරාධනා පත්‍ර හා ආරාධනා කළ යුතු අය ගැන වැඩි කාලයක් දීම නිසා, දෙදෙනා ඇතුලත් වන නැවුම් දිවිය ගැන හිත යොමු නොකරයි.

වර්තමානයේ පිටරට රැකියාවන් වල යෙදෙන විවාහ අපේක්ෂකයින් ලංකාවට පැමිණෙන්නේ විවාහයට දින කිහිපයකට පෙරය. අන් මිතුරකු හෝ අනෙක් අය විසින් සියල්ල සූදානම් කළද ඔහුගේ හෝ ඇයගේ විවාහයට සූදානම ඉතා දුර්වලය. දැනට පවතින ක්‍රමවේදය අනුව මීසම් භාර පියතුමාට විවාහ දිනයට මාස තුනකටවත් කලින් විවාහය ගැන දැන්විය යුතුය. තවද විවාහ අපේක්ෂක සමුළුවට සහභාගී වීම, ආශිර්වාදකාර බන්ධනයට පෙර විභාගයට (ඡහෂ) මීසම් භාර පියතුමන් ඉදිරියේ පෙනී සිටීම හා අවශ්‍ය දහම් දැනුම ලබාගෙන යහපත් පාපොච්චාරණයක් තුළින් විවාහයට හදවතින්ම ගැඹුරින් සූදානම් වීම වටී. අද මීසම් රටාව තුළ මොනයම් නීති රීති දැමුවද විවාහ අපේක්ෂකයින් ඔවුන්ගේ ලෝකවල සිටිමින් සිරිත් විරිත් සඳහා දේවස්ථානයෙන් විවාහ වෙති. එදා මෙන් නොව අද විවාහයේ ගැඹුර හා අර්ථය අප සමාජයෙන් ගිලිහී ගොස්ය.

මීසම් රටාව තුළ කෙසේ හෝ විශාල උත්සාහයක් මත නැවත වරක් විවාහයේ අර්ථය එහි පාරිශුද්ධතාවය හා වටිනාකම ගැන පැහැදිලි කළොත් අපේක්ෂකයින්ද විවාහ දිනයට වඩා ලස්සන නැවුම් අර්ථවත් විවාහයක් කරා හිත යොමු කරයි. කෙසේ හෝ කවුරුන් විසින් හෝ මෙම විවාහ වාණිජකරණයේ රැල්ල නැවැත්විය යුතුමය. කිතුනු විවාහයේ ද බාහිර ආටෝපය නිසා අද දුප්පත් කොල්ලන්ට කෙල්ලන්ට පල්ලියේ කසාද බැඳීමට ඉඩකඩ නැති තරම්ය.

මන්ද විවාහයේ ආරාධිතයින් ලස්සන ඇඳුම්, මල් සැරසිලි හා රස බොජුන් බලාපොරොත්තුවේ. එසේම විවාහ දිනය මෙසේ වානිජකරණය වන විට විවාහයේ ආධ්‍යාත්මික පැතිකඩ හා ආශිර්වාදයද ගිලිහී යයි. මෙලෙස බොහෝ දෑ නිසා විවාහයේ ආධ්‍යාත්මික අරමුණ ගිලිහෙන යුගයක සභාව තුළින්ම යම් යම් තීන්දු තීරණ මත යුග දිවියට පිවිසෙන්නන් හට එම දැනුම ලබාදිය හැකිය.

විවාහ දිනයට ළඟි ළඟියේ සූදානම් වන යුවල ආශිර්වාදකාර බන්ධනයට පෙර විවාහ අපේක්ෂක සමුළුවද ඉන් පසුව කෙරෙන කෙටි විභාගයේදී ද ඔවුන්ව නිතැතින්ම විවාහයේ අරමුණු කරා ගෙන ගිය හැක. පැහැදිලිවම අරමුණු තුනක් තිබෙන බවත් ඒවා ඒකත්වය, අඛණ්ඩභාවය හා දරුඵල වශයෙන් ඉදිරිපත් කළ හැක. එම කිතුනු විවාහයේ අරමුණු තුන මැනවින් ඉටුවේ නම් සත්‍යවශයෙන්ම විවාහය ඵලබරිතය. විවාහයේ සතුට සත්‍ය ලෙසම විඳින්නට නම් අරමුණු තුන කරා යා යුතුමය. දැනට ලංකාව තුළ විසිරී ඇති මීසම් රටාව තුළ සමහරවිට අපේක්ෂකයින්ව ඉතාම ගැඹුරින් සූදානම් කළ නොහැක. ඒ මන්දයත් මෙම වැදගත් සූදානම් කිරීම සඳහා විවාහ වන යුවල ද උනන්දුවෙන් ඉදිරිපත් විය යුතුය. ඔවුන්ගේ උනන්දුව හා ඕනෑකම තුළ මීසම් භාර පියතුමකුට විවාහ වන යුවලකට අවශ්‍ය දහම් දැනුම ලබාදී පූජසනය කරාද ඉන් පසුව සතුටින් විවාහය භුක්ති විඳීමටද සැලැස්විය හැක.

විවාහ දිනයේ ලස්සන හා ප්‍රීතිය ඉක්මනින්ම ගිලිහී යයි. එය අගය කරන අය ද පසුව අමතක කරයි. කෙසේ වෙතත් විවාහයේ පාරිශුද්ධිය රකිමින් විවාහ ජීවිතය ගෙවන දැහැමි යුවල විවාහ දිනයට වඩා විවාහ ජීවිතය රස විඳිනවා නොඅනුමානය.

විවාහයේ අරුත හා පාරිශුද්ධිය කෙමින් කෙමින් ගිලිහී යන යුගයක විවාහය නමැති සක්‍රමේන්තුව ස්ථාපිත කළ ක්‍රිස්තුන් වහන්සේම දැහැමි ලෙස යුග දිවි ගෙවන දෙමාපියන්ව ආශිර්වාද කරන සේක්වා!

**ගරු නිරෝෂන් ශ්‍රීකාන්ත පියතුමා**

## දැල්වෙන පහන්

## විසිපස් වසරක සමාජ මෙහෙවරක් සපුරන සිරිකමල්



වැලිසර ඇතිගේ ඇලෝසියස් ද සිල්වා හා හැඳල හේකිත්තේ ලැටිෂියා ප්‍රනාන්දු දම්පතින්ගේ පුත් ඇතිගේ සිරිකමල් ද සිල්වා (අප කවුරුත් හඳුනන සිරිකමල්) මූලික අකුරු කරනු ලැබුවේ නාගොඩ සා. ජෝන්ද බැප්ටිස් විදුහල් මාතාවගෙන් වූ අතර වැඩි දුරටත් උසස් අධ්‍යාපනය සඳහා පියවර මැන්නේ ජා-ඇල තුඩැල්ල ක්‍රිස්තුරාජ විදුහලෙන් හා පමුණුගම ගොන්සාල්වේස් විදුහලෙන් වූ අතර පාසල් අවධියේ පටන් කුඩා සිරිකමල් සුපේක්ෂල හික්ෂාකාමී ශිෂ්‍යයෙක් වූ අතර පාසලේ මෙන්ම පල්ලියේ මෙන්ම ගමේද කා අතරත් ජනප්‍රිය කැපීපෙනෙන චරිතයක් බවට පත් විය.

උසස් අධ්‍යාපනයට සමුදුන් සිරිකමල් එවකට තැපැල් හා විදුලි සංදේශ අමාත්‍ය ගරු ෂෙල්ටන් ජයසිංහ මැතිතුමාගේ මඟපෙන්වීම මත දේශපාලන සහ සමාජ සේවයට පිවිසියේය. ඉන් ටික කලකට පසු සිරිකමල් මහජන බැංකුවේ නිළධාරියෙක් මෙන් ජීවන වෘත්තිය ඇරඹීය. බැංකු ක්ෂේත්‍රයේ සිය සහෝදර සේවකයන්ගේ සේවක අයිතිවාසිකම් වෙනුවෙන් නොබියව සටන් කර සේවක අයිතින් රැක දීමට උරදුන් මහත්මයෙකු ලෙස කා අතරත් ප්‍රචලිත විය. සිය විසිවසරක වෘත්තීය ජීවිතයට සමුදුන් සිරිකමල් ඔහු කවදත් ප්‍රියකරන සමාජ සේවය නැමති දාමය හා බද්ධවීමට අදිටන් කර ගනිමින් හා පුරා කියමින් වත්තල පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජෝන් අමරතුංග මැතිතුමාගේ ඉල්ලීම මත වත්තල ප්‍රාදේශීය සභාවට තරග කොට නිතරගයෙන් 1988 එම ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයකු ලෙස පත් වූ සිරිකමල් 1990 දී එම ප්‍රාදේශිය සභාවේ උප සභාපති ලෙස පිදුම් ලැබීය.

දේශපාලන ගමන් මගේ අත්දැකීම් හා කාර්යය ශූරත්වයේ හැකියාව මත ඔහු පසු පස වත්තල ප්‍රාදේශීය සභා සභාපති තනතුරෙන් පිදුම් ලැබූ අතර 1990-1993 දක්වා සමස්ත ලංකා ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ගේ සම්මේලනයේ ලේකම් බවට පත් විය. දේශපාලන හා සමාජ ගමන් මගේ ඉදිරියට ගමන් කළ සිරිකමල්ව දුටු එවකට ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා ක්‍රිස්තියානි කටයුතු ගරු අමාත්‍ය ජෝන් අමරතුංග මැතිතුමාගේ විශේෂ ආරාධනයෙන් ජාතික තලයේ මැතිවරණයකට තරග කරන මෙන් ඇරයුම් ලැබින. එම ඇරයුම පිළිගත් සිරිකමල් හා හා පුරා කියා එක්සත් ජාතික පක්ෂයෙන් 1999 පැවති පළාත් සභා මැතිවරණයට තරග කොට වත්තල මැති සබයේ අසුනට තම පක්ෂය වෙනුවෙන් සුවිසල් ජයග්‍රහණයක් සනිටුහන් කරමින් 1999 දී බස්නාහිර පළාත් සභාවේ ගම්පහ දිස්ත්‍රික් පළාත් සභා මන්ත්‍රීවරයකු ලෙස දිවුරුම් දී තම දේශපාලන ධජය ගම්පහ දිස්ත්‍රික්කයේ පත් කළ ජනතාවට මෙන්ම වත්තල ජනතාවටද යෝධබල යෝධ ශක්තියක් බඳු සිරිකමල් කවදත් ගම්පහ දිස්ත්‍රික්කයේ කතෝලික දේශපාලනඥයන් වන ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමාගේ වෛද්‍ය ජයලත් ජයවර්ධන මැතිතුමාගේත් ඇසුර හා නොමඳ ආධාරය පෙරටු කර ගනිමින් කවදත් මිනිසුන් මැද සිටින මිනිසකු සේ මෙම විෂම සමාජයේ සමානාත්මතාවය වෙනුවෙන් යථාර්ථවාදි වෙනසක් කරා ගමන් කිරීමට කටයුතු කළේය.

කොළඹ අගරදගුරු පදවියේ කතෝලික අධ්‍යාපන කාර්යාලය සමග ඉතා සමීපව කටයුතු කරමින් කතෝලික පාසල්වල ගැටලු විසඳීමට එතුමන් ඉමහත් සේවාවක් ඉටු කළ බව නොරහසකි. කතෝලික ධර්මය ඉගෙනීමට හා පහසුකම් නොමැති දරුවන් වෙනුවෙන්ද කතෝලික පාසල්වල විනාශවෙමින් යන ආගමික පරිසරය ස්ථාපිත කිරීමටද කතෝලික ගුරු ගැටලු විසඳීමටද සිරිකමල් මහතාගෙන් සිදු වූ සේවය අපිරිමිතය. කතෝලික අධ්‍යාපනය නඟා සිටුවීම වෙනුවෙන් කටයුතු කිරීමේදී එතුමාට බොහෝ ගැටලු හා ප්‍රශ්න වලට මුහුණ දීමට සිදුවුවද ඒ සියල්ලකදී පසුබට නොවී තමාට සිදු වන දේශපාලන අවාසිද නොතකා කටයුතු කළේය. එතුමාගේ මැදිහත්වීම රජයට පවරාගත් කතෝලික පාසල්වල ඉගෙනීම ලබන සිසු දරුවන්ට අහිමිව ගිය අයිතිවාසිකම් ස්ථාපිත කිරීමට ඉමහත් පිටුවහලක් විය.

# සරණාගත දිළින්දන්ට දයාවේ දෑත දිගු කරන හලාවත පම්බල 'දිමුතු' දයා සෙවන

එවිට රජ්ජුරුවන් වහන්සේ සිය දකුණු පසෙහි වැඩසිටින්නන්ට කතාකොට 'මගේ පියාණන්ගෙන් ආශිර්වාද ලද්දෙනි, එන්න, ලෝකය පටන් ගැන්මේ සිට ඔබට සූදානම් කර තිබෙන රාජ්‍යය උරුමකර ගන්න. මන්ද මම සාගිනිව සිටියෙමි. ඔබ මට කන්නට දුන්නහුය. පිපාසාවී සිටියෙමි ඔබ මට බොන්නට දුන්නහුය. ආගන්තුකව සිටියෙමි. ඔබ මා ගෙදරට පිළිගත්තහුය. වස්ත්‍ර නැතිව සිටියෙමි. ඔබ මට වස්ත්‍ර දුන්නහුය. රෝගාතුරව සිටියෙමි. ඔබ මා බලා ගත්තහුය. සිරගෙදර සිටියෙමි. මා බලන්න ආවාහුයයි වදාරා සේක. සැබැවින්ම මම ඔබට කියමි. මාගේ සහෝදරයන්ගෙන් ඉතාම සුළු තැනැත්තාට වුවද ඔබ එසේ කළානම් එය කළේ මට යැයි වදාරණ සේක. (ශුද්ධවර මතෙව් 25:34-40).

බෙත්ලෙහෙම් ගවහලේ ජේසු උපතේ ප්‍රේමයේ ජීවනයට සැබෑ අරුත එක්කළ නැතිබැරි මිනිසුන්ට ඇති හැකි අයගේ සවියේ දාන පාරමිතාවෙන් සෙවන දෙන හලාවත පම්බල ඉදිකළ තවත් නත්තලේ සැබෑ ගවලෙනක කතාවක් කිතුනු කම් දැස විවර කර ඇත්තේය.

'දිළිඳුකමෙන් තොර නවලොවක්' එහි පූජනීය අරුත වේ. ගවහලේ ජේසුගේ දහමේ ප්‍රේමයේ පණිවුඩය සැබෑලෙසම ග්‍රහනය කර ගෙන 'මම දිළින්දන් වෙනුවෙන් කැපවෙමි' යන අසීරු, අමිහිරි, කටුක ප්‍රේමයේ අදිටන ජීවත් කරවීමට පැවිදි දිවිය පුරාම දිවුරුම් දුන් මේ අසහාය සැබෑ ක්‍රිස්තු වරයා, හලාවත පදවියේ වන්දනීය ජුසේ වාස් පිය පහස ලද බෝලවත්ත, කම්මල නම් ඓතිහාසික ග්‍රාමයේ උපත ලද ගරු ජූඩ් නික්ලස් ප්‍රනාන්දු දයාවේ පියතුමාය.

ඉතා දිළිඳු පවුලක උපන් එතුමාව දෙවියන් වහන්සේ විසින් දිළින්දන්ගේ කඳුළු පිස දැමීමට තෝරාගෙන ඇත්තේය. එතුමා අම්පිටිය දෙවිසත්හලින් දේව ධර්ම උපාධියද, රෝමයෙන් ජනවන්දනාව හා දේවධර්මය පිළිබඳ ආචාර උපාධි කීපයක් ද ලබා, ඉන්දියාවේ භාරත් ඛණ්ඩ සංගීත විශ්ව විද්‍යාලයෙන් සංගීත විශාරද උපාධියද ලබා ඇත්තේය. එතුමා හලාවත පදවියේ ජනවන්දනා අධ්‍යක්ෂ පියතුමා ලෙසද හලාවත සා. අන්තෝනි උසස් අධ්‍යාපන ආයතනයේ දේව ධර්මය පිළිබඳ කතිකාචාර්ය වරයකු ලෙසද හලාවත ඇදුරුඹය 'සංහිදියාව' සම්මන්ත්‍රණ

තනයේ අධ්‍යක්ෂ ලෙසද සුවිශාල දහම් කාර්යභාරයක් කරට ගෙන ඇත්තේය. හලාවත රදගුරු අතිඋතුම් වැලෙන්ස්



මැන්දිස් හිමිපාණන්ගේ පූර්ණ සහය හා ආශිර්වාදය ඇතිව 'දිමුතු' සෙවනට මූලස්ථානයක් සොයනවිට පම්බල ග්‍රාමයේ දේව සේවයට කැපවූ 'නිර්මලා පෙරේරා' නම් කරුණාවන්ත දානපති මහත්මිය තමන් සතු ඉඩමෙන් අක්කර 1 1/2 ක් තම දයා සෙවන ඉදිකිරීමට පරිත්‍යාගි කිරීම දේව හාස්කමකි. ඉන්පසු මෙම භූමිභා ගයේ දිමුතු සේවා සෙවන ඉදිකිරීමට ලක්ෂ ගණනින් දහස් ගණනින් මුදල්. දයාවන්ත පරිත්‍යාගිශිලින් නොමසුරුව පරිත්‍යාග කිරීම දේව වරප්‍රසාදයකි.

දැන් අප ඉතා අලංකාර 'දිමුතු' දයා සෙවනේ මූලික අදියර ඉදිකොට ඇත්තෙමු. දිමුතු සෙවනේ රැකවරණය සඳහා අනාථ දරුවන් වීදිවල සිඟාකන අපේම සහෝදර සහෝදරියන් යාචකයන් මම සොයා ගියෙමි. ඔවුන් එම තත්ත්වයට වැටී ඇත්තේ දරුවන් හා ඥාතීන් විසින් අතහැර දැමීම නිසාය. නොයෙක් සමාජ අසාධාරණකම් නිසා පීඩනයට සරණාගත තත්ත්වයට ලක්වූ සියගණන් දරුවන් මම සොයා ගියෙමි. මානව දයාව ක්‍රිස්තු ප්‍රේමය ඔවුන් වෙත දැක්වීම දේව ජනතාව වන අප සැමගේ මහම යුතුකමක් හා වගකීමක් නොවන්නේද? ජේසු අපෙන් පතන්නේද ඒ දෙයම නොවේද? මා ඔවුන් සැම මෙම දයා සෙවනේ රැකවරණයට ගත්තෙමි.

අප ආයතනය තවම මහා පරිමාණයෙන් ආරම්භ කළා පමණි. අපට ඔබ හැමගේ දයාව, උපකාරය අවශ්‍යව ඇත. ගඩොල්. සිමෙන්ති, වැලි දෙවන අදියර ගොඩනැගීමට, වැසිකිලි පහසුකම් සැලසීමට අවශ්‍යව ඇත. ඇඳන්, කොට්ට, මෙට්ට, බෙඩ්ෂීට්, ඇඳුම් පැළඳුම්, පුටු මේස, කබට්, පිඟන්, කෝප්ප, මදුරු දැල් ආදිය එම දිළින්දන්ගේ පහසුකම් සඳහා අවශ්‍යව ඇත. මෙම නැති බැරි සැමට ආගම් භේදයෙන් තොරව තමන් අදහන ආගම් අනුව සර්ව ආගමික ස්ථානයක් පිළියෙල කරදීම අපේ යුතුකමකි. මෙම අනාථ දරුවන්ට පූර්ණ අධ්‍යාපනයක් ලබාදීම, කෑමබීම, ඇඳුම් පැළඳුම් සපයා දීම අප ඉදිරියේ ඇති මහම අභියෝග යකි. ඔවුන්ට අවශ්‍ය විවේකාගර විනෝද ක්‍රීඩා, පුස්තකාල පහසුකම් අධ්‍යාත්මික සුවය ආගම ඉගැන්වීම අප ඉදිරියේ ඇති තවත් අභියෝගයකි. ඉතාම කරදර බාධක, විවිධ දුෂ්කරතා මධ්‍යයේ මම මගේ කොටස උපරිම ලෙස ඉටුකර ඇත්තෙමි. ඉතිරි අභියෝග සියල්ලද ජයගැනීමට දේව හස්තය අපට ලැබෙනු නොඅනුමානය.

විවිධ දානපතියන්, දේශීය හා විදේශීය පරිත්‍යාගශීලින් රාජ්‍ය දේශපාලන නායකයන් පෙළගස්වා ගෙවුන කාලපරිච්ඡේදය තුළ මගේ දිමුතු පදනම සංකල්පය යටතේ දිළින්දන් වෙනුවෙන් ඉටුකළ සේවාවන් ටිකක් මෙසේ සටහන් කරමි.

පුත්තලම 'සීමාවෙලිය' දිමුතු ජුසේ වාස් ගම්මානය, හිසට වහලක් නොමැතිව තමන්ගේම කියා තැනක් නොවූ අන්ත අසරණ පවුල් 20 කට බිම් කොටස් බෙදාදෙමින් යටිතල පහසුකම් දියුණු කරමින් නව ගම්මානයක් ගොඩ නැගීම, කන්දතොඩුවාව, දුගී ධීවර ගම්මානයක් වූ මෙම ගම්මානයට අංගසම්පූර්ණ පහසුකම් සපිරි බහු කාර්යය ගොඩනැගිල්ලක් ලබාදීම. කැකිරාව, ප්‍රදේශයේ දුගී ගොවි පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය නැංවීම සඳහා ඉංග්‍රීසි මාධ්‍ය පාසලක් පවත්වාගෙන යාම. කෝට්ටපිටිය ප්‍රාථමික විදුහලට බලවත් අඩුපාඩුවක්ව පැවැති පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකර ඊට අවශ්‍ය පොත්පත් ලබාදීම. හරිත ව්‍යාපෘතිය ඉහත සඳහන් ගම්මාන හා ඒ ප්‍රදේශයන් හී පාසල් කේන්ද්‍ර කර ගනිමින් නොමිලේ පැළවර්ග බෙදා දී රුක් රෝපණ හා පරිසර සංරක්ෂණය සඳහා ජනතාව දිරිගැන්වීම අක්ෂි සායන, දිළිඳු ගම්මානවල වැඩිහිටි ජනතාවගේ ඇස් පරීක්ෂාකර ඔවුන්ට අවශ්‍ය ඇස් කන්නාඩි නොමිලේ ලබාදීම, වැඩිහිටි සරණ, අසරණ බවට පත්වූ වැඩිහිටියන් රැක බලා ගනිමින් ඔවුන්ට අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය සහ අනිකුත් අවශ්‍යතා සපුරා ගැනීමට ආධාර කිරීම.

අපට අතදෙන්න, හිත දෙන්න, ගරු ජූඩ් නික්ලස් ප්‍රනාන්දු පියතුමා දිමුතු පදනමේ නිර්මාතෘ සංහිදියාව, පුත්තලම් පාර හලාවත. දුරකතන අංක 0773265133, 0718371582 ඔබේ ආධාර යොමුකරන්න, දිමුතු පදනම, කොමර්ෂල් බැංකුව, හලාවත ශාඛාව ගිනුම් අංකය 8430016561

**ජෝ සංගපාලආරච්චි**


# පෙර ගමන්කරුවකුගේ නික්ම යාම

ආචාර්ය තිස්ස බාලසූරිය පියතුමන් යනු කවුරුන්දැයි නොදක් කෙනෙකු ශ්‍රී ලංකාවේ සිටියා නම් ඒ සංඛ්‍යාව ඉතාමත් අල්ප විය හැකිය. එහෙත් මරදානේ පිහිටි සමාජීය හා සාමයික කේන්ද්‍රය පිළිබඳව දන්නා හැම කෙනෙකුම ඒ හා බැඳුන තිස්ස බාලසූරිය පියතුමාගේ නාමයත් උන්වහන්සේගේ දැක්ම සහ චින්තනයත් එමෙන්ම ක්‍රියාකාරිත්වයත් හඳුනාගෙන සිටියේ දශක ගණනාවකට පෙර පටන්ය. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව ගෙන ආ සභා නවෝදය ශ්‍රී ලංකා සභාව තුළ විවිධ අන්දමින් ක්‍රියාත්මක වන්නට ආරම්භ වූ පැහැබර අතීතයක් තිබිනි.

ඒ අතීත රැල්ලේ ඉතාමත් සංකීර්ණ ක්ෂේත්‍රයන් තුළ රැඳී සිට ශ්‍රී ලංකා සභාවට ප්‍රගතිශිලි ස්වරූපයක් දෙන්නට මහත් ප්‍රයත්නයක් දරමින් 'පෙර ගමන් කරුවන්' වූ ආසියාතික දේවධර්මාචාර්යවරුන් තිදෙනෙක් විය. ඉන් එක් අයෙකුවන්නේ බුත්තල දී ඝාතනයට ලක් වූ නිර්මල මරිය නිකායික මයිකල් රුදිගු පියතුමාය. දෙවැන්නා තිස්ස බාලසූරිය පියතුමාය. තුන්වැන්නා ආචාර්ය ඇලොයි පීරිස් පියතුමාය. පැවිදි පූජකවරුන් වූ මෙම දේවධර්මාචාර්යවරුන්ගේ දායකත්වය පසුකාලීනව පැවිදි ජීවිතයට පැමිණි බොහෝ දෙනෙකුගේ පැවිදි පුහුණුව නිර්මාණය කරන්නට සමත් විය. ඒ ඒ කාලවල පැවිදි නිකායයන්ගේ නායකත්වය හෙබවූ ශ්‍රේෂ්ඨවරුන් ශ්‍රේෂ්ඨ වරියන් තම පැවිදි නිකායයන් පෝෂණය කරන්නට මෙම උගත් පියවරුන් ගේ සහය නොමඳව ලබාගත්හ.

දෙවන වතිකාන මන්ත්‍රණ සභාව ගෙන ආ 'නවෝදය' පැවිදි ජීවිතය තුළ ක්‍රියාත්මක කරන්නට, එම නව දැක්ම සහ චින්තනය තුළින් පැවිදි ජීවිතය අර්ථවත් කරන්නට පර්යේෂණාත්මක අත්හදාබැලීම් කරන්නට මේ අය අත්වැල් බැඳගත්හ. ආසියාතික සංස්කෘතිය තුළ ගැබ්වුන හරයන් හඳුනා ගැනීමටත්, ඒ තුළින් ජේසුතුමන්ගේ දහම ජනතාව තුළට ගෙන යාමටත් හැඩගැස්ම ආධුනික පැවිද්දන්ට ලබාදීම සඳහා මේ අය මුළුමනින්ම දායකත්වය සැපයූහ. යොවුන්විය ආරම්භයේ ආධුනික පැවිද්දන් ලෙස පුහුණුවේ යෙදුන තරුණ තරුණියන්ට දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ යෝජනා තුළින් ආ ආලෝකය ගෙන ආවේ ඔවුන්ය. ආචාර්ය තිස්ස බාලසූරිය පියතුමා පැවිදි පූජක ගිහි තුන් කණ්ඩායමටත්, කිතුනු නොකිතුනු හැම කෙනෙකුටත් පක්ෂ විපක්ෂ හැම දේශපාලනඥයකුටත්, ජනවාර්ගික අර්බුදවලදී සියලු ජාතීන්ට හා ජාත්‍යන්තරයටත් ආමන්ත්‍රණය කළේ මරදානේ සමාජීය සහ සාමයික කේන්ද්‍රයේ සිටයි.

පුරවැසියා තුළින් පක්ෂ දේශපාලනය කරගසාගත් කෙනෙකුට වඩා දේශපාලන විඥානයක් ඇති, තුලනාත්මකව කල්පනා කරමින් සමාජ විශ්ලේෂනයක් හා විග්‍රහයක් කරන්නට හැකි, බුද්ධිමත් තීරකයකු නිර්මාණය කරන්නට සමාජීය සහ සාමයික කේන්ද්‍රය නිරන්තර උත්සාහයක යෙදුනි. විවිධ



අන්දමේ සමාජ ක්ෂේත්‍රයන්ට අදාල සම්මන්ත්‍රණ හා සාකච්ඡා ද සංවාදයන්ද නිරන්තරයෙන් එහි පැවැත්විනි. බුද්ධිය අවදි කරගන්නට රිසි කොයි කවුරුත් එතැනට සම්බන්ධව සිටියහ. නිරන්තරයෙන් පර්යේෂණාත්මක ලිපි ලියමින් දේශන පවත්වමින් මිනිසුන්ගේ බුද්ධියට ආමන්ත්‍රණය කිරීම එදා මෙදා තුර එතුමා ඉෂ්ට කළ මහගු කාර්යයයි.

ජනතාවට පීඩා විය හැකි ඇතැම් අවස්ථාවල ඒවාට එරෙහිව නැගුන ජනතා ප්‍රතිරෝධය ශක්තිමත් කරමින් එතුමා සාමාන්‍ය ජනතාව සමග අත්වැල් බැඳගත් අවස්ථා අනන්ත අප්‍රමාණය. එයින් කැපී පෙනෙන සිදුවීම් කිහිපයක් අපි නැවත ආවර්ජනය කරමු. එකක් නොරොච්චෝලේ තාප බලාගාරය ඉදිකිරීමට එරෙහිව නැගුන රැල්ලයි. කණ්ඩලම හෝටලය ඉදිකිරිමට විරෝධය පෑ අවස්ථාවයි. බුත්තල දී ඝාතනයට ලක් වූ මයිකල් රුදිගු පියතුමාගේ දේහය මරදානේ පාතිමා දේවස්ථානයේ සිට කනත්ත දක්වා පා ගමනින් ගෙන ගිය අවස්ථාවයි. ඒ අනුවේදනීය අවස්ථාවේ තිස්ස බාලසූරිය පියතුමා ඉතාමත් සංවේදීව තම සහෘදයා වෙනුවෙන් පෙනී සිටි අන්දම එම අවස්ථාවට සහභාගි වූ කිසිවකුගේ මතකයෙන් ගිලිහී නොයයි.

ආචාර්ය තිස්ස බාලසූරිය පියතුමාගේ ජීවිතය පිළිබඳ මෙනෙහි කරන්නකුට නිතැතින් මයිකල් රුදිගු (නි.ම.නි) පියතුමන්ගේ මෙම ප්‍රකාශනය සිහිපත් වේ.

'දේවධර්ම ශාස්ත්‍රාචාර්යවරයා සාක්ෂි දරන්නකු විය යුතුය. එසේ වීමට නම් මිදිවැල එහි අතු හා සමග ඒකාබද්ධ වී ඇති ආකාරයෙන්ම දේවධර්ම ශාස්ත්‍රාචාර්යවරයා ද ජේසුතුමා සමග සම්බන්ධ වී ජීවමානව සිටිම වැදගත්ය. දේවධර්ම ශාස්ත්‍රය මගින් විශ්වාසය පෝෂණය කළ යුතුවේ. එය ගින්දරට දර දැමීමක් මෙනි. එසේ නම් දේවධර්ම ශාස්ත්‍රය යනු සාදා නිම කළ හෝ නිම කළ හැකි දෙයක් නොව පැවැත්වෙමින් යන දෙයකි. නැතිනම් සත්‍යය බෙදා ගැනීමකි. වත්මන් සභාව තුළ ජේසුතුමා බෙදා ගැනීම, ලොවට බෙදා දීම හා කියාපෑම දේවධර්ම ශාස්ත්‍රය තුළින් සිදුකළ යුතුය.

(නූතන ආසියාවේ දේවධර්ම ශාස්ත්‍රාචාර්ය වරයකු සතු වැදගත් කාර්යභාරය - මයිකල් රුදිගු පියතුමා - දම්මිණ - 1986 දෙසැම්බර්)

ආචාර්ය තිස්ස බාලසුරිය පියතුමා සිදු කළේ එයයි. නැවතත් ගරු ආචාර්ය මයිකල් රුදිගු පියතුමා මෙසේද පවසයි.

"අනාගත දේවධර්මය නිර්මාණය කළ හැක්කේ සමකාලීන ලෝක ජනතාවගේ ජීවන රටාව තුළට එක්වන්නාවූද, වත්මන් සමාජ යථාර්ථය තුළ ක්‍රියාකාරී වගකීමක් භාරගත්තාවූද ක්‍රිස්තියානි කණ්ඩායම් (සංස) වලට පමණි. දේවධර්මාචාර්යවරයා හෙවත් නිහතමානිව විවෘතවන්නා සිටිය යුත්තේ මෙම කණ්ඩායම් තුළය. ඔහුගේ ජීවිතය හා පැවැත්ම විය යුත්තේ ද ඒ තුළය.

සැබැවින්ම ආචාර්ය තිස්ස බාලසූරිය පියතුමාගේ අනන්‍යතාවන් තිබුණේ එතැනය. යුගයක් පුරා දිවැසි මෙහෙවරක් පරිසමාප්තියට පත්කොට සදාතන නිවහනට නික්ම ගිය 'සේවකයාණනි' ඔබට ස්වර්ගීය ආනන්දය හිමි වේවා!

**ලිලියන් තන්ත්‍රිආරච්චි (ශු.ප) පැවිදි සොහොයුරිය**

## අගරදගුරු වසම ... 1 පිටුවෙන්

කාදිනල් හිමිපාණන් මේ කරුණු ප්‍රකාශ කළේ අගරදගුරු පදවි යුක්තිය, සාමය හා මානව සංවර්ධන කොමිසමේ 2013 වසරේ මුල්ම රැස්වීම් වාරයේදීය. මීසම් මට්ටමින් උතුරේ ජනතාව මුණ ගැසී එම ජනතාවගේ යථාර්ථයන් තේරුම් ගැනීමටත්, දකුණේ පාසල් උතුරේ පාසල් සමඟ මිත්‍රත්වයේ පාලම් ගොඩනැඟීමටත්, උතුරු දකුණු සංවාදය වඩ වඩාත් ඵලදායී ලෙස ජනතා යහපත උදෙසා ක්‍රියාත්මක කිරීමටත් පියවර ගැනීමේ අවශ්‍යතාවය කාදිනල් හිමිපාණෝ එහිදී වැඩි දුරටත් අවධාරණය කළහ. සෙත් සරණ අධ්‍යක්ෂ හා අගරදගුරු පදවි යුක්තිය, සාමය හා මානව සංවර්ධනය පිළිබඳ කොමිසමේ ලේකම් ගරු රොහාන් ද අල්විස් පියතුමා මේ රැස්වීම සංවිධානය කළේය.

## නියෝජ්‍ය ධීවර ... 1 පිටුවෙන්

මීගමුව ආසනයේ ආසන සංවිධායකවරයාද වන මෙතුමා මෙයට පෙර රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය කටයුතු අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කළ අතර එම අමාත්‍යාංශයේ අමාත්‍යවරයා ලෙස කටයුතු කළ තවත් කතෝලික අමාත්‍යවරයකු වන දයාශ්‍රිත තිසේරා අමාත්‍යවරයා හා එක්ව විනිවිදභාවයෙන් හා මනා කළමණාකරණයෙන් කටයුතු කර රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය කටයුතු අමාත්‍යාංශය ආදර්ශවත්ම හා මෙරට වැඩිම ලාබයක් ලබන අමාත්‍යාංශය බවට පත් කරමින් මහ භාණ්ඩාගාරයට ඛනිජ වැලි ආයතනයෙන් පමණක් රුපියල් මිලියන 200 ක මුදලක් ලබා"මට කටයුතු කරනු ලැබීය. ධීවර කටයුතු සම්බන්ධයෙන් කුඩා කල පටන්ම හසල දැනුමක් ඇති මෙතුමා, ධීවර ප්‍රශ්න හා ගැටලු වෙනුවෙන් ධීවර සංවිධාන, වෘත්තීය සමිති හා කතෝලික පියවරුන්ද සමඟ එක්ව විවිධ අවස්ථාවන් හී පෙරමුණ ගනිමින් කටයුතු කළ චිතයකි. ධීවර පවුල් වෙනුවෙන් සුබසාධන කටයුතු රාශියක් සිදුකර ඇති මෙතුමා ඉදිරියේ ධීවරයින්, ධීවර පවුල් හා ඔවුන්ගේ දරු දැරියන් වෙනුවෙන් විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවද අප හා පැවසීය. ඡායාරූපයෙන් දැක්වෙන්නේ එතුමා නව අමාත්‍යාංශයේ වැඩ බාරගත් අවස්ථාවයි. නව නියෝජ්‍ය ධීවර අමාත්‍යවරයාට 'ප්‍රදීපයේ' සුභ පැතුම්.

## කිතුනු අපට ... 5 පිටුවෙන්

මෙවන් කාර්ය වලදි උන්වහන්සේ අපි සමඟ සිටින බව සිහිපත් කරමින් මේ හමාගෙන එන අභියෝග නමැති කුණාටුව විසිරී කැඩී බිඳී සුන්වී යන්නට උන්වහන්සේ අත දෙන බව ශු. ලූක් 8:23 දැක්වෙන මාරුත දමනයේ දී උන්වහන්සේ ප්‍රචණ්ඩ කුණාටුව නිශ්චල කර "බියට පත්වන්නේ මන්ද මම ඔබ ළඟ ය"යි ප්‍රකාශ කළහ. අප ඇදහිල්ලෙන් සිටියහොත්, උන්වහන්සේගෙන් ඉල්ලුවහොත් මේ අභියෝග නමැති කුණාටුව උන්වහන්සේ විසුරුවා හරින සේක. උන්වහන්සේගෙන් නිරතුරුවම ඉදිරියේ සිට අප නොසැලෙන ලෙස අපගේ දකුණු පසේ වැඩ සිටින සේක. උන්වහන්සේ අපගේ ජීවිත පාතාලයේ දමන්නේවත්, ඇදහිල්ලෙන් සිටින අප ජරාපත් වන්නට ඉඩ දෙන්නේවත් නැත. එම නිසා අප ඇදහිල්ලේ සාක්ෂි කාරයින් වී මේ අභියෝග යාච්ඤාවෙන් හා උත්සාහයෙන් ජය ගැනීමට ඉදිරිපත් වෙමු. මේ 2013 මුලු විශ්වය තුළම අපගේ විශ්වාසය ප්‍රකාශ කිරීමේ මහඟු කාර්යය භාර ගනිමු.

## ලක් මෑණියන්ට ... 9 පිටුවෙන්

අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසින් නිරාවරණය කරන ලදි. මෙම අවස්ථාවේ දී කලාශූරි අරිසෙන් අහුබුදු පුන පුනා පැවසුවේ සුනිල් සාන්තයන් ප්‍රවීන ගීත රචකයකු, ගායකයකු, කිවියකු, වාදකයකු මෙන්ම නව ආරකින් සිංහල කලා හුරුවකට ගීත ගැයීමට පෙරමුණ ගත් සංගීතමය මාර්ගදර්ශකයකු බවයි. තවද සුනිල් සාන්තයන් අපූර්ව ප්‍රතිපත්ති සහිත, වෘතියමය නිදහසකින් ක්‍රියා කළ යහපත් චරිතයකින් හෙබි, බුද්ධිමය ධෛර්යයකින් කටයුතු කළ අවංක ජාති හිතෛෂී පුද්ගලයකු ලෙස ද හඳුන්වාදෙන ලදි.

★ අප රටේ දේශීය කලාව ගොඩනැගීම සඳහා කතෝලික වන්දනා ගීතිකා, නත්තල් (කැරොල්) ගීතිකා, පාස්කු පසන් ගී, නාඩගම් සහ නාට්‍ය තුළින් ලැබූ ආභාෂය කා හටත් අවතක්සේරු කළ නොහැකිය. හෙළ කලාවේ සහ සංස්කෘතියේ දියුණුවට කතෝලික සභාවෙන් ලැබී ඇති දායකත්වය ගැන තිස්ස අබේසේකරයන්, ආචාර්ය සුනිල් ආරියරත්නයන්, මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු සහ මහාචාර්ය තිස්ස කාරියවසම් වැනි සුප්‍රසිද්ධ කලාවේදීන් පවා ප්‍රසිද්ධියේ පවසා ඇත.
(ඉහත සඳහන් කරුණු අනුව කතෝලිකයින් හෙළ හැදියාව නොඅග යන පිරිසක් යැයි කීම සපුරා සාවද්‍ය බව අමුතුවෙන් කිව යුතු නොවේ)

### සෞඛ්‍ය සේවාව

★ 1960 දශකයට පෙර අප රටේ රෝහල් තුළ සේවය කළ (ඉන්පසුව මෙරට පාලකයන් විසින් ඉවත් කළ) කිතුනු පැවිදි සොයුරියන් කිසිම ආගම් භේදයකින් තොරව රෝගීන් වෙනුවෙන් කැපවී ඇප උපස්ථාන කළා මිස අද මෙන් වැඩ වර්ජන වලට පෙළඹී රෝගීන් සහ සෙසු මහජනතාව දුෂ්කරතාවයට පත් නොකළහ.

★ ලාදුරු රෝගීන්ට සේවය කිරීමට බොහෝ අය අකැමැතිව සිටි යුගයක දී, මෙම රෝගීන්ට ඇප උපස්ථාන කරමින් ඔවුන් වෙත දයාව සහ ප්‍රේමය දැක්වූ කිතුනු පැවිදි සොයුරියන් ගැන අද පවා බොහෝ අය ස්තූතිපූර්වකව සිහිපත් කර සිටින බව සඳහන් කළ යුතුය.

### අධ්‍යාපනය

★ පාසල් අධ්‍යාපන ක්‍රමයට කිතුනු අධ්‍යාපනවේදීන් සිදුකළ සේවාව ඉමහත්ය. ලක්දිව පුරා රජයේ ආධාර ඇතිව පවත්වාගෙන ගිය කිතුනු පාසල්වල ඉගෙනුම ලබාගත් විශාල බහුතරයක් කිතුනු නොවූ ශිෂ්‍යාවන් ය. ඒ එක් ශිෂ්‍යයකුට පවා තම ආගම අතහැර කිතුනුවකු වීමට කිසිම බලපෑමක් ඇති නොවූ බවත්, එම පාසල් වලින් ලබාගත් අධ්‍යාපනය සහ පුහුණුවීම හේතුකොට අද රටට සේවයක් කරමින් යහපත් ජීවිතයක් ගත කරන්නට හැකි වී ඇති බවත්, මෙම පාසල්වල ඉගෙනුම ලත් කිතුනු නොවන ආදි ශිෂ්‍යයෝ පවසති. නමුත්, හුදෙක් කිතුනුවන්ට පහරදීමේ චේතනාවෙන් 1960 දී මෙම පාසල් රජයට පවරා ගන්නා ලදි. වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන පිරිහීමත්, අද අප සමාජයේ ඇති වී තිබෙන පිරිහීමත් මෙම පාසල් රජයට පවරා ගැනීමේ සෘජු ප්‍රතිඵලයක් බව අපක්ෂපාතී ලෙස සිතන බොහෝ අයගේ මතයයි.

★ ලංකාවේ අද පවතින පැරැණිතම කාර්මික පුහුණු මධ්‍යස්ථානය මග්ගොන ශාන්ත වින්සෙන්ති නිවාසයයි.

### සමාප්තිය

ඉහත සඳහන් කර ඇත්තේ ක්‍රිස්තියානි ජනතාව විසින් ලක්මෑණියන්ට සිදු කරන ලද අති මහත් සේවාවෙන් බිඳක් පමණි. එය අමතක කිරීමට හෝ අවතක්සේරු කළ නොහැකිය. මේ අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ ඒකීයභාවය හා ස්වාධිපත්‍යය ආරක්ෂා කිරීම උදෙසා තම වටිනා ජීවිත පරිත්‍යාග කරමින් ආරක්ෂක හමුදාවන්හි සේවය කළ හා දැනටත් ආගම් භේදයකින් තොරව, දිවි පරදුවට තබා ත්‍රිවිධ හමුදාවන්හි හා පොලිසියෙහි සේවයේ යෙදී සිටින ක්‍රිස්තියානි භක්තිකයන් සිහිපත් කිරීම උචිතය. අන්තවාදී මත දරණ ව්‍යාජ දේශප්‍රේමීන්, ශ්‍රී ලංකා මාතාව උදෙසා ක්‍රිස්තියානි දායකත්වය සැහැල්ලුවට පත් කිරීමට උත්සාහ කළ ද සත්‍යය කිසිදිනක සැඟවිය නොහැකිය. සත්‍යය ජයගනී.

මහ සංඝරත්නය සහ ක්‍රිස්තියානි රදගුරුතුමන් සියළු දෙනා ඇතුලු පියතුමන් අතර වර්තමානයේ පවතින එකමුතුකම සහ මිත්‍රශීලිභාවය, සාමය අගයන ලක්වාසි සියල්ලන්ගේ පැසසුමට ලක්වී ඇති කරුණකි. මෙවන් අවබෝධයක් තුළින් අප රටේ ආගමික සාමය මෙන්ම ජාතින් අතර සාමය ද ඇති වේවා යයි බහුතර ජනතාවගේ බලාපොරොත්තුවයි. ආගමික නායකයන් අතර ඇති සුහදතාවය බහුතරයක් සාමාන්‍ය ගිහි ජනතාව අතර තිබුණ ද, අවාසනාවකට මෙන් සුළුතරයකගේ අන්තවාදී අදහස් සහ ක්‍රියාවන් හේතුවෙන් අද ලක්වාසි කිතුනුවන්ට නොයෙකුත් අසාධාරණයන්ට මුහුණ දීමට සිදුවී ඇත.

දැනටමත් අපි කැඩී බිඳී දෙකඩ වූ ජාතියක් වෙමු. තවදුරටත් ආගමික හේතූන් මත බෙදී වෙන්විය නොහැකිය. අපි සැම, අප ආදරණීය ලක් මෑණියන් වෙනුවෙන් සියළුම ජනවාර්ගික සහ ආගමික කණ්ඩායම් දක්වන දායකත්වය කෘතඥ පූර්වකව අගය කරමු. එකිනෙකා තේරුම් ගනිමින් එක්වෙමු. එවිට මේ ලස්සන දිවයිනේ උපන් සියලු දෙනාටම ගෞරවනීය සාමයෙන් හා සතුටින් ජීවත් විය හැකිවේ. නැවතත් පාරාදීසයක් වන්නට - "ඉන්දියන් සාගරයේ මුතු ඇටය" බවට පත්වන්නට ශ්‍රී ලංකා මාතාවට දේවාශිර්වාද ලැබේවා!


## ජා-ඇල තුඩැල්ලේ සුදුවැල්ල මරද මඩු මාතා දෙව්මැඳුරේ 32 වන වාර්ෂික මංගල්‍යය

**2013 පෙබරවාරි 10 ඉරුදින**

★ කොඩිගස එසවීම - ජනවාරි 31 බ්‍රහස්පතින්දා සවස 4.00 ට සිදුකෙරේ.

පෙබ. 01 - 08 දක්වා දිනපතා සවස 6.45 ට නොවාන දිව්‍ය පූජා යාගයන් පැවැත්වේ.

**සන්ධ්‍යා මෙහෙය**

පෙබ. 09 සෙනසුරාදා රාත්‍රි 7.00 ට
මීගමුව ලොයොලා විදුහලේ විදුහල්පති
ගරු ට්‍රෙවෝ මාටින් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ

**පෙබ. 10 ඉරිදා - වාර්ෂික මංගල්‍යය**

දිව්‍ය පූජා යාගයන් පෙ.ව. 6.00 ට සහ ප.ව. 5.00 ට
මංගල්‍ය දිව්‍ය පූජා යාගය පෙ.ව. 8.00
අගරදගුරු පදවි සෙත්සරණ අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

මංගල දිව්‍ය පූජාවෙන් පසු මඩු මාතා ප්‍රතිමාව රැගත් පෙරහර වීථි සංචාරය කෙරේ.

මීසම් සේවක පියතුමා සමඟ මීසම් සංඝය


# දෙව්මැඳුරු ආධාරයට සංගීත සන්ධ්‍යාවක්

බඩල්ගම මීසමට අයත් වරාදල ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැඳුරු ගොඩනැගිල්ලට ආධාර පිණිස මහා සංගීත සංදර්ශනයක් 2013 පෙබරවාරි 04 වන දින රාත්‍රි 7.00 ට වරාදල දෙව්මැඳුර අසළ ක්‍රීඩාංගනයේ දී පැවැත්වේ. වරදාල දෙව්මැඳුරේ මීසම් ධර්ම සේවා සභාව විසින් මෙම සංගීත සන්ධ්‍යාව සංවිධානය කරන අතර මීසම් සේවක ගරු ඇන්ටන් රංජිත් පියතුමා මහත් කැපවීමෙන් දෙව්මැඳුර අලුතින් ගොඩනැගීමට ගන්නා උත්සාහයට මෙය විශාල දිරියක් බව එම දහම් සේවා සභාවේ ප්‍රකාශකයකු පැවසීය.

(ටී. සුනිල් ප්‍රනාන්දු)

# දකුණු කොළඹ කලාපීය මඩු වන්දනා ගමන

දකුණු කොළඹ කලාපයට අයත් කොළඹ උතුර, මැද කොළඹ, දකුණු කොළඹ, කෝට්ටේ, මොරටුව සහ කළුතර දිසාවල සියලු මීසම් සැදැහැවතුන් එක්ව මැයි මස 24, 25 සහ 26 දිනයන්හි මරද මඩු සිද්ධස්ථානයට යෑමට කටයුතු සූදානම් කර ඇත.

මෙය කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ අනුශාසකත්වයෙන් යුතුව දිසානායක පියතුමන්, දිසා නියෝජිත පියතුමන්, අගරදගුරු පදවි සහ කලාපීය උපාධ්‍ය පියතුමන්ගේ සංවිධානයෙන් සිදුකැරෙන අතර, අති උතුම් කාදිනල් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සියලුම දේව වන්දනාත්මක මෙහෙයන් සිදු කිරීමට නියමිතය.

මෙම වන්දනා චාරිකාව පිළිබඳ කටයුතු සම්පාදනය කර ගැනීම සඳහා මාර්තු මස 09 සෙනසුරාදා උදේ 10.00 ට බොරැල්ල අගරදගුරු නිවසේ ජුබිලි ශාලාවේදී කලාපයේ එක් මීසමකින් නියෝජිතයන් දෙදෙනකු බැගින් සහභාගි වන කමිටු රැස්වීමක් සූදානම් කර ඇත.

**(දකුණු කොළඹ කලාපීය නාහිමි - අතිගරු ඇන්ටනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමා)**


# 40 වසරක යුගදිවි සැමරුම

**1973. 01. 25 - 2013. 01. 25**


දෙවිඳුන් විසින්
උත්තම
එක් කළ
අතිනත් යුග
දම්පතින් ලෙස තිර
මිනිසාට වෙන් කළ
නොහැකි සේ....
ඔබ දෙපළගේ
එක්වීම
එදා මෙදා තුර
සතළිස් වසක්
ගෙවීගිය නමුදු අද
සිත් තුළ රැඳී ඇති,
සදාතන බන්ධනය,
ගැඹුරුතම තැන
නිදන් වී අපට දෙන
සතුට...
වාසනාවන්තයි අපි...
දෙවිඳුන්ව පසසන්න...
ආසිරි ලබාගෙන
ආයුෂ සතුට සමඟින්



**නිරිපොළ, හංවැල්ල පදිංචි**
**මයිකල් රාජපක්ෂ**
**සහ**
**එළිසබෙත් කාරියවසම්**

ආදර පුත් ගරු පුබුදු රාජපක්ෂ
සහෝදරතුමා සමඟින්
දූ දරු මුණුබුරන් සැම



# සගසුව දිනයි



"ඥානාර්ථ ප්‍රදීපය" ලේඛක කුස්වල රන්ජිත් ලොකුපෝතාගම ඇතුළු දූ දරුවන් සය දෙනකුගේ මව වූ එන්. ඩී. එන්ජලින් ගුණසේකර මහත්මිය පසුගියදා ස්වර්ගස්ථ වූවාය.

කඳාන ග්‍රාමයේ උපත ලද ඇය 1940 දශකයේ දී කඳාන සා. සෙබස්තියන් දෙව්මැඳුරේ පාලකව සිටි ස්වර්ගස්ථ කලාශූරී ගරු මර්සලින් ජයකොඩි පියතුමා පුහුණු කළ දෙව්මැඳුරු ගීතිකා කණ්ඩායමේ සාමාජිකාවක් ද වූවාය. එමෙන්ම එන්ජලින් මහත්මිය ප්‍රකට කතෝලික ලේඛක හා "පිණිබිඳු" මුද්දර සංගමයේ නිර්මාතෘ කඳානේ ස්වර්ගස්ථ ප්‍රැන්සිස්. පී. ගුණසේකර මහතාගේ සොහොයුරියකි. ඇයගේ අවසන් කටයුතු කොටරුපේ කතෝලික සුසාන භූමියේ දී සිදු කෙරිණි.

# දෙව්මැඳුරු සේවියා හොඳම ග්‍රාම නිළධාරි සම්මානයෙන් පිදුම් ලබයි



බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ බස්නාහිර පළාත් සමාජ සත්කාරක ව්‍යාපෘතිය යටතේ 2012 වසරේ එම පළාතේ අවාසි සහගත ප්‍රජාව වෙනුවෙන් අගනා සේවාවක් ඉටු කරන හොඳම රාජ්‍ය සේවකයින් වෙනුවෙන් පිදෙන "සේවාභිමානී සම්මානය" දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 56, බඩල්ගම ග්‍රාම නිලධාරි එම්. ඩී. ජෝශප් මහතා විසින් දිනා ගන්නා ලදි. **(ටී. සුනිල් ප්‍රනාන්දු)**



Institute of Western Music & Speech Srilanka සංවිධානය විසින් පවත්වන ලද ගායන තරගාවලියේ අවසන් වටය පසුගියදා කොළඹ බිෂොප් විද්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි. මේ සඳහා පාසල් ගණනාවක් තරග වැදුනු අතර කණිෂ්ට අංශය, ජ්‍යෙෂ්ඨ අංශය හා විවෘත අංශය ලෙස තරග සංවිධානය කර තිබුණි.

ජ්‍යෙෂ්ඨ අංශයේ දෙවන ස්ථානය හිමි කර ගැනීමට සා. ජෝශප් නිමල මරිය නිකායික කනිටු දෙව්සත්හලේ ගායනා කණ්ඩායම සමත්විය. තරග අවසානයේ දෙව්සත්හල් අදියුරු ගරු මැක්ෂිමස් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා ඇතුළු අනිකුත් පියතුමන් ද පුහුණුකරුවන් ද සමඟ ගායනා කණ්ඩායම ප්‍රදීප කැමරාවට මුහුණ දුන් අයුරු. **(සටහන - ලක්ෂාන් ප්‍රනාන්දු, සේයා - අකිල / නිර්මාල්)**

# වසර 100 ක ජුබිලිය සමරන සාන්ත ජෝශප් විද්‍යාලයීය පුස්තකාලය

කොළඹ 10 සා. ජෝශප් විද්‍යාලයීය පුස්තකාලය ක්‍රි.ව. 1913 දී කියවීම් ශාලාවක් වශයෙන් ජේ. දොන් ඊප්‍රහිම් ජෝශප් මහතා සිහිවීම පිණිස ජේ. දොන් සිප්‍රියානු මහතා විසින් සාදා නිම කර තිබේ. එමෙන්ම කේ. ඩී. මිගෙල් අප්පුහාමි මහතා, ජී. පී. පී. සේනාරත්න මහත්මිය, ඩී. දොන් පෝල් මහත්මිය සහ බී. වී. ප්‍රනාන්දු යන මහත්ම මහත්මීන්ගේ නොමසුරු සහයෝගය හා දායකත්වය අගය කළ යුතුය.

එවකට කියවීම් ශාලාවක් වශයෙන් ඉදි කෙරුණු පුස්තකාල ගොඩනැගිල්ල අද වත්මන් සිසුන් පන්දහසකගේ ද ගුරු භවතුන්ගේ සහ සෙසු සැමගේ දැනුම් කේන්ද්‍රස්ථානයක් බවට පත්ව ඇත.

විදුහලට නායකත්වය දුන් ගරු අදියුරු පියවරුන් සහ විදුහලේ ආදි සිසුන්ගේ ද මග පෙන්වීම හා ආධාර මත අංග සම්පූර්ණ වායු සමනය කළ පුස්තකාලයක් බවට දිවයිනේ පාසල් පුස්තකාල අතුරින් පෙරමුණ ගැනීමට සමත්ව ඇත. විදුහලේ ඉගෙනුම් කටයුතු කරන ප්‍රධාන මාධ්‍යයන් වන සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයන්ට සරිලන ආකාරයෙන් සෑම විෂයක්ම ආවරණය වන පරිදි සිසුන්ගේ හා ගුරු භවතුන්ගේ පරිශීලනය සඳහා විශ්ව කෝෂයක් බඳු පොත්පත් වලින් සමන්විත පුස්තකාලය විදුහලේ අභිමානය රැක ගැනීමට පුළුල් මෙහෙවරක් ඉටු කරයි.

ජුබිලි වසර වෙනුවෙන් පුස්තකාලීය දිනයක් හා ඊට සමගාමීව සම්මන්ත්‍රණ, වැඩමුළු හා සිසු කුසලතා ඔප් නැංවීමට වැඩසටහන් කීපයක් සැලසුම් කර ඇති වත්මන් අදියුරු ගරු සිල්වෙස්ටර් රණසිංහ පියතුමා පරිගනක ගත අන්තර්ජාල පහසුකම් වලින් සපිරි පුස්තකාලයක් බවට පත් කිරීමට සැළසුම් කර ඇත. වත්මන් හා අනාගත ජොසපියානුවන්ගේ දැනුම වර්ධනය කිරීමෙහිලා පොත් පරිත්‍යාග කිරීමෙන් දායක වීමට ඔබ සැමට මෙම ජුබිලි වසර තුළ විවෘත ආරාධනාවක් කරයි.